**වසර 2500 පසු**

**මේ ගෞතම බුද්ධ ශාසනයේ නැවත පිබිදීමයි.**

# සත්‍ය ධර්මය ඇවදි විය

(දෙවන වෙළුම)

**සියලුම හිමිකම් ඇවිරිණි.**

මුදලට විකිණීම සඳහා හෝ ලාභ ලැබීම පිණිස වන සියලුම ආකාරයේ උපුටා ගැනීම්, නැවත පළකිරීම් සපුරා තහනම් ය. මෙම දහම් පොත ධර්ම දානයක් ලෙස බෙදා හැරේ.

## සත්‍ය ධර්මය අවදි විය

බුද්ධොත්පාදෝ ධර්ම දේශනා ශ්‍රවණයට
https://youtube.com/channel/ucwms400m8EsZc9foKtEajg

අන්තර්ජාල ශ්‍රවණයට - website
buddhothpado.com

බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය - 2022 ඔක්තෝබර්

ධර්ම ග්‍රන්ථය පිළිබඳ
විමසීම් Email : ramyapriyanka1968@gmail.com
Tel : 0741 853615 / 0706 134978

පරිගණක මුද්‍රණ සැකසුම : **සක්වා ප්‍රින්ටර්ස්**
නො. 51 ඒ, කුලරත්න පාර, අම්බලන්ගොඩ.
දුරකථන අංකය : 091 2258756

මුද්‍රණය : **K.S.U. ග්‍රැෆික් (පුද්) සමාගම**
අංක 510, රාජගිරිය පාර, රාජගිරිය.
දුරකථන අංකය : 011 2884701

# පෙරවදන

මෙය ඇසෙන ඔබ මහා භාග්‍යවන්තයි. ඔබ කොහේද යන්නේ, මුලාව රැවටීම හරි භයානකයි. සත්‍ය කුමක්ද? ඔබ සංසාර චක්‍රයක අතරමං වෙලා. විටෙක ඔබ සතුටින්, විටෙක ඔබ දුකෙන්, සැපේ දුකේ දෝලනය වන මේ ජීවිතය හරි භයානකයි. ඔබ සත්‍ය දන්නේ නෑ.

ඒ සත්‍ය ඔබ අවබෝධ කළ යුතුයි. ඔබ සංසාර දුකින් මිදෙන කතාවයි මේ.

මෙම දේශන මාලාව මඟින් ඔබට සත්‍ය ධර්මය අවබෝධය සඳහා යම්කිසි උපකාරයක් ලැබෙනවා. සියලු දුකින් මිදෙන තැන හමුවන ඒ 'සදාතනික සුවය' මෙම දේශන මාලාව මගින් අත්දකින්නට ඔබට ද හැකියාව ලැබේ. බාහිර ඇත්ත කරගෙන සිටින තාක් ඔබ ඉන්නේ මිථ්‍යාදෘෂ්ටියේමයි. ඒතාක් ඔබට දුක උරුමයි. සිතද මායාවක් වන තැන,

සිතේ මායාවෙන් මිදුනු තැන,
බාහිර ඇත්තක් නොවන තැන
සිතද සත්‍යයක් නොවන තැන
ඒ සිතෙන් මිදෙන තැන
ඒ බාහිර ඇත්තක් නොවන තැන
'අජ්ජත්ත බහිද්ධා' කියන තැන
අන්ත දෙකම මිදුන තැන, එනම්,

ධර්මය තුළ සඳහන් වන නාම, රූප අන්ත 2න් මිදීමයි නිවන් මග වන්නේ. මෙලොව උපදින සියලු සත්ත්වයෝ නිවනින්මයි සැනසීම ලබන්නේ. ධර්මය නම් ධර්මතාවයයි. ඒ පටිච්චසමුප්පාද ධර්මයයි. එනම්, ඉදප්පච්චතාවයයි. එනම් දෙයක් නැති බවයි. දෙයක් නැති බව බුද්ධ ස්භාවයයි. දෙයක් නැති තැන චේතෝවිමුක්තියයි. එනම්, අනිමිත්ත, ශූන්‍යත, අප්‍රනීහිත චේතෝවිමුක්තියයි. ඒ බුද්ධ ස්වභාවයයි. මේ දහම අවබෝධ වේ නම් ඔබ අප සියලු දෙනාම ඒ බුද්ධ ස්වභාවටයි අවදි වෙන්නේ. ඒ බුද්ධ යනු ශූන්‍යතාවයි.

"නිස්සත්වෝ නිස්ජී වෝ ශූන්‍යයෝ"

පහන නිවීගිය පසු ගිය තැනක් කොහින්ද? ඒ නිවීමමයි නිවන. ඒ කෙලෙස් ගින්නේ නිවීයාමයි. ඒ සසර ඕඝයේ නිමාවයි. ඒ විඤ්ඤාණ නිරෝධයට ගිය තැන සියලු දුකෙන් මිදීමයි.

විඤ්ඤාණං අනිදස්සනං - අනන්තං සබ්බතෝ පහං
එත්ථ ආපෝච පඨවි ච - තේජෝ වායෝ න ගාධති
එත්ථ දීඝඤ්ච රස්සඤ්ච - අණුං ථූලං සුභාසුභං
එත්ථ නාමඤ්ච රූපංච - අසේසං උපරුජ්ජති
විඤ්ඤාස්ස නිරෝධෙන - එත්තෙ තං උපරුජ්ජන්ති

සිතෙන් මිදෙන මඟ
නිවන් දකින මඟ
දුකින් මිදෙන මඟ
එයයි නිස්සරණ මඟ

නිවැරදි නිවන් මඟ ඔබටත් හමුවේවි. ධර්මය සොයන්නාට බුදුන් හමු වේ. බුද්ධ යනු සොබාදහමයි. ප්‍රායෝගික පුහුණු විය යුතු ආකාරය හඳුනාගෙන අවබෝධ කළ යුතු ධර්මයකි.

**බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ**

# හැඳින්වීම

මේ ගෞතම බුද්ධ ශාසනය තුළ අපි හැමදෙනාටම අවශ්‍ය වන්නේ, නිවීමක්, සැනසීමක්, දුකින් මිදීමත්, නිරන්තර පවත්නා රාග, ද්වේශ, මෝහ නිවා ගැනීමයි. ''නිවන'' කියන්නේ කිසාගෝතමී, පටාචාරා, අම්බපාලි වැනි බොහෝ පිරිස් බුදුන් වහන්සේ අභියස සසර දුක්ගිනි නිවාගෙන සදාකාලික සැනසීම ලැබුවා.

අද බෞද්ධ සමාජයට මේ නිවීම, සැනසීම අහිමි වෙලා. බොහෝ පිරිස් නොයෙකුත් රාමුවලට සිරවී ග්‍රන්ථ ධූරයට පමණක් සීමාවෙන් සිටින්නේ. ඒ තුළින් සත්‍ය දැකීම අපහසුයි. ''විදර්ශනා ධූරය'' අද සමාජයෙන් ඈත්වී ඇති මෙවන් යුගයක, නැවතත් ඒ ගිලිහී ගිය ''බුද්ධ දර්ශනය'' විදර්ශනාධූරය තුළින්ම ඉස්මතු වෙනවා. ඒ අතිගාම්භීර, නිර්මල පරම සත්‍ය දැන් අපට අසන්නට ලැබෙනවා. මේ නිවැරදි බුද්ධ දර්ශනය, පෙර නොඇසූ විරූ දහම ධම්ම චක්ඛුෂය'' අපි අවබෝධ කරගතයුතු වෙනවා. මේ සත්‍ය දර්ශනය බාහිරින් හමුවන දෙයක් නොවේ. බාහිර ඇත්ත වූ තැන පවතින්නේ ආත්මීය ස්වභාවයකි.

මේ අනාත්ම ධර්මය උතුම් බුද්ධ දර්ශනය ''බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ මාලාව'' තුළින් ඔබට කියවන්න ලැබෙනවා. එය හොඳින් කියවන්න, ධාරණය කරගන්න. ඔබට සත්‍ය අවබෝධයට මෙය උපකාරී වේවි. මේ අපගන්නා උත්සාහයේ එක් අවස්ථාවක් පමණි.

**අප කළ්‍යාණ මිත්‍ර මෙහෙණින් වහන්සේ**

**"සබ්බ දානං ධම්ම දානං ජිනාති"**

මේ උතුම් සත්කාරය සඳහා අර්ථයෙන්, ධර්මයෙන්
සියළුම ආකාරයෙන් උදව්උපකාර කළා වූ
සියළුම දනන් හට, මෙම ධර්ම දානය තුළින්
ජනිත වන්නා වූ පුණ්‍ය ශක්තිය
මේ ගෞතම බුද්ධ ශාසනයේ දීම
ඒ උතුම් චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්‍මය
අවබෝධ කරගෙන සංසාර දුකින් මිදී
නිවනින්ම සැනසීම ලබන්නට
හේතු වේවා !!!

# පිදුම



මරුන්, බඹුන්, මිනිසුන්,
දෙවියන් සිටින
මිථ්‍යා දෘෂ්ටික භූමියේ
අවිද්‍යා මෝහාන්ධකාරයෙන්
වෙලී සිටින, අසරණ
ලෝක සත්ත්වයා හට
සත්‍ය ධර්මය අවදි වී
ඇති මොහොතක,
එය ප්‍රත්‍යක්ෂ කරගැනීමට
"ධම්ම චක්ඛුෂය" අවදිවී
සදහම් ආලෝකයෙන්,
නිවී සැනසෙන්නට
මෙම දහම් පඬුර
උපනිශ්‍රය වේවා !
"සෝ ධම්මං පස්සති - සෝ මං පස්සති"
('ධර්මය දකින්නා - බුදුන් දකී')

- රම්‍යා ප්‍රියංකා -

# පටුන


| | | පිටු අංක |
|---|---|---|
| 01. | 1 වන දේශනය - මොහොතට අවදිය<br>(ඉපදීම, බුදුවීම, පිරිනිවීම එකම මොහොතක මහාමංගල්‍යය) | 09 - 19 |
| 02. | 2 වන දේශනය - මොහොතට අවදිය<br>(ආශ්චර්යයි, අත්භූතයි, ස්වාමීනී !) | 20 - 25 |
| 03. | 3 වන දේශනය - මොහොතට අවදිය<br>(බුද්ධ දර්ශනය නොමැතිව, මොහොතට අවදිය සිදු නොවේ.) | 26 - 35 |
| 04. | 4 වන දේශනය - මොහොතට අවදිය<br>(සත්‍යය ධර්මය අවදිවිය) | 36 - 46 |
| 05. | 5 වන දේශනය - මොහොතට අවදිය<br>(වැසුණු නිවන් මඟ විවර විය) | 47 - 51 |
| 06. | 6 වන දේශනය - මොහොතට අවදිය<br>(බුද්ධ දර්ශනය ගිලිහුණු බෞද්ධ සමාජය අසරණයි) | 52 - 62 |
| 07. | 7 වන දේශනය - මොහොතට අවදිය<br>(මොහොතට අවදිය ප්‍රායෝගිකව, යා යුතු මාවත ලිපිනය දැනගනිමු.) | 63 - 69 |

# 1 වන දේශනය - මොහොතට අවදිය

**(ඉපදීම, බුදුවීම, පිරිනිවීම එකම මොහොතක මහා මංගලයය)**

**ආර්යයන් වහන්ස :-** අපි කියන කාරණා සම්මුතියට අදාළ නෑ. සම්මුතිය තුළ, සංස්කෘතිය තුළ අපි කරණ කියන දේවල්, ආමිස පූජා කටයුතු ගොඩක් දුරට සමාජයේ පැවැත්මට හොඳියි. **නමුත් සත්‍යාවබෝධය කරන එක එහෙම දෙයක් නොවෙයි.** අප බුදු සමයට ගියොත් බුදුන් වහන්සේ දේශනා කළේ, "**පෙර නොඇසූ විරූ දහමක්**" එහෙමනම් උපාසකම්මා මේ පෙර නොඇසූ විරූ දහම කියන එක සම්මුතිය තුළ තියෙන දෙයක් නොවෙයි. ඒක අදටත් එහෙමයි. සම්මතය තුළ හැමෝම හරියි කියල හිතන දේ ඇත්තටම **සත්‍යයක් නොවෙයි. බොරුවක්.** ඔන්න ඔතන තමයි අපි **ගලපන්න ඕන තැන අපි සත්‍ය අහන්න සූදානම් ද** කියන එක. අපි සත්‍ය අසන්න සූදානම් නම් පස්වග තවුසන්නට දේශනා කළා වගේ පෙර නොඇසූ විරූ දහමක් තමයි අපට අහන්න වෙන්නේ.

ඒකට හේතුව අපි හැමදාම මේ **මූලධාතු ආයතනවලට කොටුවෙලා,** මේ ආයතන **පෙන්නන දේවල් හරියි කියලා** හිතාගෙන ඉන්නවා. අපි හිතනවා අපට **ඇසට පෙනෙන දේ ඇත්ත කියලා, කනට ඇහෙන දේ ඇත්ත කියලා. අපි මේ ඇස, කන, නාසය, දිව, කය, මන** කියන ආයතනවලට කොටුවෙලා ඉන්නවා. ඒ ආයතනවලට පේන ඇහෙන දේවල් ඇත්ත කරගෙනයි අපි ඉන්නේ. **ඒක ඇත්තක් නොවන බව තමයි අපට මේ සත්‍යබෝධ කරනකොට** වැටහෙන්නේ. **මේ සත්‍යය නම් අපි අවිද්‍යාව කියන්නේ නොදන්නකම, නොදන්නකම තුළ තමයි අපි මේ සසර ගමනට කොටුවෙලා ඉන්නේ.** ඒ අවිද්‍යා ඝනඅන්ධකාරයේ කොහොමත් දුක උරුමයි. එතනින් මිදුනෙ නැත්නම් අපට සුගතියක් නම් නෑ. අවිද්‍යා භූමියේ **සුගතිය කියන්නේ තවත් එක් දුගතියකටම තමයි.** අපි හොඳයි කියල හිතෙනවා එදිනෙදා සල්ලි ටිකක් හම්බ වුනොත්, කන්න හොඳ කෑමක් හම්බ වුනොත්, හොඳ ඇඳුමක් හම්බවුනොත් හොඳයි කියලා හිතනවා අපි "**ඒ අවිද්‍යා භූමිය.**" මේ ඇඳුම ටික කාලයක් යනකොට දිරනවා. ඒ ඇඳුම හොඳ වුණාට ඊට වඩා හොඳ ඇඳුමක් අපි හෙට හොයනවා. ඒක හැමදාම අළුත් වෙන්නේ නෑ. ටික දවසක් අඳිනකොට ඒක කිලුටු වෙනවා. එතකොට අපි ඊට වැඩිය වෙනින් එකක් හොයනවා. එතකොට මේ හැමදාම එක එක ඒවා අපට හොය හොයා යන්න වෙනවා. ඒකයි දුක. අපි දැන් කෑමක් රසයි කියලා කෑවට අපිට හෙට ඒ කෑම කන්න බෑ. අපි අළුත් කෑමක් හොයනවා. මෙන්න මේ වගේ "**අවිද්‍යා භූමියේ අපි හොඳයි කියන කිසිදෙයක්** හොඳ වෙන්නේ නැහැ.

**උපාසිකාව :-** එහෙමයි. මම නුවර පළාතේ ආර්යයන් වහන්ස. වයස 74 ක්. මාස 03 ක් තිස්සේ දවසකට 3ක් 4 ක් විතර දේශනා 100කට වඩා ඇහුවා.

**ආර්යයන් වහන්ස :-** අපි හොඳයි කියන කිසිදෙයක් මේ ලෝකේ නැහැ. ඒක දුකම තමයි. අපි මේ **සැප කිය කියා කියන්නේ දුකටම තමයි. දුකමයි හටගන්නේ, දුකමයි පවතින්නේ.** දැන් ඔබතුමියගේ වයස 74 ක් කිව්වා. මේ කියන දහම ඔබතුමිය අවුරුදු 70 වකට අහපු එකක් නොවෙයි. ඔබතුමිය දේශනා 100 කට වඩා ඇහුවා කිව්වා. ඔබතුමිය ඇහුවා. **"මේ මොහොතේ නිවන් දකින්න පුළුවන් ද කියා." "ඇත්ත නම් ඒකයි. මේ මොහොත්ම නිවන් දකිනවා. මේ මොහොතේ මේ සිතම තමයි. මේ සිත පමණයි. ඒ සිත හටගෙන නිරුද්ධ වෙනවා. පවතින සිතක් නැහැ. ආයෙත් අලුත් සිතක් හට ගන්නවා.** ඔන්න ඔතන තමයි, අපේ මේ හිතේ තමයි දුක තියෙන්නේ. අපේ හිත තමයි අපිට මේ දුක ගෙනත් දෙන්නේ. අපි සිතින් දුක් විඳින්නේ. එහෙමනම් අපේ මේ සිත අවබෝධකරණ එකයි. **සත්‍යාවබෝධය කරනවා** කියන්නේ. **මේ ලෝකය මැවෙන්නේ සිතේ" "සලායතන ලෝකෝ ලෝකෝ" "චිත්තේන නීයතී ලෝකෝ" "සිතතුළ මැවෙන ලෝකය"** ලස්සන කැත තියෙන්නේ බාහිර බඩුමුට්ටුවල නොවෙයි. **අපේ හිතේ.**

අපේ මේ හිත හැම මොහොතෙම හටගෙන නිරුද්ධ වෙනවා. **"ක්‍ෂණයක් ක්‍ෂණයක් පාසා හටගෙන නිරුද්ධ වෙනවා." "ඉපිද නිරුද්ධ වෙනවා" "ඉපදෙනවා - මැරෙනවා" "ක්‍ෂණයක් ක්‍ෂණයක් පාසාම ඉපදෙනවා - මැරෙනවා", "එක් ක්‍ෂණික සිතක උදය - වැය දකින්නාට සම්මුතිය තුළ මරණය හමුනොවේ." සම්මුතිය මරණය බොරුවක් වෙනවා. "මේ මොහොතේ ඉපදෙනවා - මැරෙනවා" "ඉහලට ගත් හුස්ම පහලට හෙලන්නට කලින් මරණානුස්සතිය වඩන්න ඕන.** අපි මරණානුස්සතිය වඩනව කියන්නේ **"ක්‍ෂණික මරණය දකිනවා".** බුදුන් වහන්සේ දේශනා කරනවා, **"ඉහළට ගත් හුස්ම පහළට හෙලන්න කලින් යමෙක් මරණය සිහිකරයි ද? එයයි උතුම් කියලා.** මරණානුස්සතිය වඩනවා කියන්නේ **"එක් ක්‍ෂණයක මරණය දකිනවා" "එයයි ක්‍ෂණ සම්පත්තිය"** මේ ක්‍ෂණය අවබෝධ කරන එකයි.

**උපාසිකාව :-** එහෙමයි

**ආර්යයන් වහන්ස : "දුර්ලභං ක්‍ෂණසම්පත්තිං" "දුර්ලභං සද්ධර්ම ශ්‍රවණං", දුර්ලභං මනුස්සත්තං" "දුර්ලභං පතිරූපදේශ වාසය"** මේ ක්‍ෂණයයි අප අවබෝධ කරගන්න **බැරුව ඉන්නේ.** එහෙනම් මේ එක සිතක් අවබෝධ

කළොත්, **"අපි නිවන් දකිනවා"** සිත කියන්නේ අරමුණ. හැම මොහොතේම අරමුණක් එනවා. **"ඇතිවෙනවා - නැතිවෙනවා"** එහෙනම් මේ අඹ ගහේ කොළ 5000 ක් තිබුණට අපි **එක කොලේක නාරටි විනයාසය බැලුවොත් හරියට අඹ ගහේ කොළ 5000 ම දැක්කා වෙනවා.** ඒ කියන්නේ එක සිතක් හරියට දැක්කොත්. අපිට උපදින **"සියළුම සිත්"** දැක්කා වෙනවා. එහෙනම් අපි මේ එක සිතක් ''හරියට අවබෝධ කරගන්න එකයි'' සත්‍යබෝධය කරනවා කියන්නේ ''නිවන් දකිනවා කියන්නේ'' එහෙනම් ඒ සිත හැදෙන හැටියි අපි දකින්න ඕන. දැන් ඔබතුමිය දන්නවා දේශනා අහපු විදියට මේ මොහොත මේ ක්ෂණය විතරයි කියලා. එහෙනම් අපි දැන් ඔබතුමියට මේ මොහොතේ කථා කරත් මේ මොහොත විතරයි. හෙට කථා කරත් ඒ මොහොත විතරයි තියෙන්නේ. තම අවුරුදු 5 කින් කථා කරත් ඒ මොහොත විතරයි ගතකරන්නේ. අපි අතීතය ගැන හිතුවත් මේ මොහොතේ මේ සිත විතරයි. අනාගතය ගැන හිතුවත් මේ මොහොතේ ඒක වර්ථමාන සිතක් වෙනවා. ඇයි දැන්නේ අපට මතක් වෙන්නේ. හැබැයි මේ මොහොතේ දකින සිතක් ඇත්ත නොවෙයි.

**"අතීතං නාපගමෙය්‍යය - අප්පටිකංඛෙ අනාගතා**
**පච්චුප්පන්නාසයේ ධම්මා - තත්‍ර තත්‍ර විපස්සතී"**

අතීත සිතුවිලි දැන් හටගෙන නිරුද්ධ වෙලා ඉවරයි. අනාගත සිතුවිලි තාම ඇතිවෙලා නෑ. හැබැයි මේ මොහොතේ හටගන්න සිතක් ඇත්තක් නොවෙයි. **පච්චුප්පන්න සිත සත්‍යයක් නොවෙයි.**

ඇයි ඒ මොහොතේ හටගන්න සිතෙන් පේන්නේ පොත කියලා. **බාහිර.** නමුත් බාහිර තියෙන පොතක් නොවෙයි. **අපේ හිතේ තමයි තියෙන්නේ මේ පොත කියන එක, ශබ්ද රූප හැඩතලයකට ගැට ගැහිලා.** අර මොන්ටිසෝරි යනකොට රූපෙට ශබ්ද දදා කරන්නේ. **අපි අර කියන්නේ රතු පාට, කහ පාට, නිල් පාට. අපි මේ ශබ්ද වර්ණ එකතු කර කර තමයි දිගටම ඇවිල්ලා තියෙන්නේ.** දන්නව නේද? **දැන් ඒකට කියනවා සිත කියලා.** මේ පැත්තෙන් ශබ්දයක් දැම්මොත්දු '**ගිරවා**' **කියලා.** එතකොට ගිරවෙක්ගේ රූපයක් මැවෙනවා. ''කපුටා'' කියලා ශබ්දයක් දැම්මොත් කපුටගේ රූපයක් මැවෙනවා. **හැබැයි ඒ ශබ්දවලට රූප තියෙන නිසා.** ඔතන දැන් හිටියොත් චීන ජාතිකයෙක් කපුටා කියන ශබ්දයට රූපයක් මැවෙන්නේ නැහැ. **ඒ ශබ්දවලට එයාට රූප නෑ, එයා ශබ්ද රූප එකතු කරලා නෑ. සිත කියන්නේ මේ ශබ්ද වර්ණ එකතුවෙන එකබව හොඳටම පැහැදිලි වෙනවා.** ඒක හොඳටම පැහැදිලියි. ඒක තමයි ඇත්ත.

දැන් බලන්න මේ මොහොත විතරයිනේ තියෙන්නේ. අතීතය ගැන හිත හිතා හිටියත් මේ මොහොතේ, මේ මොහොත විතරක් නම් **හැම දෙයක්ම සිද්ධ වෙන්නේ මේ මොහොතේ විතරයි නේද?** මේ මොහොතේ මේ සිතේ සත්‍ය දැක්කොත් **එළියේ පොත කියලා දෙයක් නෑ. කපුටා කියලා දෙයක් නෑ. මේ අපේ හිත කියලා දැක්කොත් එළියෙන් මිදෙනවා නේද?** එතකොට අපේ සිතෙත් කපුටො කියලා අල්ල ගන්න පුළුවන් **භෞතික දේවල් නෑනේ. සිතෙනුත් මිදෙනවා නේද? බාහිරත් එහෙම දෙයක් නෑ නේද? එතකොට ශූන්‍යයයි නේද? අනිමිත්තයි නේද, අනිදස්සනයි නේද? අප්පටිච්චිතයි. ඒ සිත එතනම නිරුද්ධ වෙනවා නේද? අනිමිත්තයි, ශූන්‍යයි, අප්ප්‍රනීහිතයි.** එතන ආත්ම කතාවක් හම්බ වෙන්නේ නෑ නේද? පොත තිබ්බොත් දෙයක් තිබුණොත් මාත් ඉන්නවා නේද?

**පොත නැත්නම් මමත් නෑ. මට මම නැතිවෙන හැටි එතකොට මේ මොහොතේ කිසිවක් නැති ශූන්‍යය ස්වභාවයක් එනවා නේද? එයයි 'චිත්ත විමුක්තිය.' මේ මොහොතේ බුද්ධ ස්වභාවය නේද? උපදින්නේ. ඒ බුද්ධ ස්වභාවයේ බුදුන් උපදින්නේ මේ මොහොතේ, ඒ බුදුන් පිරිනිවන්පාන්නේ උපදින්නේ මේ මොහොතේ නේද? සත්ව පුද්ගල ආත්මය නැතිවෙන්නේ. ඒ කියන්නේ අපි අල්ලගත් දේවල් අතහැරිලා පිරිනිවන්පාන්නේ මේ මොහොතේ නේද? උපදින්නේ බුදු වෙන්නේ, පිරිනිවන් පාන්නේ මේ මොහොතේ නේද? එහෙනම් තෙමගුල තියෙන්නේ මේ මොහොතේ නේද?** එහෙනම් අපට හැමදාම වෙසක් නේද? හැම මොහොතේම මේ සත්‍ය අවබෝධ වන කෙනාට මේ හැම මොහොතේම මංගල්‍යයක් නේද? මේක නේද? සත්‍ය අවබෝධ වීමෙන් මේ ලෝකේ තියෙන මහා මංගල්‍යය, මේක අවබෝධවීම නේද? මහා මංගල්‍යය කියන්නේ මේ සිතේ සත්‍ය දැකීම නේද? භෞතිකව ඉපදීම, බුදුවීම, පිරිනිවන් පෑම මේ ධර්මතාවය නේද? සත්ව පුද්ගල ආත්මයක් කියලා ගන්නේ. සම්මුතිය තුළ දවසක් දාගෙන වෙසක් සමරන්න පුළුවන්. ධර්මය අවබෝධනූන අයටත් මේ විදියට දිනයක් දාලා වෙසක් සමරන්න පුළුවන් නේද? **මේ සත්‍ය අවබෝධ වූ මොහොතේමයි තෙමඟුල ඉපදීම, බුදුවීම, පිරිනිවන් පෑම.**

ඒ සත්‍ය අවබෝධ වන මොහොතයි මේ විශ්වයේ මහා මංගල්‍යය. මේ ලෝක ධාතුව තුළ මහා මංගල්‍යය. තෙමඟුල මේ සත්‍යාඅවබෝධවන මොහොතයි, බුද්ධ ස්වභාවයට අවධිවන මොහොතයි, සියලු කෙලෙස් **නැතිවෙන්නේ** මේ අවබෝධය තුළයි. අන්න **නියත සම්බෝධි පරායනයි, සුගති පරායනයි.** දුගතියකට වැටෙන්නේ නෑ. හැබැයි අපි කොච්චර දන් දුන්නත්, පිං දහම්කරත් දුගතියකට වැටෙනවාමයි. ඒක **බුද්ධ දේශනය** අනුව සිද්ධ

වෙන්නේ නෑ. ඒ අවිද්‍යා භූමියේ **සම්මා දිට්ඨියක් නෑ. මිත්‍යා දෘෂ්ටියයි** තියෙන්නේ. බුදුන් වහන්සේ දේශනා කරනවා. මහා දිට්ඨි සංයුක්තිය බැලුවොත් **මිත්‍යා ආජීවයි, සම්මා ආජීවයි** දෙපැත්තකට බෙදලා. පෘතග්ජන භූමිය මිත්‍යා ආජීවයයි. **සම්මා ආජීවය ආර්යය භූමියයි.** ආර්යය භූමිය කියන්නේ මේ සත්‍ය අවබෝධ වන තැනයි. අන්න **සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා ආජීව, සම්මා කම්මන්ත, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි, ආර්ය්‍ය අෂ්ඨාංගික මාර්ගයයි.**

ආර්යය අෂ්ඨාංගික මාර්ගය හමුවන්නේ මේ සත්‍යාවබෝධය තුළයි. බාහිර ලෝකය ඇත්ත කරගත් තැන, සතා සිව්පාවා, සියලු ආගම් තියෙන්නේ මිත්‍යා දෘෂ්ඨික භූමිය තුළයි, සම්මා දිට්ඨියක් නෑ. **"මේ සත්‍ය යමෙකුට ඇසෙනතාක්කල්, අවබෝධවනතෙක් සසර ඕගයේ නිමාවක් නෑ. මැරී මැරී උපදින සසර ඕගයක කැරකෙනවා."** ඒකට විශාල පර්යායක් තියෙනවා, පැහැදිලි කරනවා කොහොමද? එහෙම වෙන්නේ කියලා.

අම්මාට දැනට මේ ටික ප්‍රමාණවත්, අම්මා බලාපොරොත්තු වුනේ අද වගේ වෙසක් දවසක සිල් ගත්තේ නෑ ආර්ය්‍යයන් වහන්ස මට පොඩ්ඩක් බණ පදයක් කියන්න අද දවසේ විශේෂය ගැන කියලනේ. එහෙමනේ ඉඟි කරේ. මෙන්න මේ තමයි සැබෑ තෙමගුල. දැන් සිත ඇතුලේ මහා ප්‍රසන්න හැඟීමක් ඇති කර ගන්න ඕන. මේ මහා බරපතල කටයුත්තක් නොවෙයි. හරිම සරලයි. වැඩිය බර ඔලුවට ගන්න එපා. **බොහොම සැහැල්ලුවෙන් දකින්න මේ මොහොත විතරක් කියලා. සිහිය තබා ගන්න. සති සම්පජනනය. ඒක නිතර නිතර මෙනෙහි වෙන්න දෙන්න. නිතර නිතර මෙනෙහි කරන්න.**

**උපාසිකාව :-** විඤ්ඤාණ මායාව ඒක අපි නිතර නිතර මෙනෙහි කරන්න ඕනද? ආර්යයන් වහන්ස

**ආර්යයන් වහන්ස :-** අපිට ඇත්තටම ඇත්ත සාමාන්‍යයෙන් අපිට මෙනෙහි වෙනවා නේද? දැන් අපිට මේ සිත බොරුවක් කියලා දැනෙනවා නේද? එතකොට **ඒකට තමයි මෙනෙහි වෙනවා කියන්නේ.** ලොකු බරක් අරගෙන හිතට වදදීලා උපාදාන කරගෙන දුක් විඳින එකක් නොවෙයි. **ධර්ම මාර්ගය කියන එක හරිම සුන්දර කතාවක්.** හැබැයි ඒක අසුන්දර කර ගන්නේ අපේ අය නිවන් දකින්න තණ්හාවක් ඇතිකර ගත්තාම අසුන්දර වෙනවා. දන්නේම නැතුව **ඒ විඤ්ඤාණ මායාවේ තවත් එක් නීවරණයක්** වෙලා. නිවන බලනකොට නිවනත් එහෙම වෙනවා. සර්පයා කොතනින් ඇල්ලුවත් දෂ්ඨ

කරනවා. සර්පයා වලිගයෙන් අල්ලලා හරියන්නේ නෑ. **සිහියෙන් බුද්ධියෙන් මේ දේශනා අහන්න ඕනේ කියන්නේ ඒ නිසාමයි.** ඇත්තටම මෙතෙන හරි සරල කථාවක්. අපි දකින්න ඕන සරලවයි. අපි මේක ඕනවට වැඩිය වදයක් කරගෙන හරියන්නේ නෑ. අපි මේක සරල විදියට ගන්න, බරක් කරගෙන හරියන්නේ නෑ. **සමහර වෙලාවට හිත දකින එක මගහැරෙනවා. හිත දිහාම බලාගෙන ඉන්නවායි කියන එකක් නොවෙයි මේ.**

අපි පොඩ්ඩක් සිහිය එළඹගන්නවා. අපි ඉතිං බාහිරට අනුසෝතයට බැහැලා අවුරුදු 70 ක් විතර යනකොට නිතරම බාහිරට යනවනේ කොහොමත්. **හැබැයි අපි ධර්මය ශ්‍රවණය කරණකොට ඇත්ත නිතරම හැගෙනවා. මෙහෙම දෙයක් නැති බව. අපිට නිතරම ඇත්ත ඇහෙනකොට හැම තිස්සේම හිත පිරිසිඳු වෙනවා. අවිද්‍යාව ටික ටික ප්‍රහීන වෙනවා. එතකොට අපි මේ බාහිර දකිනවා කියන එක වැඩි වෙන්න ගන්නවා. හිතට එන අරමුණ දකිනවා කියන එක බාහිරින් එන අරමුණ බලනවා කියන එක ඔක්කොම ටික වැදගත් වෙනවා. අර අවිද්‍යාව අර දෘෂ්ඨිවල ඉන්න එක නැතිවෙලා, කුඩුවෙලා ගිහිල්ලා හිත දකිනවා කියන්නේ ඇත්ත දකිනවා.** ඇත්ත නිතරම, අර සුදුරෙදි කඩ නිතරම පිරිසිදු වෙන්න ඕන. අර සුදුරෙදි කඩ කිලුටු වෙලානේ තියෙන්නේ. යටගිය දවස අපේ හිතෙත් තිබුණා සුදු රෙදි කඩක් එතකොට ප්‍රභාෂ්වර හිත තිබුණා. අපි දැන් කෙලෙස් වලින් වැහිලනේ තියෙන්නේ. දැන් ඒ කෙලෙස් ටික සිතේ ඇත්ත දකින කොට නැතිවෙනවා. ඒවා හැලෙන්න ගන්නවා, වතුරට හේදිලා යන සායම වගේ දියවෙලා යනවා. ටික ටික හෙමින් හෙමින් දියවෙලා යනවා. එතකොට තමයි **ක්ෂය ධම්ම - වය ධම්ම** වෙන්නේ. ක්ෂය වෙනවා කෙලෙස් ටික ටික. වැඩිය කලබල වෙන්න ඕන නෑ. ඒක නිරායාසයෙන්ම ටිකෙන් ටික සිද්ධ වෙන්න ගන්නවා. නිවන් මග හමුවෙලා තියෙන්නේ අතගාවම. **එක තත්පරයක් දැන් වටිනවා නේද?**

**උපාසිකාව :-** එහෙමයි ආර්යයන් වහන්ස. මට මේ අවසාන මොහොතේ චුති සිත ගැන තමයි බය හිතෙන්නේ.

**ආර්යයන් වහන්ස :-** ඒව ගැන එහෙම හිතන්න එපා. **ඒක යන දේවාලයක යන්න අරින්න.** යන දේවාලයක ගියා කියලා හිත හදාගන්න. ඇයි ද එහෙම කිව්වේ කියලා දන්නවාද? එතකොට ඒකත් **උපාදාන වෙලා** අපේ හිත ඒකෙනුත් දූෂණය වෙනවා. ඒ ගමන අපට **සැකේකුත්** එනවා. අපට **බයකුත්** හිතෙනවා. හිතනව නරකතැන් වලට යනවා කියලා. එතකොට ඔය **මුකුත් හිතන්නැති වුනොත් සුගති පරායන වෙනවා. ඔය සිතන හැම මොහොතෙම අපේ සංඥා**

**ඝන වෙනවා. ඝනත්වය වැඩි වෙන්න වැඩි වෙන්න දුගතියට යනවා. ඒක නිසා ඔය තණ්හාවනේ හිතන්නේ ඔබතුමිය නොවෙයි. ඔබතුමියගේ අභ්‍යන්තරයේ තියෙනවා ආත්ම සංඥාවක් ඒක තණ්හාවෙන් තමයි තියෙන්නේ.** මම ඒක නිසා හොඳ තැනක යන්න ඕන කියලා. හැබැයි මෙතන මමෙක් නෑ කියලා ධර්මය හොඳින් පිරිසිදු කර ගන්න. ඔය විකාර ඔක්කොම පැත්තකට කර දාලා. එහෙම කියන්නේ මොකද දන්නනවාද? **මේ ධර්මය අහනකොට ඔය එකක්වත් හිතන්න එපා කියලා අපි කියනවා. ඒකට හේතුව ඕව නොහිතන තරමට සුගතියට යනවා.** මේ සුගතිය කියන්නේ කවුරුත් එහෙම පුද්ගල කතාවක් නොවෙයි. අපේ මේ ගින්නක් තියෙනවා රාග, ද්වේශ, මෝහ. ඒ ගින්නේ ප්‍රමාණයටයි. සුගතියද? දුගතියද? කියලා සිද්ධ වෙන්නේ. දැන් ඔය සිතුවිල්ල තුලත් රාග, ද්වේශ, මෝහ වැඩිවෙනවා. **එතකොට ඒ සිතුවිලි වලින්ම අපි දුගතියට අරගෙන යනවා. ඒක නිසා අපට බලෙන් යන්න බැහැ නේ කොහේවත්. අපිට කරන්න පුළුවන් එකම දේ තමයි මේ සිත නිවාගන්න එක. හැම මොහොතකම සිත නිවාගන්න.** අංගුලිමාල දහස් ගණනක් මැරුවා කියලා දුගතියකට වැටෙන්නේ නෑ. අන්න ඒ වගේ. මේ ධර්මයට සිත තබනකොටම ඔබ භික්ෂුවක් විදියට මිනීමරලා තියෙනවාද? අංගුලිමාල සූත්‍රය දේශනා කරන්නේ අර විලිරුදාවෙන් ඉන්න කාන්තාවට වේදනාව නැති වෙන්නනේ. බුදුන් වහන්සේ කියනවනේ අංගුලිමාලට කිව්වනේ විලිරුදාවෙන් ඉන්න කාන්තාවට වේදනාව නැතිවෙන්න කියලා අධිෂ්ඨාන කරන්න කියලා. අංගුලිමාල කියනවනේ මම මිනීමරලා තියෙනවනේ කොහොමද ස්වාමීනී, ඒක කරන්නේ කියලා. බුදුන් වහන්සේ අහනවානේ ඔබ භික්ෂුවන් විදියට මිනීමරලා තියෙනවද ? කියලා. නැත ස්වාමීනී කියලා අංගුලිමාල කියනවනේ. බුදුන් වහන්සේ කියනවා භික්ෂුවක් විදියට කිසි කෙනෙක් මරපු නැති බවට අධිෂ්ඨාන කොට කාන්තාවගේ වේදනාව නැති කරන්න කියලා. **ඒ සිත විතරයි භික්ෂුවක් විදියට ඒ මොහොතේ දකින්නේ. එහෙනම් පරණ ඒවා මෙතෙන්ට ඇවිල්ලා වැහෙන්න බෑ. මේ පිරිසිදු සිත. අන්න පරණ ඒවා ඇවිල්ලා මේ පිරිසිදු සිත වැසුණොත් එයා භික්ෂුවක් වෙන්නේ නැහැ.** මේ පිරිසිදු වෙන සිත පරණ දේවල් ඔළුවට අරගෙන මේ අලුත් සිත වහන එක නෙවෙයි භික්ෂුවක් වෙන්නේ. **මේ මොහොතේ මේ සිතට අවදිවෙන්න ඕන. මේ මොහොතේ මේ සිත අවදි කරගන්න. හැම මොහොතෙම තමන්ගේ සිත අවදි කරගන්න. හැම මොහොතෙම තමන්ගේ සිතට සිහිය තබාගන්න ඕන** දේ තමයි. මේ සිතේ තියෙන ගින්නයි දුගතියට අරන් යන්නේ. එහෙනම් අපි මේ කරපු දේවල් මොනවාද ? කියපු එකත් වැඩක් නෑ."

"එහෙම දෙයක් නෑ මේ කථාවේ. මේක ඇවිල්ලා මේ සිතත් ඇවිල්ලා ඇතිවෙනවා, නැතිවෙනවා. මේ සිත හැම මොහොතෙම අපි දකිනවා නම් මෙතන **සත්වයෙක්, පුද්ගලයෙක් නැති බව දකින්න.** දේශනා හොඳින් අහන්න. එතකොට ඔබතුමියට දැනෙයි. **සොබාදහමක් වගෙයි.** මේ ධර්මය හොඳින් පිරිසිදු කරගන්න. එතකොට අභ්‍යන්තරයේ ඔබතුමියට දැනෙයි කලින්ට වැඩිය නිවිලා නේද ? තියෙන්නේ" ඔබතුමියට දැන් ඉස්සරට වඩා කෝන්ති යන එක අඩුවෙලා. බාහිරෙත් එක්ක කම්පනය අඩුවෙලා නේ. දැන් ඔය සුගතියට තමයි වැටෙන්නේ. **නියත සම්බෝධි පරායනයි.** ඔබතුමී අර ටික එකතු කරගෙනයි **දුගතියට** යන්නේ. **"දැන් මෙතන මම කියලා කෙනෙක් නැතිබව දකින්න හෙම්හිට"** එතකොට නියත සම්බෝධි පරායනයි. මෙතන **සත්වයෙක් පුද්ගලයෙක් නැති බව දකින වාරයක් ගානේ සුගතියටයි වැටෙන්නේ.** ඇයි මේ අපේ ගින්න නිවෙන්නේ එතකොටයි.

**උපාසිකාව :-** එහෙමයි,

**ආර්යයන් වහන්ස :-** "අපි මේ **බෞද්ධයෙක් කියන්නේ භව නිරෝධයක් දකින අය"** බෞද්ධයෝ කියන්නේ නෑනේ දෙයියෝ ලෝකේ මැව්වා කියලා. "දෙවියෝ ගාවට යනවා කියලා එකක් නෑනේ. ඒක බෞද්ධයන්ට කියන්න බැහැනේ. බෞද්ධයෝ දන්නවානේ ඒක බොරුවක් කියලා. බෞද්ධයා කියන්නේ මෝහනයක් නෙවෙයිනේ. බෞද්ධයා විශ්වාස කරන ඒවා නෙවෙයිනේ. අදහන ඒවා නෙවෙයිනේ. ඔබතුමිය විශ්වාසයක් තියාගෙන හිටියොත් හා මං සුගතියේ කියලා ඒකත් වැරදියිනේ. බෞද්ධයා කියන්නේ **මේ මොහොතේ දේවල් තියෙනවා කියලා හිතාගෙන හිටියොත්** එයා බෞද්ධයෙක් නෙවෙයි. **හැබැයි මුකුත් මේ මොහොතේ නෑ කියලා හිතුවොත් එයා බෞද්ධ"** තියෙනවා කියලා හිතුවොත් බෞද්ධයෙක් නෙවෙයි. **භවයක් නෑ කියලා හිතුවොත්** බෞද්ධයෙක් අන්න **"භව නිරෝධෝ නිබ්බානෝ"**

"දැන් අපේ සමහර අය සම්මුතිය තුළ පටලවාගෙන ඉන්නේ මේ කර්ම පතය **බුදුදහමයි කියලා.** කර්ම පතය බුදු දහමක් නොවෙයි. ඒක මේ **මිථ්‍යා දෘෂ්ඨියක්.** අබුද්දෝත්පාද කාලයෙත් **හොඳ දේ කළොත් හොඳ තැනක නරක දේ කළොත් නරක තැනක** ඕව තියෙන්නේ. මහාමායාදේවියක් පන්සිල් ගත්තේ සත්තු මරන්නේ නෑ. හොරකම් කරන්නේ නෑ ඕවනේ කියන්නේ. **එතකොට බුදු කෙනෙක් හිටියේ නෑනේ.** ඒකෙ මිථ්‍යා දෘෂ්ඨියක් තියෙන්නේ. ඕක දැන් අපේ අය පොත් ලියාගෙන පටලවාගෙන තියෙන්නේ බුදුන් වහන්සේ කිව්වේ ඕකයි කියලා. දැන් කියාගෙන යනවා. ඒකම තමයි පටලැවිල්ල. ඒ ගොල්ලෝ කියනවා

බුදුන් වහන්සේ දේශනා කළේ දිව්‍ය ලෝකේ යන එක වගේ දේවල් බුදුන් වහන්සේ එහෙම දේශනා කරලා නෑ.” තථාගතයන් වහන්සේ **"හේතු ඵල දහමක්"** ලොවට හෙළි කරයි.

**"යේ ධම්මා හේතු පපභවා - තේසං හේතුං තථාගතො ආහ**
**තේසඤ්ච යො නිරෝධෝ - ඒවං වාදී මහා සමණෝ"**

තථාගතයන් වහන්සේ හේතු ඵල දහමක් ලොවට දේශනා කරයි. ඔය කියන්නේ පැහැදිලිව තථාගතයන් වහන්සේ හේතු ඵල දහමයි දේශනා කළේ කියලා. අද තියෙන්නේ **"කර්ම ඵලයක්"** ඉතිං හිතාගෙන හිටියොත් මෙහෙම කළොත් මෙහෙම වෙනවා කියලා එයා බෞද්ධයෙක් නෙවෙයි. බුද්ධාගම දන්නේ නෑ. ඉතිං අම්මත් හිතාගෙන ඉන්නේ මම නරක තැනකට යයි කියලා. කවුරුත් උතුම් මනුස්සයෙක් කරන්න හදන් නෑ.

**උපාසිකාව :-** නෑ, නෑ, මම දැන් කොහොමත් හිතන් නෑ නරක තැනක යයි කියලා.

**ආර්යයන් වහන්ස :-** බෞද්ධයෙක් හිතන්නේ කොහොමද දන්නවද ? **"මෙතන සත්වයෙක්, පුද්ගලයෙක් නෑ කියලා** මෙච්චර කාලයක් හිතපු නැති එකයි දැන් තියෙන දෝසේ” මෙච්චර කාලයක් **"පන්සල ඇතුලේ අර කෝවිලක් හදාගෙන. අපේ රජවරු අර ඉන්දියාවෙන් හින්දු ගෑණු රූප ගෙනැල්ලා පන්සල ඇතුලේ හැදුවා කෝවිලක්.** ඊට පස්සේ හින්දු ආගමෙන් භාගයයි. බුද්ධාගමෙන් භාගයයි. රජවරුන්ට ඔහොමනේ බණ කිව්වේ. අන්තිමටම මොකද වුණේ ? හින්දු ආගමෙන් භාගයයි, බුද්ධාගමෙන් භාගයයි. ඔක්කොම දැන් කොත්තු රොටියක් වෙලා. ඔක්කොම දැන් අවුල්වෙලා. මේ **ශ්‍රී සද්ධර්ම දේශනා කරනවා නම් කොච්චර හොඳද?** කොච්චර වටිනවද ? මේක බෞද්ධයාට කොච්චර අභාග්‍යයක්ද ? බෞද්ධයා අද බුදු දහමෙන් ඈත්වෙලා බෞද්ධයාට යන එන මං නැතිවෙලා. මේ පිරිසිදු **බුද්ධ ධර්මය දේශනා කරන් නැතුව වෙලා.** ඒක නිසා තමයි අපි මේ කියන්නේ බෞද්ධයා අසරණයි කියලා.”

අපි කියන්නේ **"මේ සත්‍ය ධර්මය අසන්න"** කලබල වෙන්න එපා. අම්මට දවසකුත් ඇති මේක **"හරියට මෙනෙහි කළොත් වාඩිවෙන්නේ පෘථග්ජනයෙක් නැගිටින්නේ ආර්යයන් වහන්සේ නමක් කියලා.** බාහිර ඇත්ත කරගත් කෙනෙක් වාඩිවෙනවා. අපි කියනවා මේ බාහිර කිසිවක් නෑ මේ සියල්ලම සිතමයි කියලා. **බාහිරින් මිදෙනවා කියන්නේ එයා සෝතාපන්න පැත්තට**

**එනවා.** අන්න **නියත සම්බෝධි පරායනයි.** කිසිදු දුගතියක වැටෙන් නෑ එතකොට. බාහිර ඇත්ත නෙවේ මේ දිව්‍ය ලෝකෙකුත් නෑ, අපායකුත් නෑ ඉතිං කොහේ කියලා යන්නද ? **මෙතන මේ සිත හටගෙන නැතිවෙනවා පමණයි. පවතින හිතකුත් නෑ ඉතිං කෙනෙක් කොහේද ඉන්නේ, කෙනෙකුත් නෑ. දැන් තේරෙනවා නේද ? මේක අනාත්ම ධර්මයක් කියලා. "චක්ඛු නිච්චතෝ - අනිච්චතෝ අනිච්චං භන්තේ" මේ ඇස නිත්‍ය ද ? අනිත්‍යද ? මහණෙනි, අනිත්‍යයි ස්වාමීනි, ඇස අනිත්‍ය නම් දුක නම් මහණෙනි, ඒක ආත්ම කොට ගත හැකිද ? මහණෙනි, "නෝ හේසං භන්තේ"** මේ අනාත්ම ධර්මයක් දේශනා කරන්නේ. දැන් හැම සූත්‍රයකම තියෙනවා මෙය අනාත්ම ධර්මයක් කියලා. මේක ආත්මයක් නෑ. මේ මොහොත විතරයි කියලා.

ඇත්තටම අපි මේ කියන්නේ "ත්‍රිපිටකය" අතේ තියාගෙන. මේ ත්‍රිපිටකය සාක්ෂි දරනවා අපි කියන ඒවා ඇත්තමයි කියලා. ඒකට හේතුව ත්‍රිපිටකයේ හැම සූත්‍රයක්ම තියෙන්නේ අනාත්මයි කියලා. ආත්මයක් නෑ කියලා බෞද්ධයාගේ පිරිහීම අත්දකිනවා. බෞද්ධයාගේ අධ්‍යාත්මික දියුණුව නැතිවුන නිසා තමයි මේ රට මේ තරම් පිරිහුණේ. මේ ධර්මය ප්‍රත්‍යක්ෂ වෙන්නම ඕන ඇස් ඇරෙන්න. ඉතිහාසෙ මතක් කරලත් දෙනවා. අපිට මොකද වුණේ කියලා පොඩ්ඩක් ඇස් ඇරලා පෙන්නන්න. කකුල් දෙකක් දෙපැත්තේ තියාගෙන අපට ගමනක් නෑ අම්මේ. **"බුද්ධ ධර්මය පිරිසිදුව දරාගන්න ඕන"** අපි වෙනදා විදියටම මල් පූජා කරන්න ඕන. වෙනදා විදියටම කරපු වැඩ කරන්න ඕන. අපේ හිත තුළින් දකින්න ඕන. **"රාග, ද්වේශ, මෝහ"** වලින් අපේ සිත වැහිලා. **වැහිලා තියෙන්නේ සිතුවිලි වලින්.** හැබැයි ඒවා සේරම දැක්කොත් එහෙම අපේ මේ සිතුවිලි ඇත්තක් නෙවෙයි කියලා හිතන දේවල් බාහිර නැති බව අන්න **"බුද්ධ ස්වභාවය"** අපේ සිත තුළම දකිනවා. අන්න **එහෙම දකිමින් වන්දනා කරන්න.**

**උපාසිකාව :-** අද උදේත් බුද්ධ පූජාව තියලා කිරිපිඬු තියලා වන්දනා කරලා තමයි දවස ආරම්භ කළේ.

**ආර්යයන් වහන්ස :-** එතකොට ගොඩක් වෙලාවට අම්මේ කරන්නේ **"බාහිර බුදු කෙනෙක්, කෙනෙක් පුද්ගලයෙක් ඉන්නවා කියලා හිතලනේ ඔය සේරම කරන්නේ."**

**උපාසිකාව :-** උන්වහන්සේ දේශනා කළ ධර්මය මෙනෙහි කරලා තමයි බුදුන් වහන්සේ වන්දනා කළේ.

**ආර්යයන් වහන්ස :-** අන්න හරි, ධර්මය මෙනෙහි කරනකොට තමන්ගේ සිතේ ගින්න නිවෙන බව පොඩ්ඩක් සිහිකරලා වන්දනා කරන්න. තමන්ගේම සිතේ සත්‍ය දකිනකොට මේ ගින්න නිවෙන බව **සිහිකරන්න.** දැන් තමන්ගේම සිතේ රාග ගින්න නිවාගෙන යන ගමනක් මේ යන්නේ. අන්න එතනයි පිරිසිදු වෙන්න ඕන. දවස ගානේම සිත **පිරිසිදු වෙන එකයි පින කියන්නේ.** එහෙනම් රාග, ද්වේශ, මෝහ නිවෙන එකයි. අපි දකිනවා එහෙනම් **අමූලිකා සද්ධාව නෙවෙයි ආකාරවතී ශ්‍රද්ධාව. ශ්‍රද්ධාව** කියන්නේ, සත්‍ය දකිනවා කියන එකයි. එතකොට සිත පිරිසිදු වෙනවා. **පින් සිද්ධ වෙනවා කියන්නේ අමූලිකා සද්ධාවනේ.** මේ ඇවිල්ලා සිතේ සත්‍ය දකිනවා සිත කියලා දෙයක් නැතිබව. මේ ක්ෂණයේ සිතක් හටගෙන නැතිවෙන බව, පවතින සිතක් නැති බව, මේ ක්ෂණයේම සත්‍ය දකිනවා කියන්නේ සිතේ රාග, ද්වේශ, මෝහ නිවෙන්නේ. සිත තියෙන තැන රාග, ද්වේශ, මෝහ තියෙනවා. සිත තියෙනවා කියන්නේ පොත තියෙනවා. දරුවා ඉන්නවා, ගෙයත් තියෙනවා කියන්නේ ඔක්කොම තියෙනවා කියන්නේ සිතමනේ. හැබැයි සිත **සත්‍යයක් නොවෙයි කියලා දකින තැන රාග, ද්වේශ, මෝහ ක්ෂය වෙන්නේ. අන්න සිත පිරිසිදු වෙන්නේ.** තමන්ගේම සිත තමන් වහලෙක් වගේ හිත කියන කියනදේම මෙච්චර කල් කරානේ. දැන් **අවසාන මොහොතේ හිත වග කියන් නෑනේ, හුස්ම යනකොට කෙනෙක් මිනිහෙක් මරන්නේ හිත කියන නිසානේ.** මේ හිත **කියන කියන දේ කරනවා කියන්නේ රාග, ද්වේශ, මෝහ වැඩිකර ගන්නවා කියන එකයි.**

ඒ කියන්නේ අපි දැන් ආස නිසානේ T.V. එක බලන්නේ. හැබැයි ඔය T.V. එක බලනකොට T.V. එකෙන් අපේ සිතේ රාග, ද්වේශ, මෝහ වැඩිකර ගන්නනේ. T.V. ඒක බලන්නේ. ඇයි අපි T.V. එක දාලා නාට්‍යයක් බලන්නේ. ඒකේ තියෙන දේවල් වලට අපිට කේන්ති යන්නේ. හිනා යන්නේ, ආස හිතෙන්නේ. හිතේ රාග, ද්වේශ, මෝහ වැඩිකරගන්න අපි ඉස්සරහ තියෙන වීදුරු පෙට්ටියක් දිහා බලාගෙන ඉන්නවා. **අපේ හිතේ තියෙන රාග, ද්වේශ, මෝහ වැඩිකරගෙන අපි ඒකෙන් අපි දුගතියට වැටෙනවා. හැබැයි මේ සිතේ සත්‍ය දැක්කට පස්සේ නෙළුම් පතේ දිය බිඳ නොඇලී නොගැටී සිටින්නා සේ** අපට පුළුවන් මේ කිසිම දේකට ගිනිගන්නේ නැතුව සාමාන්‍ය විදියට ඉන්න. **ඒක තමයි දක්ෂතාවය, කුසලතාවය කියන්නේ. ඒක තමයි නොඇලී නොගැටී වාසය කරනවා එක. ධර්මය අවබෝධ වෙනකොට කිසිම දේකට ගැටෙන්නේ නෑ ඇලෙන්නේ නෑ.** අන්න අටලෝදහමින් කම්පානොවෙන, නින්දා - ප්‍රශංසා, කීර්ති - අපකීර්ති, ලාභ - අලාභ, සැප - දුක් සියල්ල සතුටින් භාරගන්නවා. **අන්න එතනයි නිවීම "නිවන් දැකීම" දැනුණා නේද ? එහෙම කරනකොට. ඇත්තටම ගින්න නිවෙන එකනේ වෙන්න ඕන.** තෙරුවන් සරණයි !

# 2 වන දේශනය - මොහොතට අවදිය

**(ආශ්චර්යයි, අත්භූතයි, ස්වාමීනී !)**

**උපාසක :-** "ඔබ වහන්සේගෙන් මං මේ ප්‍රශ්නය අසන්නේ, ශබ්දයයි, වර්ණයයි හිතේ තැන්පත් වෙලා නේද ? ඉන්ද්‍රියයන් 05 ටම නේද ? මැවෙන්නේ. පොඩි ළමයට ශබ්දයි, වර්ණයි විතරද ගැට ගැසෙන්නේ"

**ආර්යයන් වහන්ස :-** "නෑ නෑ ශබ්ද වර්ණ එකතුවෙන කථාවක් අප කවදාවත් කියලා නෑ. පටලවගන්න නිසා ඒ දෙක ගැන විතරක් නිරවුල් වෙන්න ඕන නිසා. නැත්නම් ඒ දෙක ගැන ඉස්මතු කරලා දෙන්න ඕන නිසා. පටලවාගත්ත නිසයි ඒ දෙක ගැන විතරක් වෙනම අරන් තියෙන්නේ. සාමාන්‍ය මනුස්සයෙක්, පෘථග්ජන මනුස්සයෙක් අවුල් කරන්න බැරි හින්දා ඒ දෙක ඉස්මතු කරා. සාමාන්‍ය මනුස්සයෙක්ට ඒ දෙක හොඳට පේනවා. අපි නෙවෙයි බුදුන් වහන්සේයි කියන්නේ." **භාහියදාරුචීරිය තාපසතුමාට කිව්වේ "දිට්ඨේ - දිට්ඨමත්තං, සුතේ - සුතමත්තං" කියලා. එහෙනම් කියන්න ඕන "ඝහනේ - ඝානමත්තං, ජිව්හවේ - ජිව්හමත්තං, කායේ - කායානුමත්තං" බුදුන් වහන්සේ එහෙම කිව්වේ නැත්තේ ඇයි ? බුදුන් වහන්සේ දිට්ඨේ - දිට්ඨමත්තං, සුතේ - සුතමත්තං, අර 3 එකට එකතු කරලා (රස, ගන්ධ, ස්පර්ශය) මුත කිව්වා.** තුනම දැනීමක්. මුතේ, මුතමත්තං කියලා බුදුන් වහන්සේ තමයි මෙය පහසු කරන්නේ"

**උපාසක :-** ආර්යයන් වහන්ස ඕව දැන් මෙනෙහි කරනකොට මෙහෙම සිතට ආවා. සම්පූර්ණ මනුස්සයෙකුත් ඉන්නවා. බීරි මනුස්සයෙකුත් ඉන්නවා. මට කතාකරන්න පුළුවන්. බීරි සංඥාත් මම දන්නවා. මම කියනවා ගෙට ගිහින් පරිප්පු බෙදාගෙන එන්න කියලා. මම අරයට අංග චලනවලින් පෙන්නනවා. දෙන්නම කරන්නේ එකම දේ. දෙන්න තුළම ලෝක දෙකක් මැව්ලා තියෙනවනේ කොහොම හරි.

**ආර්යයන් වහන්ස :-** අපි මේ සිත තුළ මැවෙන ලෝකයක් ගැන, බාහිර ඇත්ත කරගත් ලෝකයක් ගැන කථා කරන්නේ. තිරිසන් සත්වයාටත් ලෝකයක් මැවෙනවා. **සත්ව කියන්නේම ලෝකය මැවෙන නිසයි.** සියලු සත්වයාට ඇත්තටම සිතෙයි ලෝකයක් මැවෙන්නේ. මිනිස් සත්වයාට මැවෙන ලෝකය නෙවෙයි තිරිසන් සත්වයාට මැවෙන්නේ ලෝකය. ලෝකය සත්වයන්ට වෙනස් වෙනස් විදියටයි ලෝකය මැවෙන්නේ. මී මැස්සාට ලෝකය මැවෙන්නේ අටලොස් ආකාරයක. කැරපොත්තාට රතු පාටයි, බකමුණා වෙනස් විදියට. වවුලාට රේඩාර් සත්වයින්ට විවිධාකාර විදියටයි ස්පර්ශයන් දැනෙන්නේ. **පණුවා ගත්තොත් පණුවට ඇස් නෑ. ස්පර්ශයෙන් දැනෙන්නේ. කැරපොත්තාට කන් නැතිවුණාට සංඥාවක් තියෙනවා. ඒවායින් තමයි දැනෙන්නේ. කම්පනය, චංචල තියෙනවා.**

**උපාසක :-** ස්වාමීනී, මම තනියෙන් ඉඳගෙන කණ්ණාඩිය ළඟ තියාගෙන බලනවිට දැනෙන්නේ ඇතිවෙන නැතිවෙන දැනීමක් පමණයි කියලා. අන්තිමට පෙනෙන්නේ ඇතුළතින් නැතුව පිටිනුත් නැතුව වගේ දැනෙන්නේ. ඊළඟට මම ඇස් පියාගෙන බලලා ඇස් ඇරලා බලනවා. පෙනීමක් විතරයි ඒ වුණාට ස්වාමීන් වහන්ස එතන දෙයක් නෑ කියලා දැනෙන්නේ නෑ.

**ආර්යයන් වහන්ස :-** "ඔබතුමාගේ අභ්‍යන්තර අවබෝධය ගැන ගැටලුවක් ඇති බව දැනෙනවා. කෙනාකෙනා දාගත්ත කණ්ණාඩියෙන් බැලුවොත් බුද්ධක්ෂණය පැහැදිලි කරන්න කෙනාගෙන් කෙනාට වෙනස් වෙනවා. මෙතන අවස්ථා ගණනක් පෙන්නුම් කරනවා. භාවනා තැන් බොලද බාහිර පටු තැනක්. **බුදුන් වහන්සේ පටිච්ච සමුප්පාද ධර්මය තුළ කියන්නේ එය නොවේ.** මෙය සිද්ධ වෙන්නේ **අවබෝධයට** පත්වන විට, **දර්ශන අවබෝධය ඇති කෙනාට, සම්මා දිට්ඨිය ඇති කෙනාට තම තමන්ගේ අවබෝධය තේරුම් ගන්නේ තමන්ගේ මට්ටමට** "බුදුන් වහන්සේ කියනවා **මහණෙනි, අශ්ව ලෝමයක් සියයක් කඩකට පැලිය හැකියි. මෙය අවබෝධ කරගැනීම සූකර නොවේ කියනකොට අති සියුම් කෝණයක් තියෙනවා. මේක අති දුර්ලභ,** ගැඹුරු කාරණයක් නමුත්, බැලූ බැල්මට පේනවා හරිම සරලයි. අපිට **ආත්ම කථාවක් තියෙනවා. අපි ආත්මීය දෘෂ්ටියකින් හැමදෙයක්ම බලන්නේ. මේ කෙනෙක් කරනවා කියලා, කෙනෙක් දකිනවා කියලා හිතන්නේ. මේ කෙනෙකුට දැනෙනවා කියලා හිතන්නේ. මෙතන ඔහොම දෙයක් නෑ. මෙතන තියෙන්නේ සොබාදහම විතරයි."**

මේක හරි සියුම් කෝණයක්. මේක දකින්න බෑ ආත්ම කෝණයකට. ඒත් මේක අපේ අවාසනාවකට **විඤ්ඤාණ මායාවෙන්** එළියට යන්න බෑ. ඒ නිසා අපි හැමදෙයක්ම ගලපන්නේ විඤ්ඤාණ මායාවෙන්. **මෙතනයි අපේ අසරණකම.** මේ ධර්මයේ තියෙන්නේ විඤ්ඤාණ මායාවෙන් ඔබ්බට ගිය "**විඤ්ඤාණන් අනිදස්සනං**" කියන තැනයි. එතැනි **ඤාණයටයි** අසුවෙන්නේ. ඤාණය කියන්නේ විඤ්ඤාණය නොවේ. අපි උගුර ලේ රහ වෙනකම් කියනවා ඤාණය කියන්නේ විඤ්ඤාණය නොවෙයි කියලා. **ඤායස්ස අධිගමාය කියලා නොවෙයි, බුදු හාමුදුරුවෝ කියන්නේ විඤ්ඤාණස්ස අධිගමාය කියලා කියන්නේ ඒ නිසයි.** අපට තේරෙනවා හොඳට මේ හැම තැනම කියන්නේ සුතමය ඤාණය. **මෙතන උදයව්‍ය ඤාණය - (ඇතිවෙන නැතිවෙන ඤාණය), භංග ඤාණ, භයතු පට්ඨාන ඤාණය, ආදීනව ඤාණය, නිබ්බිදානාපස්සනා ඤාණ, මුඤ්චිතුකම්‍යතා ඤාණ, පටිසංඛාර ඤාණ, සංඛාර උපේක්ඛා ඤාණ, අනුලෝම ඤාණ** ඇයි මේ හැම එකක්ම ඤාණය කියන්නේ. මේක අති සියුම්කාරණයක්.

**උපාසක :-** ඔය ඤාණ 09 න් කීපයක් නේද ? බුද්ධ දේශනාවේ තියෙන්නේ. අනිත් ඒවා පස්සේ දාගත්තු එකක් නේද ?

**ආර්යයන් වහන්ස :-** නෑ, නෑ, බුදුහාමුදුරුවන්ට තව කියන්න තිබුණා. ඤාණය කියන්නේ වචනයක් විතරයි. දැන් අපි විඤ්ඤාණය කිව්වා. මේක වචනයක් විතරයි. කොහේටවත් ගැටගහලා තියෙන එකක් නොවේ. **මේ චක්ඛු විඤ්ඤාණය, ඝාණ විඤ්ඤාණය. අපට දැනෙන ස්වභාවයයි විඤ්ඤාණය කියන්නේ.** මේවා අපි දාගත්තු ඒවා. මේවා කොහේවත් තියෙන එකක් නොවේ. ඤාණ කියන එක අපි හැමතැනටම කියනවා. **ඇයි හැමදේකට යටින් ඤාණ කියලා එකක් තියෙන්නේ.** උදයව්‍ය ඤාණය. සූතමය ඤාණය කියන්නේ අසා දැනගන්න එක. අපි ඕක පොතේ ලියනවා. **විශේෂයෙන් දැනගන්නවා කියලා.** සම්පූර්ණයෙන්ම ධර්මයට පටහැනියි. මේක ලියන්න බැරිකමක් තියෙන්නේ.

පොතේ ලිව්වාට ලුණු රස ඇඹුලයි කියලා මේ ඤාණය දැනෙන්නම ඕනේ. **ඤාණය කියන්නේ ඇත්තටම සිහියමයි.** බිත්තිය දැකපු බවටයි සිහිය කියන්නේ. **එහෙනම් අපි දෙයක් දැක්කාම වෙනයි. දැකගත්තු බවට සිහියකුත් තිබිලා තියෙනවා එතන. අන්න ඒකයි සූත්‍රමය ඤාණය කියන්නේ.** යමක් අපි අහගෙන ඉන්නකොට තේරෙනවා මේක ඇත්ත. මේක තමයි මේ කියන්නේ කියලා. අපි ඒක වටහා ගන්නවා, ගලපගන්නවා අපි සිතපු දේ තමයි ඤාණය කියන්නේ කියලා. අපි හිතපු දේ නෙමෙයි ඤාණය කියන්නේ. **අපි අසා දැනගැනීමයි සුතමය ඤාණය කියන්නේ. දැනෙන දැනීමකුත් තියෙනවා. "ජානතෝ - පස්සතෝ"** කියලා වචන 02 කුත් තියෙනවා. මේ වචන දෙක තමයි **මුළු මේ ගමනම ගෙනියන්නේ.** සුතමය කියන්නේ අපි මේ අසා දැනගත්තු දැනුම වෙනයි.

"අපි පිහිය ගලේ ඒ පැත්තට මේ පැත්තට අතුල්ලනවා. අපි කියනවා පිහිය මුවහත් තියනවා කියලා. මේ මුවහත ඒ අතට අතුල්ලන එක, මේ අතට අතුල්ලන එක සම්බන්ධයක් නෑ. නමුත් **මේ මුවහත තමයි අවබෝධය, අන්න ඤාණය,** ඒ පිහිය කැපෙනවා. එතකොට තමයි අවබෝධය. අවබෝධය කියන්නේ දැනුම නෙවෙයි. කෙනෙකුට මතක නෑ මොකක්ද ? කිව්වේ කියලා. මොකක්ද ? ඒ සූත්‍රය මතක නෑ. නමුත් හරය දන්නවා. පිහිය මුවහත් තිබුණාට කැපෙනවා. නමුත් පිහිය කොයි අතට අතුල්ලනවා ද කියා මතක නෑ. පිහිය කැපෙනවා. අපට සූත්‍ර මතක නෑ ආර්යයන් වහන්ස, **නමුත් කිසිදේකට ඇලීමක් නැහැ. ගැටෙන්නෙත් නැහැ.** හැබැයි ආර්යයන් වහන්ස, කවුරුන් ඇහුවට කියන්න දන්නේ නෑ. නමුත් ආර්යයන් වහන්ස, කෙලෙස්වල ලොකු අඩුවක් දැනෙනවා. **අන්න ඤාණයට අසුවෙලා. අවබෝධයට පත්වෙලා. කියන්න පුළුවන්ද අවබෝධයට පත්වෙලා නෑ කියලා."**

"කවුරුත් ඇසුවාට කියන්න බෑ මේක කොහොමද ? මේක කොහොම එයා කියන්න දන්නේ නෑ මේ ධර්මය අද හැම පැත්තෙන්ම මායාව එනවා. **හැම පැත්තේම දෘෂ්ටි තියෙනවා. මේක දෘෂ්ටි කාන්තාරයක් ඇත්තටම. බොහොම පරිස්සමින් යන්න ඕන ගමනක් අපිට තියෙනවා.** අපට අදහන්න බෑ කිසිම

දෙයක්. විශ්වාස කරන්න බෑ. පුද්ගල සරණ යන්න බෑ. එහෙම යන්න හැකියාවක් නෑ. බුදුන් වහන්සේ ඒවා අගේ කරලත් නෑ. "මේ කුණු කය දිහා බලාගෙන මොකද කරන්නේ ? **වක්කලී** කියනකොට මේ කෙනෙකුට පුද්ගලයෙකුට රූපයකට නොවේ වශීවෙන්නේ. මොකක්ද මේ දෙන ධර්මය. ඒකෙන් මොනවද ? අපේ නැතිවෙන කෙලෙස් ස්වභාවය. **අපේ දියුණුව කියන්නේ සසරින් මිදෙන එකයි. මිදෙනවා කියන්නේ සිතුවිලි සසරෙන්. අපිට හැම මොහොතකම නිස්සරණයක් සිතින් මිදීමක් අපට දැනෙන්න ඕන."**

**"අපිට සිතින් මිදීමක් දැනෙනවා නම් අපි නිවැරදි තැනකයි ඉන්නේ.** අපට වැදගත් නෑ. කවුද කිව්වේ,කොයි විදියටද කිව්වේ, හයියෙන්ද, හෙමින්ද, බැනලද කිව්වේ ආදරෙන් ද කිව්වේ, ගෑණු කෙනෙක් ද පිරිමි කෙනෙක් ද අපිට අදාළ නෑ. '**නාම රූපං නජීරතී,**' **නාමරූප පරිච්ඡේදයකට යනවා. එහෙනම් නාම - රූප අල්ලගන්න නෙවෙයි අපට ඕන. නාම - රූප වලින් මිදුණු ඒ විඤ්ඤාණ අවබෝධයට පත්වෙන්න. අවබෝධයෙන් තුළින් තමයි විඤ්ඤාණයෙන් මිදෙන්නේ. "සංඛිත්තේන නිබ්බිදාය" අවබෝධයෙන් නිවන් දකින්න. අවබෝධයක් ඤාණයෙන් නිවන කියන්නේ. අවබෝධ කරන ධර්මයක්. ආත්මයක් නැති බවටයි අපට අවබෝධ වෙන්නේ.** මේක බොහොම පරිස්සමින් යන්න ඕන ගමනක්. ඔබතුමාට කාරණයක් කියන්න ඕන. අහපු ප්‍රශ්නය නැවතත් ඉදිරිපත් කරන්න."

**උපාසක :-** "ඔව් ස්වාමීන් වහන්ස ! දැන් මම පුරුදු කරනවා. ඇස් වහගන්නවා, ඇස අරිනවා"

**ආර්යයන් වහන්ස :-** "ඔබතුමාගේ ප්‍රශ්නය තිබුණේ බුද්ධක්ෂණයේ, බුද්ධක්ෂණයේ **මොහොතට අවදිවන විට එතන ඇතිවෙනවා. නැතිවෙනවා කියලා දැනීමක් එන්නේ නෑ. මෙන්න මේක පළවෙනි එක.** පෘථග්ජන කෙනාගෙන් සිත ඇතිවෙනවා නැතිවෙනවානේ. **බුද්ධක්ෂණය දකින කෙනාගෙත් සිත ඇතිවෙනවා නැතිවෙනවා කියන එක වෙනවානේ.** පෘථග්ජන කෙනාටත් මේ පැත්ත බලනකොට බිත්තිය පේනවා. පොත දකින කෙනා කියාවි **ආර්යයන් වහන්ස මට පැහැදිලි බිත්තිය දකින සිත ඇතිවෙලා නැතිවෙලා ඉවරයි. පොත දකින සිතත් ඇතිවෙලා නැතිවෙලා ඉවරයි දැන්. උදයව්‍ය ඤාණය කියන්නේ මේකද ?** එතකොට අපි කියනවා එක්තරා විදියකට ඔතනත් උදය - වැය තියෙනවා හැබැයි ඕක නෙවෙයි පරමාර්ථ සත්‍යය. අවසාන නිෂ්ඨාව ඕක නෙවෙයි. **හැබැයි ආරම්භය මේකයි.** මේ ධර්මය ගැඹුරෙන් ගැඹුරට යනවා. **"විවරිතෝ - විජඩීතෝ"** ඒ කියන්නේ මේක උදය - වැය ඤාණය කියන එක **"ඉති රූපං සමුදයෝ - ඉති රූපං අත්තගමන්ච කියන එකයි."** ඒ කියන්නේ රූපයේ සත්‍ය දකින කෙනා රූපයේ ඇතිවීම දකින කෙනා රූපයේ අත්තගමය දකිනවා. අත්තගමය (රූපය) කියන්නේ රූපාරම්මණය. ශබ්ද රූප - වර්ණ රූප. මොහොතට අවදිය කියන්නේ නිවන. මෙය දකින හැටියි අපෙන්

අහන්නේ. මේකට උත්තරේ මෙහෙමයි ඔය පටන් ගන්නේ. නමුත් මෙය දීර්ඝයි. **එතකොට උදය - වැය කියන්නේ අපිට වචන 2 ක් විතරයි. නමුත් ඒක දකින්න ගියාම තමයි එය තේරෙන්නේ "ඉති රූපං සමුදයෝ - ඉති රූපං අත්තගමංච කියලා** එහෙනම් ඇතිවුණේ මොකක්ද ? චිත්තයක් (රූපයත්) නැති වුණේ මොකක්ද ? චිත්තයක් (රූපයක්) නැති වුණේ මොකක්ද ? නැතිවෙන්නේ නෑ ඇත්ත දකිනකන්. ඒකයි ඉති රූපං කිව්වේ ඇතිවෙන්නේ රූපය මොකක්ද කියලා අඳුරගන්නකන්. ඒක ටිකක් ගැඹුරුයි. "ඉති රූපං සමුදයෝ" කිව්වේ. එහෙනම් රූපය හටගත් ආකාරය කොහොමද කියලා දැනගන්න **"පුබ්බේ නිවාසානුස්සති ඥාණය" තියෙන්න ඕන. පෙර සිත් කඳ පිළිවෙල දකින කෙනාටයි මේ සිත් හටගන්න හැටි පේන්නේ, ඉති රූපං අත්තගමංච කියන්නේ. අන්න ඉති රූපය හැදෙන හැටි දැක්කොත් විතරයි මැජික්වල මැජික් නැතිවෙන්නේ. 'ඉති රූපං අත්තගමංච කියන්නේ'** රූපය නැතිවෙන්නේ නෑ. එතකං කාටවත් නිවන් මග හමුවන්නේ නෑ. මේ කියන්නේ මේ මොහොතේ අරමුණ ගැනයි. "ඉති රූපං" කියන්නේ මේ මොහොතේ රූපාරම්මණයටයි. මේ මොහොතේ හටගන්නා අරමුණයි මේ මුළු ධර්මයේම තියෙන්නේ. කෙටියෙන් කියන්නම් අරමුණ ගැන."

**ක්ෂණ සම්පත්තිය කියන්නේ, ක්ෂණය කියන්නේ මේ මොහොතේ හටගත් ක්ෂණයක සිතයි. ක්ෂණ සම්පත්තියයි. දුර්ලභංච සද්ධර්ම ශ්‍රවණං, දුර්ලභංච ක්ෂණ සම්පත්ති, දුර්ලභං පතිරූපදේස වාසය.** හැමෝටම ඇහෙන්නේ නෑ මේ දුර්ලභ කාරණා. බුදුන් වහන්සේ දේශනා කරන්නේ මොකක්ද ? මේ **මේ දුර්ලභ ක්ෂණය දකින්නයි. මොකක්ද ? මේ ක්ෂණය. මේ මොහොතේ ආරම්මණය දකින්නයි. මොකක්ද මේ අරමුණ. අන්න රූපාරම්මණය.** මේක දීර්ඝ පැහැදිලි කිරීමක්. ගොඩක් අය හිතනවා අභිධර්මයේ රූප කාණ්ඩ 28 ක් හදාගෙන මේ රූප කාණ්ඩ 28 හොඳට අවබෝධ කරගෙන ඒක ඉගෙනගන්න එක තමයි "ඉති රූපං" කියන්නේ කියලා. තනිකරම පටලවා ගැනීමක්. වරදවා ගැනීමක්. ඔබ අසරණ වේවි. ඔබට "සිලබස්" එකක් හමුවේවි. ඔබට දැනුමක් ලැබේවි. **පෝට්ල භික්ෂුවක් වේවි. ඔබ නිවන් දකින්නේ නම් නෑ. මේ නිවන් මග හරිම සරලයි. සුන්දරයි.** නමුත් මේ අරමුණයි කිව්වාම හරි සරලයි. සාමාන්‍යයෙන් කිව්වත් පුතේ මේ අරමුණ තමයි. එක සිතයි එක මොහොතක තියෙන්නේ.

ධර්මය ගැන දන්න කෙනෙකුට කියනකොට "ඉති රූපං සමුදයෝ" ලොකු කෙනෙකුට තමයි ප්‍රශ්න තියෙන්නේ. පොඩි ළමයට ඒ වගේ ප්‍රශ්න නෑනේ. ලොකු අය රූපයට කියන්නේ වෙනින් දේවල් වලට. **"ඉති රූපං සමුදයෝ" කියන එක හරියට විසදා නොගත්තොත්** එයාට මේ මුළු ධර්මය කවදාවත් හමුවන්නේ නෑ. **ගැඹුරුයි මේ රූපය අවබෝධ කරන එක. "රූපං නිච්චතෝ - අනිච්චතෝ" "අනිච්චං භන්තේ" බුදුන් වහන්සේ අහනවා මේ රූපය නිත්‍යද ? අනිත්‍යද ? කියලා. ස්වාමීන් වහන්සේලා කියනවා අනිත්‍යයි ස්වාමීනී ! කියලා.** "ඉති රූපං" කියන්නේ මුළු ධර්මයටම. ඒක ටිකක් ගැඹුරුයි. එයාට අවබෝධ

කරන්න තියෙන්නේ රූපයමයි. **මේක අවබෝධ කර නොගත්තොත් එයාට මේ නිවන් මග කවදාවත් හමුවන්නේ නෑ. ඒක උඩින් පැනලා ගියත්, පාගගෙන ගියත් නිවන් මග හමුවන්නේ නැහැ. එයා කොහේ හරි ගමනක් යයි. හරියට නිවන උඩ ඉඳගෙන නිවන වටේ හොයනවා වගේ වැඩක්.** එයා හිතනවා මේක රූප සංඥාව කියලා. එයා ඊට පස්සේ එතකොට බැටි කරලා දාලා, විසි කරලා දාලා මොකක්ද හොයනවා.

**"විසි කරලා දාපු එකමයි එයාට නැවත හොයන්න වෙන්නේ. එතනමයි නිවන තියෙන්නේ. මේ "ඉති රූපං" කියන එක ඇවිල්ලා රූපාරම්මණය. අපි කොහේ රවුම් ගැහුවත් මෙතෙන්ටමයි ආයේ කැරකිලා එන්නේ. අපට අවබෝධ කරන්න තියෙන්නේ. "ඉති රූපං" කියන කාරණයයි.**

(මේ දේශනයේ ඉතිරි කොටස මොහොතට අවදිය 03 හා සම්බන්ධ වේ.)

# 3 වන දේශනය - මොහොතට අවදිය

**(බුද්ධ දර්ශනය නොමැතිව මොහොතට අවදිය සිදු නොවේ.)**

**ආර්යයන් වහන්ස :-** ඒ කියන්නේ රූපාරම්මණය කියන එක. ඔබතුමා කියනවා වගේ අපි මේක බොහොම පරිස්සමෙන් දකින්න ඕන. එන ආරම්මණය ඔබතුමා දැන් මේ මොහොතේ එන ආරම්මණය ඉති රූපං කියනකොට අපි දකින්න ඕන තැන තමයි මෙතන සුතමය ඤාණය තියෙන කෙනාටයි. "**කෘත්‍ය ඤාණය කෘතක් ඤාණ** මේකනේ අපේ දිසානතිය **එතකොට අපිට අනු පිළිවෙලින් යන නිවන් මගක් හමුවෙනවා. සුතමය ඤාණය කියන්නේ දර්ශන සමාපත්තිය දර්ශන ඤාණය**" මේ බුද්ධ දර්ශනයයි. බුදුන් වහන්සේ ලෝකෙට හෙළිකළ දර්ශනයයි අපි අවබෝධ කරන්න ඕන. අන්න ඒ දර්ශනය තුළ බුදුන් වහන්සේ පෙන්නනවා මේ දර්ශනය තුල **අපිට මේ ලෝකයක් හමුවන්නේ නෑ.** එතකොට අපිට රූපයක් ආත්මයක් හමුවන්නේ නෑ. එහෙනම් අපිට සැනසීමට පත්වෙනවා. නිවන් දකිනවා. අන්න ඒක ප්‍රායෝගික කරගන්නයි **කෘත්‍ය ඤාණය** කියන එක තියෙන්නේ. හැබැයි මේ එකක්වත් භාවනාව නෙවෙයි කියලා අපි කියනවා. **එතනින් පොඩ්ඩක් පැත්තකට තියලා තමයි මේකට එන්න ඕන.**

මෙතන සම්පූර්ණයෙන්ම තියෙන්නේ පටිච්චසමුප්පාද අවබෝධයක්. පටිච්ච සමුප්පාදය තුලිනුයි මේ සිතේ සත්‍ය අවබෝධ කරනවා කියන්නේ. අපි දන්නවා රූප ධ්‍යානවල සිටියා ආලාර කාලාම, උද්දකරාම පුත්‍ර අරූප ධ්‍යාන වල භාවනා කළා. නමුත් නිවන් මගක් හමුවුණේ නෑ. බුදුන් වහන්සේ මේ ගුරුවරු අතහැරියේ එතකොට ගුරුවරයෙක් නෑනේ. නමුත් බුදුන් වහන්සේට සිද්ධවුණේ ආත්මය කියන එක එක තැනකින්වත් නැතිවෙන්නේ නෑ. ඒ ආත්ම සංඥාව නැතිවෙලා නෑ. එතකොට බුදුන් වහන්සේට තේරුණා **මෙතනත් මේ මම කියන සංඥාව නැති වෙන්නේ නෑ. එතකන් මම උපදිනවා එහෙනම් බුදුන් වහන්සේ බැලුවා ආත්මය කොහොමද හැදෙන්නේ.** බලනකොට මේක සිතකයි හැදෙන්නේ. **සිත කොහොමද හැදෙන්නේ අන්න "පටිච්ච සමුප්පාදයේ" සිත හැදෙන හැටියි කියන්නේ.**

"අවිද්‍යා පච්චයා සංඛාරා කියලා කිව්වාට අපට මේ සිත ආත්මය හැදෙන හැටියි මෙතන අවබෝධ කරන්නේ. ඇත්තටම කිව්වොත් මේ දෙයක් කියලා අපි ගත්තොත් පොත, මේසෙ, ඇඳ කියලා. ඒ දෙයක් කියලා ගත්ත දැනීමමයි. **ආත්මය කියන්නේ පොතමයි මම කියන්නේ.** දැන් මෙතනයි, ඉති රූපං කියලා ගන්නකොට ඉති රූපං සමුදයෝ. දැන් මෙතන ඉති රූපං කියලා ගන්න කොට අපි දකිනවා ශබ්ද සංඥා, වර්ණ සංඥා, ගන්ධ සංඥා, රස සංඥා ඔබතුමා කිව්වේ රූපයද සංඥාව කියලා. එතකොට අපි කිව්වේ, ශබ්ද රූප, වර්ණ රූප, ගන්ධ රූප, රස රූප, පොට්ඨබ්බ රූප කියන්නේ එතකොට එක අදියරක්. ඊට පස්සේ ස්පර්ශය රූප සංඥා, වර්ණ සංඥා, ගන්ධ සංඥා, රස සංඥා,

පොට්ඨබ්බ සංඥා තව අදියරක්. එතකොට ඕලාරික **ශබ්ද වර්ණ තැනින් ඇවිල්ලා සංඥා ස්වභාවයකට එනවා.** දැන් මෙතන තියෙන කාරණාව ඒක නෙවෙයි. ඊට වෙනස් දෙයක් අවබෝධ කරගන්න.

"ඒ කියන්නේ හොඳට බලන්න. දැන් අපි මේක දකින කොට තමයි අපට තේරෙන්නේ **"පොතක තියෙන දෙයක් නෙවෙයි ප්‍රායෝගික ධර්මයක්, ප්‍රත්‍යක්ෂ ධර්මයක්, සාන්දිට්ඨික ධර්මයක්, හැම මොහොතෙම කියන කොටම නුවණට හසුවන ධර්මයක්"** එතකොට සාමාන්‍යයෙන් අපි කිව්වා පුබ්බේ නිවාසානුස්සති ඤාණ තියෙන්න ඕන කියලා. අපි කිව්වා මේ **සිත හැදෙන හැටියි මේකේ තියෙන්නේ** කියලා. මේ සංඥාව සිත. සංඥාව එහෙනම් සිතක් කොහොමද හැදුනේ. එතකොට සංඥාව, මේ සංඥාව දැන් මෙතන පරිහරණය කරන්නේ. මේ එන අරමුණ හිත දකින එක තමයි සංඥාව කියන්නේ. මේ අරමුණයි ඒකමයි ඒ අරමුණමයි, මේ තවත් ඇතුළට ගියාම. සිතත් හැදිලානේ තියෙන්නේ මේ සිත කොහොමද හැදෙන්නේ කියන එක දන්නේ නෑනේ. ඒක නිසයි අපි කියන්නේ පුංචි දරුවාගේ සිත හැදෙන හැටි මුලට යන් ඕන කියලා. මේ සිත පටන් ගත්තේ කොහොමද ? කියලා. එතකොට තමයි **"ඉති රූපං සමුදයෝ"** කියන තැනට එන්නේ. දැන් අපි රූපය හදුනාගත්තා මේක සංඥාවක්, අරමුණක්, රූප සංඥාවක්. නමුත් මේක හැදුනේ කොහොමද කියන එක "ඉති රූපං සමුදයෝ" සිතයි. දැන් මේ සිතට තමයි සංඥාව කියන්නේ. අපි මේ සංඥා **හටගන්නේ කොහොමද ? කියලා දැනගන්න ඕන.** අන්න අපට සිද්ධ වෙනවා පොඩි දරුවා ඉපදුන තැනට පොඩ්ඩක් යන්න.

**දැන් අපි කියනවා පෙර මතකයෙන්. ඔන්න දැන් එයාට කියන්න පුළුවන් දැන් මේසේ කියන සංඥාව, පුටුව කියන සංඥාව ඔහොම කියතැහැකිනේ, නිමිත්තනේ. හැබැයි නිමිත්ත කොහෙන්ද ආවේ. දැන් සංඥාව කියලා පැත්තකට දාන්න බෑනේ. "ඉති රූපං" කියන තැනට එන්න එපාය. "සමුදයේ ඤාණං" කියන්නේ මේ සිත හැදෙන හැටි දකින්න එපාය. "සමුදයේ අඤාණං" කියන්නේ සිත හැදෙන හැටි දන්නෑ කියන එකනේ. අන්න එතකොට මේ සිත දකිනවා කියන්නේ දෙකක් නොව එකක් සංඥාවටම තමයි.** මේ සිත හැදෙන හැටි දකිනකොට එයාට සිද්ධ වෙනවා කෙටි පැහැදිලි කරගැනීමක්. එයාට එනවා මේක පෙර මතකයෙන් ආවේ කියලා. එහෙනම් මේ ආරම්මණයයි කතා කරන්නේ, අරමුණයි. දැන් මේ අරමුණ පොත අපි උපමාව ගමු. නිතරම කතාකරන උපමාව පොත. **එතකොට මේ රූපය අවබෝධ කරගත්ත එකක්. මේ අරමුණ අවබෝධ කරගන්න එකමයි රූපය අවබෝධ කරනවා කියන්නේ.** මේ ප්‍රශ්න ගොඩ මෙතනින් විසඳෙනවා. ධර්මයේ පැහැදිලි කරන රූපය මොකක්ද කියන එක සංඥාව දකින එක අවබෝධ කරගන්න එක දෙකක් නොව එකක්මයි කියන එක. මේක හැදෙන හැටි දකින්න එනකොට මෙයාට ඕනවෙනවා. **"ඒක අවබෝධ කරන එකමයි පටිච්චසමුප්පාදය අවබෝධ කරනවා කියන්නේ."** මෙයා දන්නවා පෙර මතකයෙන්. දැන් උපමාවක් ගන්නවා.

මේක දැන් සංඥාව පොත, දැන් කොහොමද මේ පොත ආවේ අපි කියනවා පෙර මතකයෙන් කියලා හඳුනගන්නේ.

**උපාසක :-** "පෙර මතකය කියන එක කොහේ හරි ගබඩාවෙලා තියෙන්න ඕනනේ එන්න නම්"

**ආර්යයන් වහන්ස :-** පෙර මතකය කොහෙන්ද ආවේ ? එහෙම දෙයක් නැහැ මේකේ. අපි පැහැදිලි කරනකොට කෙනෙකුට එකපාරටම තේරෙන්නේ නැති නිසා එක මට්ටමකට පැහැදිලි කරනවා නම් පෙර මතකයෙන් මේ සිත හටගත්තා කියලා. එකපාරටම මුකුත් දන්නැති කෙනෙකුට කියන්නේ. නමුත් ඊළඟ අදියරට එනකොට කියනවා පෙර මතකය කියන එකක් නෑ කියලා. එතකොට එයා අතරමං වෙනවා. මේ සිත හටගත්තේ කොහොමද කියලා.

**උපාසක :-** ඔබ වහන්සේ කියනවා පෙර මතකයේ නෑ කියලා. එතන එතනම නිරුද්ධ වෙනවා කියලා.

**ආර්යයන් වහන්ස :-** එතන එතන **"අතීතං නාපග්ගමෙය්‍ය - අප්පටිකංඛෙ අනාගතා" පච්චුප්පන්න මේ ක්ෂණය දකින එකයි. සත්‍ය ධර්මය දකිනවා කියන්නේ.**

**උපාසක :-** සද්දේ එන්න නම් විශ්වයේ මේ හිස් අවකාශනේ තියෙන්න ඕන.

**ආර්යයන් වහන්ස :-** එහෙම දෙයක් තියෙන තැනක්, හිස් අවකාශයක්, සද්දයක් පෙර සද්දයක් ඒ මොකක්වත් කථාවක් නෑ. ඒ තමයි දන්නැතිකම. දැන් දෙයක් දන්නැතිකම නේද ? දන්නැත්තේ. දැන් කවදාවත් කණ්ණාඩියේ **එහා පැත්තට ගියේ නෑ කියලා හිතන්න. එයා හැමදාම කණ්ණාඩිය ඉස්සරහින් බලාගෙන ඉන්නවා. බලාගෙන ඉදලා එයා යනවා. අපි හිතමු කුරුල්ලෙක් කියලා. ඒ කුරුල්ලා කවදාවත් දන්නේ නෑ ඇතුලේ මුකුත් නෑ කියලා. එයා හිතන්නේ මේක ඝන පෘෂ්ඨයක්. ඒක ඇතුලේ ඔක්කොම තියෙනවා කියලා සත්තු ඒකයි කොට කොට දගලන්නේ. දැන් ඒ සතා කවදහරි මේක දැක්කොත් විතරයි, ඒ සතා එතන ඉඳන් දැනගන්නවා මේක ඇතුලේ මුකුත් නෑ කියලා.** අන්න එතන තමයි ඔබතුමා ඉන්නෙත්. ඔබතුමා දැන් ගොඩක් භාවනා කළානේ. භාවනා කරලා ඔබතුමා හිතනවද මේක දැනගන්න පුළුවන් කියලා. ඒ කියන්නේ මේ පෙර මතකය ආවේ කියලා. ඔබතුමා හිතනවද කවදහරි භාවනා කරලා පෙර මතකය දැනගන්න පුළුවන් වෙයි කියලා.

**උපාසක :-** මම හිතුවේ සමාධිය වඩලා, සතිය වඩලා ඒ පැත්තෙන් නිවන් මග ඇතියි කියලා.

**ආර්යයන් වහන්ස :-** සතිය කියන්නේ ලෞකික වචනයක් විතරයි. ලෞකික අභිඥාඥා වෙනයි. ලෝකෝත්තර අභිඥාඥා වෙනයි. අභිඥාඥාව කියන්නේ වචනයක් විතරයි. **ධර්මය අභිධර්මය කියනවා. ඒක ගැඹුරෙන් දකිනවා කියනවා. ඥාණය තමයි අභිඥාඥා වෙන්නේ. "ධම්ම අභිඥාඥාවක්** අපි තුල සකස් වෙලා තියෙනවා. ඒක නිසා තමයි අපි ධර්මය අවබෝධයට පත්වුණේ කියලා. ඒක තමයි අපි අනිත් අයටත් දෙන්න උත්සාහ ගන්නේ. බොහෝ අය මෙතෙන්ට ළං වීගෙන එනවා. හැමෝම මේ සත්‍ය අවබෝධ වනවිට මුකුත් හම්බවෙන්නේ නැති ස්වභාවයකට එනවා. ඒ කියන්නේ නිෂ්ක්‍රිය වන එකක් මෙතන තියෙන්නේ. 'නිවන' කියන්නේ නිවී ගිය තැනක්.

**උපාසක :-** "ඒ කියන්නේ ස්වාමීන් වහන්ස, මම අහපු ප්‍රශ්නේ සංඥා අදාලද නිවනට"

**ආර්යයන් වහන්ස :- "මේ කිසි කෙනෙක් නිවන් දකින්නේ නෑ පුබ්බේ නිවාසානුස්සති ඥාණය නැතිව. ත්‍රිවිද්‍යා නැතුව කවුරුත් නිවන් දකින්නේ නෑ. ත්‍රිවිද්‍යා ඥාණ පහළවන එක මහලොකු දෙයක් නෙවෙයි. මේ පොඩි දරුවන්ටත් ත්‍රිවිද්‍යා පහළවෙනවා. මේක ඇවිල්ලා ලොකු දෙයක් නෙවෙයි. සෝතාපන්න වෙන්නෑ කිසි කෙනෙක් ත්‍රිවිද්‍යා ඥාණ නැතුව. මේක මහ ලොකු දෙයක්.** මේ ධර්මයේ තියෙන එකක්වත් මහ ලොකු දෙයක් නෙමෙයි කියලා අපි කියනවා. හැබැයි ඒක අවබෝධ නැති එක ලොකුයි. මේ නිවන් මග හරිම සරලයි. හරි මහන්සියෙන් කන්දක් නගින්න උත්සාහ කරනවා. නැග්ගට පස්සේ එයාට කිසිම බයක් දැනෙන්නේ නැහැ. එයා දන්නවා එයා ඉන්නේ තැනිතලාවක කියලා. අර නගින්න විතරයි බය තියෙන්නේ. **බයයි, අමාරුකමයි, වෙහෙසයි ඔක්කොම තියෙන්නේ. හැබැයි උඩට නැග්ගට පස්සේ තැනිතලාව තියෙන්නේ. බයවෙන්නේ නෑ. වැටෙයි කියන බයනේ තියෙන්නේ නගිනකම්ම මේ වගේ කතාවක් තමයි උපමාවක් විදියට මෙතන තියෙන්නේ."**

"ත්‍රිවිද්‍යා කියන්නේ පුබ්බේ නිවාසානුස්සති ඥාණයයි, චුතූපපාත ඥාණයයි, ආසවක්ෂය ඥාණයයි. මේ තුන තමයි නිවන කරා ගෙනියන්නේ. **ඇත්තටම චුතූපපාත ඥාණය කියන්නේ මොහොතට අවදිය කියන එකයි. මේ සිත මේ මොහොතට අවදිවෙන එකයි. හැබැයි ඒක වෙන්නේ නැහැ පුබ්බේ නිවාසානුස්සති ඥාණය නැතුව. මේ පෙර සිත් කඳ පිළිවෙල දකින ඥාණය කියන්නේ අපි මේ සම්මුතිය තුල පොත්වල ලියලා තියෙන දේ නම් නෙමේ.** මෙතන තියෙන්නේ සිත හැදෙන හැටි. අපි ඉපදුන තැනට යන්න වෙනවා. පුංචි දරුවා ළඟට ගියාම අපි දැන් ඉපදෙනකොට මුකුත් දන්නේ නෑනේ. ඔන්න ඕක නිසා තමයි **අපි මහා නිදාන සූත්‍රය එහෙම දැම්මේ. මොකද මව්කුස විඥාඥාණයක් බැසගන්නවාද ? නැත්ද කියලා ගොඩක් අය මහා නිධාන සූත්‍රයෙන් තමයි පටලව ගන්නේ.** නමුත් එතන එහෙම දෙයක් නැති බව අපි පෙන්නනවා. විඥාඥාණය කියන්නේ සෛලවල වර්ධනය වනවිට **දැනෙන**

**ස්වභාවයයි. මේ බුදුන් වහන්සේ කියන්නෑ ප්‍රතිසන්ධි සිත් ගැන චුති සිත ගැන කථාකරන්නේ නෑ.** කවදාවත් බුදුන් වහන්සේ එහෙම දේශනා කරලා නෑ. "අභිධර්මය තුළත් නෑ මේක මේ පොත් ලියන අය දාගත්තු වචන ටිකක්"

බුදුන් වහන්සේ කියන්නේ **ඔක්ඛන්ති, ගබ්බන්ති, ගබ්බසෙය්‍යං** කියලා. ඕක වෙනයි ඒකවෙනයි. ඒකේ කියනවා නම් මේ ප්‍රතිසන්ධි සිතය චුති සිතය බැසගත්තාය මව්කුසේ ප්‍රතිසන්ධි සිත කියලා. ඒ කියන්නේ **මැරුණු කෙනා විඤ්ඤාණය දිගටම යනවා වගේ කියන්නේ.** බුදුන් වහන්සේ කියනවා මිථ්‍යා දෘෂ්ඨියක් කියලා. බුදුන් වහන්සේ සාටී භික්ෂුවට කියනවා මරණෙන් මත්තේ යන විඤ්ඤාණයක් ගැන දේශනා කරලා තියෙනවද ? කියලා. ඔය **කේවට්ධ සූත්‍රයේ තියෙන්නේ විඤ්ඤාණං අනිදස්සනං කියලා.** විඤ්ඤාණය ගැන අපි කියනවා එතන එතන ඇතිවෙලා නැතිවෙලා යනවා කියලා ඔන්න ඔබතුමා සතිය පොඩ්ඩක් තියාගන්න කියලා. ඔබතුමාට මේක ප්‍රයෝජනවත් වෙනවා. **අපි දන්නවා ගැටලු තියෙනකම්ම විචිකිච්ඡාව තියෙනවා කියලා.** මේක නිර්මලව දකින්න ඕන. බොහොම ගැඹුරු තැනක් මේ කථා කරන්නේ.

ඒ තමයි මේ පුංචි දරුවා මව් කුසෙන් එළියට එනකොට මුකුත් දන්නෑ කියන්නේ. **සංඥා පනවන්න පුළුවන්ද ? සංඛාර පනවන්න පුළුවන්ද ? ඊර්ෂ්‍යාව, වෛරය, ක්‍රෝධය මුකුත් දන්නෑ. දරුවා දන්නවා නම් ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, වෛරය තියෙනවා. දරුවා දන්නවා නම් මේක රත්තරං කියලා දරුවාට ආසාවක් එනවා. ඒත් මව්කුසෙන් එළියට එන දරුවා කොහොමද දන්නේ මේක රත්තරං කියලා. ගොඩක් අය හිතනවා මව්කුස තුල ඉන්නකොට අම්මා හිතන දේවල් දන්නවා කියලා. මව්කුස තුළ ඉන්නකොටත් අම්මා රත්තරං වලට කැමති නම් දරුවා එළියට එනකොටම රත්තරං අරන් තියන්න ඕනනේ. ඇයි මේ දරුවා පංචායුධය පොළවේ ගහලා දුවන්නේ.** එහෙනම් මේ අය කියන බණ එතකොට ගැලපෙන් නෑ. ඒ කියන්නේ මව්කුස තුළින් එන දරුවා අපි මේ කියන්නේ. **"සබ්බේ සංඛාරා" පනවන්න බෑ.**

අපි මේ කියන "සබ්බේ සංඛාරා" කියන්නේ බුදුන් වහන්සේ පැහැදිලිවම **"ජාති ධම්ම සූත්‍රය"** තුල පෙන්වනවා. "ඛන්ධානං පාතු භාවෝ - ආයතනං පටිලා භෝ අයං වුච්චති ජාති" **මහණෙනි, ඇසේ උපතයි මහණෙනි උපත. ආයතනවල උපතයි, උපත කියලා පනවන්නේ. අපේ මේ හිත පටන් ගන්න තැනටනේ. අපි මේ ගිහිල්ලා හොයන්න හදන්නේ. පෙර මතකය නම් පෙර මතකය නම් ගිය ආත්මේ ඉඳන් පුටුව එනවනේ. නෑනේ. ඇයි එහෙනම් මොන්ටිසෝරියේ උගන්වන්නේ කහපාට, රතුපාට, නිල් පාට කියලා. පෙර ආත්මයේ ඉඳලා නම් එයා දන්නෙපාය මේ කහපාට කියලා.**

**උපාසක :-** "ස්වාමීන් වහන්ස, පුනර්භවය කියන ළමයි කොහොමද ?"

**ආර්යයන් වහන්ස :-** ඒක ටෙලිපති එකක්. ඒක වෙනම මාතෘකාවක්. ඔක්කොම පටලවාගෙන බැහැ. අපි ඒක වෙනම පැහැදිලි කරනවා. මේ ඔක්කොම පැහැදිලි කරාට පස්සෙයි ඔතෙන්ට එන්න ඕන. මේක "ත්‍රීකොන්ස්" සිස්ටම් එකක්. සිරස වගේ අල්ලන එකක්. පෙර මතකය තියෙනව නම්. එහෙනම් ඉතිං ඒ දරුවා මොන්ටිසෝරි යන්න ඕන නැහැනේ. සූප්පුව කටේ ගහලා පයිලට් ජොබ් එක දීලා ප්ලේන් එකේ වාඩිකරන්න පුළුවන්නේ. එච්චර මෝඩවෙන්න එපා. **මේ ධර්මයේ කථාව හොඳින් අවබෝධ කරගන්න ඕන. එතන තියෙන්නේ සංඥා ස්වභාවයක් විතරයි.** අභිඥ්ඥා දේශනාවල අපි ඒවා විස්තර කරනවා. අපි පටලවා ගන්නේ නැතුව හිත හැදෙන හැටි ඉස්සෙල්ලා ඉගෙන ගමු. අපි මේ මොහොතේ ගත්තොත් පොත දකින සිත, බිත්තිය දකින සිත මේක මං මුලින්ම දැනගන්නේ කවද්ද ? අන්න අර මුලට යන්න වෙනවා. අන්න එතකොට මෙනෙහි කර ගියොත් පොඩිම කාලේ නෙවෙයි. අවුරුද්දක් වයස කාලෙත් නෙවෙයි. මොන්ටිසෝරි යනකොට පාට ටික දැනගන්නවා එතනත් වෙන්න බෑ. අන්න යම්කිසි **තැනකට යනවා නේද ? කැරකී කැරකී අන්න පෙර සිත් කඳ පිළිවෙල දකින්න වෙනවා නේද ? මේක දැකගන්න. අන්න එතකොට තමයි මේකට යන්නේ. අන්න බුදුන් වහන්සේ පෙන්වන තැනට එනවා. ජාතිය කොහෙන්ද ? හටගත්තේ. ජාතිය කියන්නේ පොතේ ජාතියයි, මේසේ ජාතියයි. එහෙනම් කොහොමද ජාතිය හට ගත්තේ.**

"ඇස කියන්නේ පේන බව. ඇස කියන්නේ **මස් ඇහැ** නෙවෙයි. **මැරුණු කෙනාටත් තියනවනේ මස් ඇහැ. එහෙනම් එයාටත් පේන්න එපාය. පේන බව කියන්නේ ආයතනයක කෘත්‍යයක්. 'තින්නං සංගති පස්සෝ' කියන තැන. සලායත හැදෙන්න ඕන. එහෙනම් ආයතනය කොහොමද හැදුනේ."** අන්න ආලෝකයක් වැටෙන්න ඕන. ආලෝකයත් ගසත් නිසා වැටෙන **ප්‍රතිබිම්බය** හෙවනැල්ල **"තින්නං සංඝති එස්සො"** කියන තැනට එන්න ඕන. ස්පර්ශය තමයි එස්ස. එස්ස කියන්නේ පොත ස්පර්ශ වුණේ පොත. එතකොට **ස්පර්ශ තමයි වේදනා, සංඥා, සංඛාර, විඥ්ඥාණය ස්කන්ධය හට ගන්නේ.** ස්පර්ශය කියන්නේ එස්ස කියන්නේ පොතමයි.

**උපාසක :-** ස්කන්ධ කියන්නේ පොත නම් රූප, චක්ඛු ප්‍රසාදය, චක්ඛු විඥ්ඥාණය, පොත කියලා දන්නේ නෑනේ. ඒකේ දැනීම වර්ණය ඒ තුනේ එකතුවද එස්ස වෙන්නේ, ස්පර්ශ වෙන්නේ

**ආර්යයන් වහන්ස :-** චක්ඛු විඥ්ඥාණය පොත දන්නේ නෑනේ. මොන තුනේ එකතුවද ස්පර්ශ වෙන්නේ.

**උපාසක :-** රූපයේ චක්ඛු ප්‍රසාදයේ, චක්ඛු විඥ්ඥාණයේ ඒ තුනේ එකතුවනේ ස්පර්ශය කියන්නේ. චක්ඛු විඥ්ඥාණයේදී අපි වර්ණ සටහනක් බව දැනගත්තාට එතකොට පොත කියන එක දැනගෙන නෑනේ, ඒ අවස්ථාවේදී.

**ආර්යයන් වහන්ස :-** "තින්නං සංඝති ඵස්සෝ" කියන තැනින් **මනෝ විඤ්ඤාණ හට ගනී ස්පර්ශය කියන්නේ මනසට ස්පර්ශ වෙන්නේ. එතනින් තමයි ස්කන්ධ, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ කියන්නේ. මනෝ විඤ්ඤාණයෙන් පොත කියලා හදාගන්න එක. ඒක ස්පර්ශ වුණා කියන්නේ ආයතන ටික එකට එකතු වෙන එක. ඇසට ආපු වර්ණයත්, කණට ආපු ශබ්දයත් එකට එකතු වෙන එක. ඇසට ආපු වර්ණයත්, කණට ආපු ශබ්දයත්, සීතල, උණුසුම, තදගතිය සේරම එකට එක මොහොතෙම වේගය තුළ එකටම දැනෙන එකයි මනෝ විඤ්ඤාණය කියන්නේ. වෙන අමුතු එකක් නොවේ.** ඒකයි ඔය ත්‍රිපිටකයේ හැමතැනම ස්කන්ධය ස්කන්ධ කියලා කියන්නේ. පංච උපාදානස්කන්ධයි රූපය. පංච උපාදානස්කන්ධය රූපයයි ඇසුරු කරන්නේ. පංච උපාදානස්කන්ධ රූපයේ උදය - වැය දකින්නේ. **ආර්ය කාන්ත සීලය කියන්නේ ස්කන්ධයේ උදය - වැය දැකීමයි. මේ අරමුණෝ පොත සිතට එන අරමුණේ සත්‍ය දකින එකයි ස්කන්ධයේ උදය - වැය දකින එකයි සේරම එකයි කිව්වේ අපි ඒකයි.**

එතනමයි, ස්පර්ශය කියන්නේ ඒකටමයි. එතනමයි මමත් ඉන්නේ මනෝ විඤ්ඤාණය තමයි මම කියන්නේ. පොත හැදෙන එක තමයි, ඒ සිස්ටම් එකම තමයි මම කියලා හැදෙන්නේ. දැන් එතකොට මෙතනයි බුදුන් වහන්සේ පෙන්නන්නේ 'ස්කන්ධාණං පාතිභාවෝ' කියලා. අන්න මනසට දෙයක් කියලා හැදෙන තැනයි. ආයතනානං පටිලාභෝ ඒක තමයි ආයතනය කියලා කියන්නේ. ආයතනය කියන්නේ අර **තින්නං සංඝති පස්සෝ කියන තැනයි. ඒ කියන්නේ ඇස කියන්නේ ආයතනයටයි. එතකොට අනිත් ආයතනත් ඇස, කණ, දිව, නාසය, කය ඒ ඔක්කොම ආයතන, ආයතනයක් කියෙන්නේ අර කර්මාන්ත ශාලාවක් වගේ. ආයතනයක කෘත්‍යයක් තියෙනවා. ඒ කියන්නේ එකක් නොවෙයි නිපදවීමක්.** ස්කන්ධ නම් පාතිභාවෝ කියනකොටම අර මනෝ විඤ්ඤාණයෙන් **පොත කියලා** හදාගන්න එකමයි. **"ස්කන්ධානං පාතිභාවෝ - ආයතනානං පටිලාභෝ"** අන්න ඒ **ප්‍රතිලාභය** තමයි ආයතනයෙන් හදාගත්තු පොත, ජාතිය. **"ස්කන්ධානම් පාතිභාවෝ - ආයතනං පටිලාභෝ - අයං වුච්චති ජාති"** මහණෙනි, කිව්වේ ඕකයි.

**ඔතනයි "ඉති රූපං සමුදයෝ" කියන එක.** ඔතනයි එන්නේ සමුදයේ ඤාණං කියන එක. ඉති රූපං සමුදයෝ කියන තැනට පෙර සිත් කඳ පිළිවෙල දකින ඤාණය. ඒ කියන්නේ පුබ්බේ නිවාසානුස්සති ඤාණය. මේ සිත හැදුණෝ කොහොමද ? පෙර මතකය කොහොමද ? පටන් ගත්තේ. ඔන්න ඔහොම ගියාම තමයි. එතකෙට ඔන්න ඔතන තමයි **අවිද්‍යාව. අවිද්‍යාව තමයි පොත කියලා දෙයක් හදාගන්න එක. ඒකමයි අවිද්‍යාව. එතන තියෙන්නේ වර්ණ, ශබ්ද එකතු වුණ එකක්. ඒක මනසිකාරයක්.** ඒක එළියේ කොහේවත් නෑ. ඒක තමයි අවිද්‍යාව. එළියේ තියෙනවා කියලා ගත්ත එකයි අවිද්‍යාව. **එළියේ තියෙනවා**

**කියන එකමයි අවිද්‍යාව.** මුකුත් නෑ මේකේ. තියෙන තැනක් නෑ. මේක තියෙන්නේ **අන්තරයක් ඇතුළේ. චක්ඛු ප්‍රසාදයත් අන්තරයක්.** ආලෝකයක් නැතුව පෙනීමක් නැහැනේ. පේනවා කියන එක අපි ආත්ම දෘෂ්ටියකින් බලන්න එපා. ආත්මයක් නෑ. මේක සොබාදහමයි. එහෙනම් මේ **ආලෝකය** ගැන විතරයි කතාව තියෙන්නේ. **ආලෝකය කියන්නේ මේ ආත්ම කතාවක් නෙවේ.** ශබ්දය කියන්නේ ආත්ම කථාවක් නෙවේ. එහෙනම් මේ උණුසුම, රස්නය, ශීතල ආත්ම කථාවක් නෙවෙයි. **ධර්මය ඔතනින්ම ලිහන්න ඕන.** ආයෙත් ආත්මයක් හොයන්න බැරිවෙන්න ඕන. අන්න එතකොට තමයි. "ඉති රූපං සමුදයෝ" සමුදය ඤාණං කියන තැනට, අන්න සුතමය ඤාණය කියන්නේ අන්න එතැනයි. **මේ අසා දැනගත් ධර්මය ශ්‍රවණය අවශ්‍ය වෙනවා කිව්වේ ඕකටයි.**

මේක අවබෝධඤාණයක් තුළ කවුරු හරි අවබෝධ කරගෙන ඉදිරිපත් කරනවා හැර මේක **දකින්න එළියෙන්, ඇහැට පේන දෙයක් නෙවෙයි.** එතකොට 'ස්කන්ධානං පාතිභාවෝ - ආයතනා නං පටිලාභෝ' **ජාති ධම්ම සූත්‍රයේ** තියෙන්නේ එක පේළියයි. නමුත් මේක අවබෝධ කරන්න නම් එයාට මහා නුවණක් තියෙන්න ඕන. එයාට ගලපගන්න හැකියාවක් තියෙන්න ඕන. **මදුපිංඩික සූත්‍රය, සංචේතනා සූත්‍රය, ජාති ධම්ම සූත්‍රය එකට එකක් ගලවන්න බෑ.** එකක් දන්නැතුව අනිත් එක එන්නෙත් නෑ. ඒව ඔක්කොම එකට ගලපගත්ත කෙනෙකුට විතරයි ගලපලා පෙන්නන්න පුළුවන්කම තියෙන්නේ. බුදුන් වහන්සේ පැහැදිලි කරන සූත්‍ර එතන එතන කෙනාට කෙනාට පැහැදිලි කරපු දේ වුණාට මේක අවබෝධයට පත්වෙනකොට ඔක්කොම එකයි. මේ සූත්‍ර ටික ගලපලා අපි දැනගන්න ඕන අපේ සසර ගමන නවත්ත ගන්න. සත්‍යාවබෝධ කරගන්න. ඉතිං මෙතන ඉතාම වටිනවා. මේ කියන පණිවිඩය. මෙතන '**ඉති රූපං සමුදයෝ**' කියලා කියන්නේ. දැන් ඔන්න පුබ්බේ නිවාසානුස්සති ඤාණය ගැන සැකයක් තියෙන්න බෑ.

එහෙනම් පුබ්බේ නිවාසානුස්සති ඤාණය කියන්නේ මේ සිත් කඳ පිළිවෙල ගලපලා දකින එකයි. එහෙනම් එතකොට මේ මොහොතෙත් මොකද සිද්ධ වෙන්නේ අර අතනදී මොකද සිද්ධ වුණේ. **පුංචි දරුවාට, පුංචි දරුවා මුලින් ඉපදෙනකොට මුකුත් දන්නේ නෑ. ජාතිය හටගත්තා. ඇසේ උපතයි මහණෙනි, උපත, දැන් දෙයක් දකිනකොටම අන්න එයා දකිනවා මේක රත්තරං, මේක මැණික්, මේක පොතක්, මේක මේසයක්, මේක ඇඳක්, අන්න හැම එකටම එයාට එක එක භාවිතය අනුව ඇලෙන ගැටෙන එක වෙනස් වෙනවා. මේක වැඩක් නෑ. මේක මට වැඩකට නැති එකක් කියලා. අයින් කරලා දානවා. ඒ අනුව තමයි අන්න ඇලීම, ගැටීම ඇතිවෙන්නේ. අන්න රාගය, ද්වේශය, මෝහය. මේ ඇලීම ගැටීමයි මෙතන තියෙන්නේ. "එතකොට මෙතනයි කෙලෙස් හටගන්නේ. එයාට එතකොට ගැටෙන එකට ප්‍රතිරෝධයකුත්, ඇලෙන එකට ළංකර ගැනීමකුත් සිද්ධ වෙනවා."** අන්න එතනමයි ඉරිසියාව, වෛරය,

ක්‍රෝධය, තණ්හාව දෙන්නේ නෑ කාටවත් බදාගන්නවා. පොඩි ළමයගේ හැටි එහෙම තමයි. ඒක තමයි මේ ස්වභාවය. **ප්‍රාසවීය ස්වභාවය** තමයි ආස්‍රවවලට හේතු වෙලා තියෙන්නේ. **ඒ කියන්නේ අපේම අභ්‍යන්තරයෙන් මව්කුස තුලම සෙල වර්ධනය, යුක්‍රානුවේ ඉඳන්ම ඇවිල්ලා තියෙනවා. මේ ප්‍රාසවීය** ස්වභාවය. ඇලෙන ස්වභාවය සෙලවලට තියෙනවා. ඔව් **කොහොල්ල** ස්වභාවය. ඒ සොබාදහම වේගය තුළ **ගිනි වළල්ලක් ජේන්නේ සොබාදහමනේ.**

එතකොට මේ සිත් කඳ පිළිවෙල. දකිනකොට එයාට තේරෙනවනේ. පොඩි ළමයට කසාද බඳින අදහස් එන්නේ නෑනේ. පුංචි දරුවට ආදරය කරන හැඟීම් එන්නේ නෑනේ. පුංචි දරුවට මේ සේරම එකතු වෙලා ඒව ඒව නැවත නැවත **"රූපං රූපත්තාය අභිසංකතං අභිසංකරෝති"** පුංචි දරුවාගේ මෙතන මේ අවිද්‍යාවෙන් දෙයක් කරගත්ත එකනේ. ගත්තේ සංඛාරා නිසයි. **ශබ්ද, වර්ණ එකට එකතු වෙන එකයි.** අන්න සංඛාරා, අන්න අවිද්‍යාව. අවිද්‍යාව කියන්නේමයි සංඛාරා කියලා පෙන්නන්නේ. **ශබ්ද, වර්ණ එකතු කරලා දෙයක් කරලා පෙන්නන්නේ සංඛාර. එතකොට ඒකමයි අවිද්‍යාව. මේක ඉස්සෙල්ලා අවිද්‍යාව, පස්සේ සංඛාර ද කියන්න බෑ. සංඛාර එක්කමයි අවිද්‍යාවත් තියෙන්නේ. ඒකයි මේ අවිද්‍යා පච්චයා සංඛාරා ප්‍රත්‍යාලෝමිකයි කියන්නේ. අන්න දෙපැත්තට මේක වෙන්කරන්නබෑ.** අවිද්‍යාවමයි සංඛාර. අවිද්‍යා පච්චයා සංඛාරා කියලා පොතේ ලියනකොට මේ එක ධර්මයක්වත් පේළියට ලියන්න බැහැ.

"ඒකට හේතුව සංඛාරමයි අවිද්‍යාව දෙයක් කියලා ගන්න එක. එහෙනම් සංඛාර හටගන්නේ නාම - රූප නිසයි. නාම - රූප කියන්නේ ශබ්ද - වර්ණ එකතුවෙන එකයි." ඒකමයි එතකොට අවිද්‍යා පච්චයා සංඛාර - සංඛාර පච්චයා විඤ්ඤාණ දැනගැනීමයි. **දැනගැනීම සංඛාරමයි. ඇයි පොත කියලනේ දැනගත්තේ. පොතමයි සංඛාර, පොතමයි නාම - රූප එකතුවෙන එක. ඒකමයි අවිද්‍යාව, ඒකමයි සලායතන, ඒකමයි ස්පර්ශය කියන්නේ, ඒකමයි එතකොට ස්කන්ධය කියන්නේ ඒකමයි. එතකොට තණ්හාව. දෙයක් කියලා ගත්තොත් තමයි අන්න උපාදාන, ජාති, ජරා, මරණ, ශෝක, පරිදේව සේරම තියෙන්නේ. අන්න "ඉති රූපං සමුදයෝ" රූපය ඇත්ත කරගත්ත එකයි, දෙයක් කරගත්ත එකයි. භවය කියන්නේ පොතමයි. පොත තියෙනවා, මේසෙ තියෙනවා, ඇඳ තියෙනවා ඔය තමයි භවය. දෙයක් තියෙනවා කියලා ඒක තණ්හාව, දෙයක් තියෙනවා කියලා ඇලෙනවා ඒක දන්නෑ. ඒකමයි උපාදානය අල්ලගත්ත එක.**

**එකක් උඩ එකක් ලියන්න ඕන කියලා පටිච්චසමුප්පාදය අපි කිව්වේ ඒකයි. ඔක්කොම එකමයි. ඔක්කොම අරමුණමයි.** ඔක්කොම පොතමයි. මේ ක්ෂණ සම්පත්තිය කියන්නේ මේක අවබෝධ කරන එකයි. මේ ක්ෂණය දකින එකයි කිව්වේ ඕකයි, ඕකයි ක්ෂණ සම්පත්තිය. පුබ්බේ නිවාසානුස්සති ඤාණය

නැතුව, චුතූපපාත ඤාණය ඇතිවෙන්නේ නෑ. **ඒ කියන්නේ මේ සිත හටගන්න හැටි දැක්කොත් විතරයි නැතිවෙන්නේ. ඒ නැතිවීම තමයි. 'ඉති රූපං අත්තගමංච' කියන්නේ. ඉති රූපං සමුදයෝ කියන්නේ හිත හැදෙන හැටි** දකින්න ඕන. ඒ දැක්කොත් විතරයි. "ඉති රූපං අත්තගමංච" කියන්නේ.

**උපාසක :-** අත්තගමංච කියන එකේ සිංහල තේරුම

**ආර්යයන් වහන්ස :-** වය ඤාණය කියන්නේ **අත්තගමංච. සිත අත්හැරෙන එක. අල්ලගන්න එකනේ සමුදය. අතහැරෙන එකනේ අත්තගමංච.** දැන් මහෝපදේශ 04 ට ගත්තත්, චතුරාර්ය සත්‍ය ගත්තත් මෙතන **සමුදය** කියන්නේ පොත කියන එකයි. පොත ඇත්ත කරගන්න එකයි. පොත තිබ්බොත් "සමුදය" තියෙනවා. දුක තියෙනවා. සමුදය තිබුණොත් තමයි පොතක් තියෙන්නේ, ඇලෙන්නේ, ගැටෙන්නේ. ජාති, ජරා, මරණ, ශෝක, පරිදේව පොතක් තිබුණොත් තමයි තියෙන්නේ. එහෙනම් එතන දුක තියෙන්නේ. **සමුදය සත්‍ය** තිබෙන තැන තමයි දුක තියෙන්නේ. **දුක්ඛ, සත්‍ය තියෙන්නේ.** ඒකේ ඇත්ත දැක්කොත් තමයි "ඉති රූපං සමුදයෝ" කියන තැන අන්න ඇත්ත දැක්කොත් **නිරෝධය තියෙන්නේ අත්තගමංච. අන්න ඒ දැකීමයි මාර්ග සත්‍යය කියන්නේ. එහෙනම්, දුක්ඛ සත්‍යය, සමුදය සත්‍යය, නිරෝධ සත්‍යය, මාර්ග සත්‍යය තියෙන්නෙත් මේ එන අරමුණේමයි.** මේක කවදාවත් භාවනා කරලා ගන්න බෑ. බුදුන් වහන්සේගෙන් භික්ෂුවක් අහනවනේ 4 වෙනි ධ්‍යානයට සමවදින්න ඕනෙද? ස්වාමීනී විදර්ශනා කියලා. බුදුන් වහන්සේ කියනවා **ඕනෑම චිත්ත ඒකාග්‍රතාවෙකින් විදර්ශනා වැඩිය හැකියි 'මහණෙනි' කියලා.**

(මේ දේශනාවේ ඉතිරි කොටස මොහොතට අවදිය 4 හා සම්බන්ධයි)

# 4 වන දේශනය - මොහොතට අවදිය

**(සත්‍ය ධර්මය අවදිවිය)**

**ආර්යයන් වහන්ස :-** අළුතින් එන තරුණයෙකුට මේ සත්‍ය කියලා දෙන්න පුළුවන්. මේවා ඇතුලේ පල්වෙච්ච අයට මේක කියලා දෙන්න අමාරුයි වටහාදෙන්න. අර පස්වග තවුසන්ට වගේ අත්හැර ගන්න බෑ. අපි කියන්නේ දෙයක් හොඳයි, කිව්වොත්නේ ඒකේ ආදීනව පේන්නේ. එතකොට එයාට කියන්න ඕන නෑ. එයාට ප්‍රතක්ෂතාවයෙන්ම එනවා මේක වෙන්නෑ කියලා. අපිට එහෙමනේ ප්‍රත්‍යක්ෂ වුනේ භාවනාවෙන් වෙන්නෑ කියලා. අපි ධර්මයට එමු. අපි දැන් රූපය දැක්කා. රූපය හැදෙන හැටි ඉති රූපං සමුදයෝ ඒක දැක්කොත් "ඉති රූපං අත්තගමංච අන්න ඒක **දැක්කට පස්සේ රූපය බොරුවක් බව දැකලා රූපයෙන් මිදෙනවා. අතහැරෙනවා. අන්න එතන තමයි උදය - වැය ඤාණය තියෙන්නේ.** එහෙනම් මේ උදය - වැය ඤාණය කියන එක ඔන්න කාටවත් මේ සිත ඇතිවෙනවා නැතිවෙන්නේ නෑ, මේ ධර්මය දකිනකම්. මේ ධර්මය දකිනකම් **දර්ශන ඤාණය ඇතිවෙනකම්, සෘතමය ඤාණය ඇතිවෙනකම්.** ඒකයි බුදුන් වහන්සේම දේශනා කරන්නේ "**ආනන්දය, යමෙක් මේ දර්ශනය අවබෝධ කරයිද ? ඒ හිමාලය පර්වතය වගේ කෙලෙස් නැතිවෙනවා. ආනන්ද හාමුදුරුවන්ගෙන් බුදු හාමුදුරුවෝ අහනවා මේ අතේ තියෙන ගල් කැටයද ලොකු හිමාලය පර්වතයද ලොකු කියලා. ආනන්ද හාමුදුරුවෝ කියනවා ස්වාමීනි, නොසැලිය හැකි තරම් කුඩයි මේ ගල් කැටය, හිමාලය පර්වතය කොයිතරම් විශාලද ? අපට වැටහෙනවා දර්ශනයට පත් වුණොත් අපට මේ ගල්කැටේ වගේ පොඩ්ඩයි නේද ඉතුරුවෙලා තියෙන්නේ** කියලා."

"මේක සම්පූර්ණයෙන්ම නැතිවෙන්නේ අවබෝධයෙන් නේද ? ඇත්තටම අපට ධර්මය පැහැදිලි කරනවා කියලා කරන්න තියෙන්නේ **මේ දර්ශනය අවබෝධ කරලා දෙන එක විතරයි.** කළ්‍යාණ මිත්‍රයා කරන්නෙත් ඔය දර්ශනය පැහැදිලි කරලා දෙන එක විතරයි. **එයාට ඊට පස්සේ දකින දකින හැමදේම පේන්න ගන්නවා, ඇත්තක් නෙවෙයි කියලා. අන්න ඒක තමයි සිතට එන අරමුණේ සත්‍ය දකිනවා කියන්නේ.** කලින් මහත්තයෙක් ඇහුවා සිත දකින්නේ කොහොමද ? කියලා. අපි කිව්වා සිත දකින්න නම් ඔබතුමා ඊට කලින් **ධර්මය** දකින්න ඕන කියලා. බුද්ධ දර්ශනය දකින්න ඕන කියලා. මෙන්න මේ දර්ශනය තුළින් තමයි සිත දකින්නේ කියලා. ඊට පස්සේ අපෙන් අහනවා **දර්ශනය කොහොමද දකින්නේ කියලා. ඒකට නම් ධර්ම ශ්‍රවණය කරන්න සිද්ධ වෙනවා. දර්ශනය දැකපු කෙනෙකුට විතරයි එය දේශනා කරන්න පුළුවන්. එයාට දර්ශනය පැහැදිලි කරාට පස්සේ එයාට අවබෝධයක් ඇතිවෙනවා මේ ලෝකේ එකක්වත් ඇත්තක් නෙවෙයි කියලා. අන්න ඊට පස්සේ එයාට එන එන**

**අරමුණ පේන්න ගන්නවා. ඊට පස්සේ මුලින් එහෙනම් අරමුණ දකින්න උත්සාහ කරාවි. අන්න එතකොට තමයි හිත දකිනවා කියන්නේ."**

මුස්ලිම් කෙනෙක්, ක්‍රිස්තියානි කෙනෙක් බුද්ධ ධර්මය ගැන දන්නේ නෑ. හැබැයි මේ සිත දකිනවා කියන එක අපිට ඇහෙනවා. එහෙනම් අපිත් නිවන් දකින්න එපාය. "එතකොට අපි කියනවා **පුරාණය අතේ තියාගෙන සිත දැකලා නිවන් දකින්නේ නෑ කියලා."** ඊකට හේතුව ඔබතුමාගේ හිතේ තියෙන්නේ දෙවියෝ ලෝකේ මැව්වා කියලා. **මේකේ 'ධම්ම චක්ඛුෂය' අවදිවෙන්නේ. ඇත්තටම 'ධම්ම චක්ඛුෂය' අවදිවෙන්නේ අභ්‍යන්තරයෙන් තමන්ට දැක්මක් ඇතිවෙනවා මේ හැමදේම සත්‍ය දකින එකක් සිද්ධවෙනවා. ඊකටයි සත්‍ය ඤාණය කියලා කියන්නේ. සත්‍ය ඤාණය ඇතිහුටයි 'කෘත්‍ය ඤාණය තියෙන්නේ' කියලා කිව්වේ. මේ සත්‍ය ඤාණය නැතිකෙනාට සිත දකිනවා කියලා දෙයක් වෙන්නේ නැහැ.** සිත දැකීම කියලා දෙයක් වෙන්නේ නැහැ එයාට."

"මෙන්න මේ උදයව්‍යය ඤාණය කියන එක ඤාණයට හසුවෙනවා කියන්නේ **තමන්ට මේ සත්‍ය අවබෝධ වෙනකොටම එනවා සුතමය ඤාණය කියන එක. සුතය වෙනයි, ඤාණය වෙනයි. ඔබතුමාට තේරෙනවා යමක් අර පිහිය මුවහත් තිබ්බ වගේ. අන්න ඔබතුමාට ලෝකෙන් මිදීමක් ඔබතුමා තුළ සිද්ධවෙනවා.** ඊකයි කිව්වේ බුදුන් වහන්සේ හිමාලය පර්වතය වගේ කෙලෙස් නැතිවෙනවා කියලා. ඊක හිතලා කරන එකක් නෙවෙයි. **ඉබේම සිද්ධවෙනවා. මේ කෙලෙස් හිතලා නැතිකරන්න බෑ. තණ්හාව හිතලා නැතිකරන්න බෑ. හැබැයි ඇත්ත දකිනකොට අන්න තණ්හාව ක්ෂය වෙනවා. අන්න "අවිද්‍යා අසේස විරාග නිරෝධෝ" කියන්නේ, අවිද්‍ය කියන්නේ ඇත්ත නොදන්නකම,** අවිද්‍ය තියෙනතාක්කල් තණ්හාව නැතිවෙන්නේ නැහැ. අවිද්‍ය කියන්නේ පොත. බලාගෙන ගියාම **"අවිද්‍යා අසේස විරාග නිරෝධෝ"** කියන්නේ අවිද්‍යාව අවශේෂයක් නැතිව **නිරෝධයක් දකින කෙනා** නිවන් දකිනවා කියන එක. ඊකයි දස සංයෝජනවල අන්තිමට අවිද්‍යාව තියෙන්නේ.

**උපාසක :-** ආර්යයන් වහන්ස පටිච්ච සමුප්පාදයේ කියනවනේ තණ්හාව තමයි මුල් වෙන්නේ කියලා

**ආර්යයන් වහන්ස :-** දැන් පොඩි දරුවාට ඔය ප්‍රශ්න නෑනේ. බිත්තිය දිහා හරි, මොකක් හරි දිහා බලාගෙන හරි, පොඩි දරුවට රත්තරං බඩුවක් දුන්නත් ඇති පොළවේ ගහන්නේ තණ්හාව නැති නිසානේ. "ඇයි ඒ" **මේක මේ දෙයක් කියලා දකිනකොට, ශබ්ද වර්ණ කියලා මේකට ඇලෙන ගැටෙන ස්වභාවයට එන එකනේ මේ තණ්හාව. "ඒ ඇලෙන ගැටෙන ස්වභාවයටයි අපි කියන්නේ තණ්හාව කියලා"** හැබැයි මේකේ ඇත්ත දැනගත්තම වෙන්නේ මොකක්ද ? **අර**

**පොඩි දරුව වගේ සේරම දේවල් වෙනදා විදියටම පේනවා, සාමාන්‍ය විදියටම වෙනදා විදියටම පේනවා. කනවා, බොනවා, වැසිකිලි යනවා, මූලික කෘතයන් ටික වෙනදා විදියටම කරන දේවල් එකක්වත් නවතින්නේ නැහැ. නමුත් අවබෝධයෙන් අර කණ්ණාඩියේ දෙයක් නැති බව අවබෝධයි වගේ, ඇත්ත ලෝකෙත් දෙයක් නැති බව අවබෝධයට පත්වෙනවා.**

**උපාසක :-** "අර අම්මා සෙල්ලං ගෙදර ඉන්නවා වගේ"

**ආර්යයන් වහන්ස :-** ඔව්, ඇත්තටම කණ්ණාඩියේ දෙයක් නෑ කියලා අපට අවබෝධයක් තියෙනවනේ ඒ උපමාව. ඇත්ත ලෝකයෙන් දෙයක් නැති බව අපට අවබෝධ වෙනවා. අන්න **"සංඛිත්තේන නිබ්බිදාය" කියන්නේ අවබෝධයෙන් නිවන් දකිනවා කියන්නේ ඒකයි. මෙයාගේ නැති වුණේ මොකක්ද ? වෙනදා විදියටම පේනවා. වෙනදා විදියටම ඇහෙනවා ඒකට තිබුණ ඇලෙන ගැටෙන ස්වභාවයයි නැතිවෙන්නේ."** තණ්හාවයි නැති වෙන්නේ. **"තණ්හක්කයෝ නිබ්බාණෝ" කියන තැනට එනවා තණ්හාවයි නැති වෙන්නේ, ඡන්ද රාගයයි දුරුවෙන්නේ. වණී හැඩතල ඒ විදියමයි. චිත්‍රය වගේ පේන්නේ. වෙනදා විදියටම ශබ්ද ඇහෙනවා. හැබැයි ගින්නක් නැහැ."** මරාගන්න යන්නේ නෑ. හොරකම් කරන්න යන්නේ නෑ. වටිනාකමක් නැති ස්වභාවයට එනවා. මේකේ කරන්න තියෙන්නේ එකම එක දෙයයි, **ඇත්තටම දර්ශන අවබෝධ කරගන්න එක විතරයි.** ඉතුරු ටික අපි කාලයක් තිස්සේ "රූප රූපං රූපත්තාය" අභිසංකරණයකට ලක්වෙල, සංඥා අභිසංකරණයකට ලක්වෙලා සංඥාව කියන්නේ අරමුණනේ. නැවත නැවත ඒවා දැකලා දැකලා දැකලා හුරුව තුලයි අපට දැන් ඒවා පේන්න ගන්නේ. චිත්තය නැතිවෙන තැන තමයි කෘත්‍ය ඥාණය තියෙන්නේ. ඒක අනිත් පැත්තට දකින්න දකින්න දියවීගෙන යනවා. ඒකයි මේක වයිබ්‍රේෂන් එකක් ධ්වනියක් කියලා කිව්වේ.

දැන් ඔන්න ඔබ ගොඩක් දුරට ක්‍රමයකට ඇවිල්ලා "දැන් ඉතිං ගලපගන්න එක ඔබතුමාගේ අතේ. **හදපු පාරු නෑ මහණෙනි, පාරුව සාදාගෙනයි යා යුත්තේ කිව්වේ"** ඕකටයි. එදිනෙදා කටයුතු කරනු ලබන අත්දැකීම් හුරුපුරුදු එක්ක ගලපන්න. **ගලපාගෙන මේ සත්‍ය දකිනවානම් ඔබ අන්න නිවන්මග කටයුතු කරන කෙනෙක්. කෘත්‍ය ඥාණය තියෙන්නේ.** කෘත්‍ය ඥාණය තියෙන්නේ එදිනෙදා කටයුතු කරන ආකාරය. ප්‍රායෝගිකව පුහුණු වෙන ආකාරය. හොඳයි, එහෙම වුණොත් ඔබතුමාගේ අවසානය කුමක්ද ? **"කෘත්‍ය ඥාණය කියන්නේ මිදීම"** දැනෙන්න ගන්නවා. මේක හරි සුන්දර කථාවක් නේද ? දැන් අපිට තේරෙනවා අවුරුදු 7 විශාඛාව මේ ලෝකේ සත්‍ය දකිනවා. විශාඛාව කියන්නේ සිටු දියණියක් ව්‍යාපාරිකාවක්. බලන්නකෝ විශාඛාව, ගිහි ජීවිතේ මේකට බාධාවක් නෙවෙයි. "මේක සාමාන්‍යයෙන් ඕනම කෙනෙකුට හිතක් තියෙනවා නම් **රෙදි මොනවාද ? ඇඳන් ඉන්නේ, සුදු රෙද්දද ? කහ**

**රෙද්දද ? කළු රෙද්දද ? ඇඳන් ඉන්නේ, ඔය එකක් වත් අදාළ නෑ මේ සිතෙන් මිදෙනකොට"** ඒ සිතේ මිදීමකුත් තියෙනවා ඒ සිතේ සත්‍ය දකිනවා නම් කොහේ හිටියත්, ගල් ගුහාවක හිටියත්, මහා ප්‍රාසාදයක හිටියත්, ජේතවනාරාමේ වගේ රත්තරං එලලා තිබ්බත් ඒ සිතේ ඒකට හැඟීමක් නැත්නම් ඒක වැඩක් නෑ."

**උපාසක :-** "ඉතිං ස්වාමීන් වහන්ස, මොනවා කරත් යන්තම් හැඟීමක් තියෙනවානේ ඒකට. මම ඉන්නවා කියලා හැඟීමක් එනවානේ. මේ මාර්ගය තුළ ගමන් කරනකොට භාවිතා කරන වචනවලත් මම කියන එක භාවිතා නොකර ඉන්නේ කොහොමද ? ස්වාමීන් වහන්ස,"

**ආර්යයන් වහන්ස :-** වචනයක් කියනකොට එයාට ඒක වැඩක් නෑ කියලා තේරෙනවා. "නමුත් කියනවා එයාගේ **වචනය බලගැන්වෙන්නේ නෑ අභ්‍යන්තරයෙන්."** අනිත් අයට ඇත්ත වුණාට එයාට ඒක වැඩක් නෑ. **නිර්වාණය මේ මොහොතෙමයි, ආයි පස්සේ කියලා දෙයක් නෑ.** දකින සිත මේ මොහොතේ මිදුන නම් එතනමයි නිවන. බුදුන් වහන්සේ දේශනා කළේ **"තන්ත්‍ර තන්ත්‍ර විපස්සති"** කියලා. බුදුන් වහන්සේ දේශනා කරන්නෑ, අන්තිමට නිවන් දකින එකක්. බුදුන් වහන්සේ **කියන්නේ මේ** අහන මොහොතෙම නිවන් දකින එකක් සාන්දිට්ඨික ආකාලික ධර්මයක් මේකෙ කාලයක් නෑ. **මේ මොහොතේ නම් අවබෝධ වුණේ ඒ සිතින් මිදුනා කියන්නේ ඒ සිතින් නිවන් දැකලා තියෙන්නේ.** එයා නිවන් දකිනවා නම් එන එන සිත නිවන් දකිනවා නම්, අර කියනවානේ **'පටිනිස්සග්ගානුපස්සති' කියන්නේ,** දැන් තේරුණාද ?

**උපාසක :-** මුලින් පුහුණු වෙන්න ඕන නේද ? නිතර නිතර,

**ආර්යයන් වහන්ස :-** එක පාරම වෙන්නෑ. හිත විසිරෙනවා. හැබැයි එයා, ඒ ඇත්ත දැනගත්තට පස්සේ **"නියත සම්බෝධිපරායනයි"** දුගතියකට වැටෙන්නේ නෑ. එයා නිවන් දකිනවමයි. එයාට වෙන සංඥා නෑ. සංඥාව කියන්නේ එයාට බොරුවක්මයි. එයාට එන හැම සංඥාවක්ම දකින්නේ ලෝකය ඇත්තක් නොවන බව. මේ එළියේ තියෙන ලෝකයක් නෙමෙයි, **හිතේ තියෙන ලෝකයක් කියලා. ඒ කියන්නේ සෝතාපන්න කෙනා නැවත පෘථග්ජන භූමියට වැටෙන්නේ නෑ. ඒකට හේතුව තමයි එයා පටිසෝතයට ඇවිල්ලා තියෙන්නේ. එයා ලෝකේ ඇත්තක් නෙවෙයි කියලා දකිනවා.** හැබැයි පෘථග්ජන කෙනෙකුට මේ ධර්මය කිව්වොත් එහෙම, මේ ලෝකය බොරුවක් කියලා එයා පිළිගන්නෑ. එයා කියයි ඔයා කියන්නේ මොකක්ද ? මේ අල්ලලා බලන්න මේ ලෝකය තියෙන්නේ කියලා. **හැබැයි ධර්ම අවබෝධ වූ කෙනෙකුට කිව්වොත් අල්ලලා බලන්න කියලා එයා අහවි ඔයාට තියෙනවද ලෝකයක් එහෙනම්, මට නම් ඒ දෙයක් දැනෙන්නේ නෑ කියලා.** එයාට ලෝකයක් තියෙනවා කියලා කියන්න, පෙන්නන්න පුළුවන්. අරයට ලෝකයක් නෑ කියලා

පෙන්නන්න බෑ. **ඒකයි අනුසෝතයෙයි. පටිසෝතයෙයි වෙනස. මාරුවෙනවා දෙපැත්ත.**

**උපාසක :-** අපි මෙහෙම කිව්වොත්, පිස්සෝ ගානට ගණන් ගන්නේ. කථා කරොත් පිස්සුද කියලා අහයි.

**ආර්යයන් වහන්ස :-** "ඒ කථා කළොත් නේ." කිව්වොත් නේ, නොකිව්වොත් කවුරුත් දන්නෑනේ. දැන් අපි ඉන්න තැන්වල කිසි කෙනෙක් දන්නේ නෑනේ. ඊට වැඩිය හොඳයි මෙහෙම ඉන්න එක. මේ තරම් නිදහසක් කොහේවත් නෑ. හරි සුන්දරයි. **ඒකනේ බුදුන් වහන්සේ අන්ධ වනයට වැඩියේ ඇත්තටම අධ්‍යාත්මික කිසිදෙයක් නැති තැනයි අන්ධ වනය කියන්නේ.** මෙය ඉතිං අපි විග්‍රහ කළොත් වැරදියට අල්ලන්න පුළුවන්. දැන් අපි මේ කථා කරන්නේ මොහොත ගැනනේ. **දැන් ඒ අවදිය තුල කිසිම දෙයක් නෑනේ**. දැන් අපට මේ ඇහෙන දේවල්, පේන දේවල් ඒ කිසිම දේක වටිනාකමක් නෑ කියන්නේ හැමදේම තියෙද්දී එයාට **අවදියක් ඇතිවෙනවනේ හීනෙන් නැගිට්ට වගේ** අන්න අවදිය, මොහොතට අවදිය. ඇත්තටම මේ ධර්මය අවබෝධ වුනාට ඔබතුමාට මේ විදියට පත්තියං වුනාම **පැවිදි වුණා වගේ. මොකද භික්ෂුව කියන්නේ, මේ සත්‍ය දකින කෙනා භික්ෂුවක්. අර බුදුන් වහන්සේ ඒහි භික්ෂුභාවයෙන් පැවිදි කරන්නේ, උපසම්පදාව දෙන්නේ, මේ චීවරය දරාගන්න කියන්නේ, අන්න ඒ කෙනාටයි. මේ තමයි ස්වභාදහමෙන් පිරිනමන සැබෑම භික්ෂුත්වය.** ඒ කියන්නේ සිතට එන අරමුණෝ සත්‍ය දකින කෙනාට ඒක "භික්ෂු සූත්‍රය" තුල බුදුන් වහන්සේ පෙන්නනවා. 'සත්තට්ඨාන කුසල සූත්‍රය' තුළ පෙන්නනවා. 'ඉති රූපං - ඉති රූපං සමුදයෝ', 'ඉති රූපං අත්තගමංච', සමුදය ඤාණය තියෙනවා නම් අර බුදුන් වහන්සේ දේශනා කරපු සමුදය දකීද ? අත්තගමය දකීද ? ආස්වාදය දකීද ? ආදීනව දකීද ? නිස්සරණය දකීද ? ඒ භික්ෂුවක්. නැත්නම් බුදුන් වහන්සේ කියනවා යමෙක් **සමුදය, අත්තගමය, ආදීනවය, නිස්සරණය ආස්වාදය නොදකී ද ? ඒතාක් ඔහු භික්ෂුවක් නොවේ කියලා.**

එතකොටත් අපට පැහැදිලි වෙනවා, මේ ආස්වාදය, ආදීනවය සත්තට්ඨාන කුසල සූත්‍රය තුල පැහැදිලි කළා, ආස්වාද, ආදීනව, නිස්සරණ කියන්නේ මේ දෙයක් කියලා ගත්තොත්. ඒකෙ ආස්වාදයක් තියෙනවා. දෙයක් කියලා ගැනීමමයි. **ආස්වාදය** එතකොට දෙයක් නැතිබව දැකීමමයි **ආදීනව** දකිනවා කියලා කියන්නේ දෙයක් **නැතිබව දකින එකයි.** එතකොට එහෙනම් **නිස්සරණය තියෙන්නේ එහෙම දැක්කොත් විතරයි.** ආස්වාදය, ආදීනව, නිස්සරණය කියන්නෙත් මේකමයි. මේ පැහැදිලි කරපු ධර්මයමයි. දැන් මේ අරමුණෝ සත්‍ය දකිනවා කියන්නේ ඒකමයි. "ස්කන්ධයේ උදය - වැය දකිනවා කියන්නෙත් මේකටයි. **එහෙනම් උපාදානස්කන්ධයෙන් මිදෙන සීලය කියන්නේ මේකමයි. එහෙනම් ආර්ය කාන්ත සීලය කියන්නෙත් මේකටමයි.** එහෙනම්

**ආර්යයන්** කියලා කියන්නේ **අරියානන්දස්සාවි** කියන්නේ මේ දර්ශනය දකින කෙනාටයි."

**"අරියධම්මේසු - කෝවිදෝ"** කියන්නේ මේ දර්ශනය. දකින්න දක්ෂ කෙනාටයි. **"අරියධම්මේසු - විනයෝ"** කියන්නෙත් මේ දර්ශනය **මේ ආර්යය විනය කියලා කියන්නේ එන එන අරමුණේ සත්‍ය දැකලා මිදෙන විනයටයි.** විනයක් අභ්‍යන්තරයෙන් එනවා. '**සංවරත්තේන සීලං**' කියන තැනට එනවා අරියානන් දස්සාවි, අරියධම්මේසු කෝවිදෝ. "අරිය ධම්මේසු කෝවිදෝ" කියන්නේ අන්න ඒ කෙනා තමයි **ආර්යයන් වහන්සේ නමක් කියන්නේ.**

අන්න දැන් ඔබතුමා ඔය අවබෝධයට පත්වෙලා **ඔය විදියට දකිනවානම් ඔබතුමන් ආර්යයන් වහන්සේ නමක් බවට පත්වෙනවා.** මේ තමයි සැබෑම උපසම්පදාව, මේ තමයි සැබෑම භික්ෂුව, **ශ්‍රමණ සූත්‍රය** තුළ පෙන්නන **සැබෑම ශ්‍රමණයා.** බුදුන් වහන්සේ ඒකයි **ඒහි භික්ෂුභාවයෙන් පැවිද්ද උපසම්පදාව දුන්නේ** දරාගන්න කියලා කියන්නේ එතකොට. ඒ තමයි සැබෑම භික්ෂුත්වය **මෙතනයි බුද්ධ ශාසනය. ශාසනය කියන්නේ හිතේ ආත්මීය ස්වභාවය ගිලිහෙන තැනයි. ඒ ශූන්‍යතාවයයි. එන එන අරමුණ** ශූන්‍යයයි. අනිමිත්තයි, නිමිති නැහැ. "ශූන්‍යතයි, අනිමිත්තයි, අප්‍රණීතයි. අනිමිත්තයි, පොත, මේසෙ, ඇඳ කියලා නිමිති නැහැ. අන්න එතන **අනිමිත්තයි, ශූන්‍යතයි.** අන්න එතන ආත්ම කතාවක් නෑ. අප්‍රණීතයි. **අන්න 'චේතෝ විමුක්තිය', 'චිත්ත විමුක්තියට'** පත්වෙනවා. සිතින් මිදුනු තැනට එනවා. **අන්න ඒ ස්වභාවය බුද්ධ ස්වභාවයයි. ආත්මීය ස්වභාවය ගිලිහුනු තැනයි බුද්ධ ස්වභාවය තියෙන්නේ.** බුද්ධ ස්වභාවය කියන්නේ ගහක කොළක තියෙන එකක් නෙවෙයි. සත්වයාගේ ආත්ම දෘෂ්ඨිය ගිලිහුනු තැන බුද්ධ ස්වභාවයට පත්වෙනවා. එතන ශූන්‍යය ස්වභාවය කියන්න බැහැ." දැන් මේ ශූන්‍යතාවය තුල හැමදේම තියෙනවා. මුකුත් නැතිවෙලා නෑ. වෙනදා විදියටම පේනව. වෙනදා විදියටම ඇහෙනවා. මේක **අවබෝධ ඥාණයක්. අන්න ඒ අවබෝධ ඥාණයටයි** බුද්ධ කියන්නේ.

**උපාසක :-** දැන් ඒ මොහොතේ ඉඳලා මුලාවට පත්වෙන් නෑ. එක්කහු වෙන් නෑ.

**ආර්යයන් වහන්ස :-** එතන **බුද්ධ ස්වභාවය දකින එකයි. "නත්ථි මේ සරණං අඤ්ඤං - බුද්ධෝ මේ සරණං වරං."** මේ දුක තියෙන්නේ සිතුවිලි ඇත්ත කරගත් නිසයි. මේ සිතුවිලි වල සත්‍ය දකින තැනයි, අපට වෙන සරණක් නෑ. සරණ තියෙන්නේ. **අන්න අපි දුකෙන් මිදෙනවා.** නත්ථි මේ සරණං අඤ්ඤං - බුද්ධෝ මේ සරණං වරං. බුදුන් සරණ හැරවෙන සරණක් නෑ. මේ බුද්ධ කියන්නේ සත්‍යාබෝධය කරන වෙලාවේ වෙන සරණක් නෑ කියන එකයි. ධර්ම දකින්න ඕන ඒක දකින්න. ධර්මය කියන්නේ **"ඉදප්පච්චතාවය" දෙයක් නැති බව**

**"ඉමස්මිං සති ඉදං හෝති - ඉමස්මිං අසති ඉදං නහෝති**
**ඉමස්මිං උප්පාදා ඉදං උප්පජ්ජති - ඉමස්මිං නිරෝධා ඉදං නිරුජ්ජති"**

පටිච්ච සමුප්පාදේ සුධම්මං" කිව්වේ ඒකමයි **දෙයක් නැති බව දකින එකයි.** අපි හිතන දේවල් බාහිර නෑ. දෙයක් නැතිබව දකින ධර්මය කියන්නේ. **"නත්ථි මේ සරණං අඤ්ඤං - ධම්මෝ මේ සරණං වරං" කියන්නේ දෙයක් නැති බව දකින එකයි.** එහෙනම් අපිට වෙන සරණක් නෑ. **ධර්මය දකින්න තියෙන්නේ "ධම්මං විනානත්ථි පිතාචමාතා" කිව්වේ** ධර්මය විනා **මවෙක්ද, පියෙක්ද, නැත කිව්වේ ඒකයි. "නත්ථි මේ සරණං අඤ්ඤං - සංඝෝ මේ සරණං වරං" කිව්වේ** සංඝ කියන්නේ එන එන අරමුණේ සත්‍ය දැකලා මිදෙන එකටයි. නත්ථි මේ සරණං අඤ්ඤං - සංඝෝ මේ සරණං වරං කියන්නේ එන එන අරමුණේ සත්‍ය දැකලා මිදෙන කෙනා, අන්න **බුද්ධං සරණං ගච්ඡාමි, ධම්මං සරණං ගච්ඡාමි, සංඝං සරණං ගච්ඡාමි.** අන්න **ලොව්තුරු සුවයට පත්වෙනවා. සදා අමරණීයයි, මරණයක් නෑ, මර බියක් නෑ, මැරෙන කෙනෙක් නෑ.**

මේ "ක්ෂණය දකිනවා ක්ෂණ සම්පත්තිය", ඇතිවෙන නැතිවෙන තැන. එතන එතන "තත්‍ර තත්‍ර විපස්සති අන්න දකිනවා **නුවණින්,** අන්න **බුද්ධක්ෂණය,** ඒක නම් මහා සිංහ නාදයක්ම තමයි, මේ කියන ටික. ආලෝකෝ උදපාදි, ඤාණං උදපාදි කියලා දැනෙන්නේ ඒ විදියටයි. මේක මහා මංගල්‍යයක්. බුදුන් ඉපදෙන්නේ **මේ මොහොතේමයි** මොහොතට අවදිය. බුදුන් ඉපදෙන්නත් **මේ මොහොතේමයි,** බුදුවෙන්නෙත් මේ මොහොතේමයි, පිරිනිවන්පාන්නෙත් **මේ මොහොතේමයි.** එහෙනම් මේ තෙරුවන **තියෙන්නේ, මහා මංගලයය තියෙන්නේ මේ මොහොතේමයි. වෙසක් දිනය කියලා අපි සැමරුවට හැමදාම වෙසක් මේ සත්‍ය අවබෝධ වූ අයට** මේ මහා මංගල්‍යයයි. ඇතිවෙන්නේ ප්‍රභාෂ්වර සිතක්. ඒ කියන්නේ **ප්‍රභාෂ්වර සිතයි අවදිවෙලා තියෙන්නේ.** ඒ ප්‍රභාෂ්වර සිතයි මේ අභ්‍යන්තරයේ **කෙලෙස් නැති තැන** අභ්‍යන්තරයේ කෙලෙස් නැති තැන මහා ප්‍රභාෂ්වරයයි. ඊට වැඩිය ලෝකයේ ප්‍රභාෂ්වරයක් නෑ. අන්න **'අනුත්තර වූ බුද්ධත්වයට'** පත්වෙනවා. අරහත්ත වග්ගය තුළ අරහත්ත සූත්‍රය තුළ බුදුන් වහන්සේ දේශනා කළා."

**අරහතුන් වහන්සේ නමක් බවට පත්වෙන්නේ කොහොමද ?** අන්න බුදුන් වහන්සේ කියනවා **යමෙක් මේ දර්ශනය දකීද ධර්මය දකීද, බුද්ධ පුත්‍රයෙක් කියලා.** අරහත්ත සූත්‍රයේ කොහේවත් නෑ රහත් වෙනවා කියලා. රහතන් වහන්සේ කියලා කොහේවත් නෑ. **අනුත්තර වූ බුද්ධත්වයට පත්වෙනවා කියලා විතරයි තියෙන්නේ.** ඒකෙන් පැහැදිලි වෙනවා සූත්‍රවල පොත්වල මොනවා ලිව්වත් ඒ කියන්නේ ඒ බුද්ධ ස්වභාවයට පත්වෙන එක විතරයි ඒ බුද්ධක්ෂණයමයි. ඒ තමයි මොහොතට අවදිවීම.

පන්සලක ඉන්න එක හාමුදුරු නමක්වත් මේ සත්‍ය ධර්මය දේශනා කරනවා නම් මිනිස්සු පන්සලට එනවා. **"සබ්බ දුක්ඛ නිස්සරණ නිබ්බාණ සච්ච කරුණත්තාය ඉමං කාසාවන් ගහිත්වා"** මේ කසාවත මට දෙන්න ස්වාමීනී, අනුකම්පා කරන්න ස්වාමීනී, මට දුකෙන් මිදෙන මග, මේ සිත දකින්න සිව්පසය අවශ්‍යයි නේද? ස්වාමීනී, මේ වචනෙ අද අවභාවිතා කරනවා. අද නිවන් මගත් අවභාවිතා කරනවා. සත්‍ය අපි හෙලිකරන්න ඕන. සත්‍ය ධර්මය හෙලි කරන්න ඕන. සත්‍ය ධර්මය හෙලි කරලා සත්‍ය ධර්මය ප්‍රචලිත වෙන්න දෙන්න ඕන. මනුෂ්‍යත්වයට සලකලා අපි කල් දෙන්න ඕන මේ සත්‍යය අවබෝධ කරගන්න. **හැමදාම ගාථා කිය කියා හිටි කෙනාට මේක සත්‍යයක් නෙවෙයි කියලා දකින්න, හැමදාම මල් පූජා කර කර හිටපු අම්මලාට මේක සත්‍යයක් නොවෙයි කියලා දකින්න, හැමදාම සිල්ගත්ත අම්මලාට මේ තුල තියෙන්නේ ව්‍රත සමාදන්වීමක්, මේක නිගණ්ඨ දහමක් බව.** ඇස් ඇත්තෝ දකිත්වා කිව්වා වගේ, ඇස්, කන් පෑදුන අය යම්කිසි උත්සාහයක යෙදෙනවා. ලංකා භූමියේ අසරණ වුන බෞද්ධයාගේ හෙට උපදින දරුවෙකුට හරි දුකෙන් මිදෙන්න මේ සත්‍ය දහම හේතුවක් වෙනවා.

හෙට උපදින දරුවෙක් සියදිවි හානි කරගන්න එකෙන් මිදෙන්න, හොරකම් කරන කෙනෙක් හොරකමෙන් වැළකෙන්න, මිනී මරණ කෙනෙක් ඒකෙන් වැළකෙන්න, ඉරිසියා කරන, ද්වේශකරණ රට මෙතනින් **මහා කරුණා ගුණයට හැරෙන්න** මේ සත්‍ය හෙළිවෙන්න ඕනඑකයි අපි කියන්නේ. **සත්‍යය නම් සත්‍ය පමණයි.** දැන් ඔබතුමාට තියෙනවා මෙනෙහි කරන්න. දැන් ඔබතුමා මේ සිතට පෙර සිත. වේගයක් තුළයි මේක එන්නේ. අන්න ඒක **ඛජ්ජනීය සූත්‍රයේ** තියෙනවා. අන්න ඒ දේශනා අසන්න. ඛජ්ජනීය සූත්‍රයත් තියෙනවා ලොවම දෙදරයි කියලා සාකච්ඡාවල පවා ගැඹුරු දේශනා තියෙනවා. **රූපං රූපත්තාය අභිසංඛතං - අභිසං කරෝති** - රුප්පනය නිසා රූපය හැදෙනවා කියන එක. "**රුප්පංතිකෝ ආයුසෝ - රූපං වදේති**" කියලා බුදුන් වහන්සේ මේ රුප්පනය, ස්පාර්ක් වෙනවා, ඉද්දෙනවා කියන එක. අර 5 සෙන්සස් දෙයක් බවට නිරූපණය වෙන එක ජීවමාන කරලා පෙන්නනවා ධර්ම දේශනා තුළින් ඔබතුමා ඒ ටික අහන්න.

ඇස් අරිනකොට ලෝකේ මැවෙනවා. ඇස් වහනකොට ලෝකය නැතිවෙනවා, තියෙන ලෝකයක් නැති බව. මේ වේගය තුල ආරෝපණය තුල රුප්පනය තුල අපි ආත්මීය දැනීමක් තියෙනවා කියන්නේ. **අපි ආරෝපණයක් ඇතුලේ හිරවෙලා** ඉන්නේ. හරියට අපි පෘථිවියේ චුම්බක ශක්තියක් ඇතුලේ හිරවෙලා ඉන්නවා වගේ. නමුත් **මේ පෘථිවිය කැරකෙන වේගය නිසයි,** මේ පෘථිවියේ තියෙන චුම්බක ශක්තිය තියෙන්නේ. උත්තර - ධ්‍රැවය, දක්ෂිණ - ධ්‍රැවය. ධ්‍රැව දෙකක් අතර ඒකේ චුම්බක ආරෝපණයයි ගල් කැටයක් උඩ දැම්මොත් බිම වැටෙන්නේ. අර ඕසෝන් කියලා ස්තරයක් හැදිලා වායු ස්තරයක්ම හැදිලා මේ විදියට පෘථිවි ගෝලයක් හැදිලා තියෙන්නේ අර

වේගෙට කැරකෙන නිසයි. **අන්න ඒ වේගෙ නැවතුන දවසට අභ්‍යවකාශයටම විසික්වෙලායයි සේරම, අන්න ඒ වගේ අපේ මේ ආශ්වාස. ප්‍රාශ්වාස වැටෙනකම්ම. ඒ ආශ්වාස ප්‍රාශ්වාස වැටෙන නිසා පෘථිවිය "ස්පාර්ක්" වන වේගෙට රුප්පනයක් ඇතිවෙලා තියෙනවා. අන්න චුම්බක ආරෝපණය වගේ. ආශ්වාස - ප්‍රාශ්වාසය නැවතුන දවසට අර වේගය නැවතිලා අභ්‍යවකාශයට විසික් වෙනවා. අපේ මේ ආත්මීය මේ සිත කියන එක එතනින් ඉවරයි.**

**මේ ආරෝපණයයි අපට කථා කරන්න තියෙන්නේ. "සිරස වගේ තරංග සිස්ටම් එකකට සකස් වෙන ආකාරය. අන්න දෘෂ්ඨිය තුල ඉන්න කෙනා, දෙයක් තියෙනවා කියලා තදින් බැසගන්න කෙනාට සිරස වගේ තරංගයක් උපදිනවා. අන්න ඒ තරංගය තමයි "මානීය මක්කටෝ - අතිමානීය කුක්කුරෝ" එයා තමයි කලලයක සකස් වෙන්න හේතු වෙන්නේ. හැබැයි එතනින් කවුරුත් ගියෙත් නෑ. යනව නෙවෙයි විඤ්ඤාණය මෙතනම හටගෙන නිරුද්ධ වෙනවා. එතනින් ඉවරයි. හැබැයි මේ සිස්ටම් එක එතන එතන එතන එතන සකස් වෙනවා. අර දෙරණ බලනවා වගේ, සිරස බලනවා වගේ, මෙතනින් කථා කරන ශබ්ද ෆෝන් එකෙන් ඔතනට එනව වගේ සිස්ටම් එකකට තවත් නියාමයකට සකස් වෙනවා. හැබැයි ඒ දෘෂ්ඨිය තුළ ඉපදුන ශක්ති ස්වභාවයක්. ඒක මේ විඤ්ඤාණ කතාව නෙවෙයි. ඒක දෘෂ්ඨිය නැතිවුන මොහොතේ, ඔබතුමා ලෝකයක් නැති බව දකිනවා නම්, ලෝකයක් තියෙන බවට උපදින ශක්තිය තුළ අන්න දෘෂ්ඨිය බිඳ වැටෙන තැනයි තරංග ශක්තිය ශූන්‍ය වෙලා යනවා. නැවත එතකොට කොහේවත් පිළිසිඳ ගන්නේ නෑ.** හැබැයි නූතන උපමා අරගෙනයි කතා කරන්නේ. දෘෂ්ඨිය තුල ඉන්න කෙනා නැවත උපත ලබනවා. "**නිබ්බංති චලිතං - අනිසිතංති නචලිතං**". නිශ්චිතයක් දෙයක් තියෙනවා කියලා ගත්ත කෙනා "චලිතං" කියන්නේ උප්පත්තියක් තියෙනවා. අනිසිතංති කියන්නේ දෙයක් නැති බව දකින කෙනා "**නචලිතං**" උත්පත්තියක් නෑ. **නැවත චලනයක් නෑ. කම්පනයක් වෙන්න හේතුවක් නෑ.** මේ කම්පනයක් තියෙන්නේ. මේ ධ්වනියක්. මේ සිත කියන්නේ ධ්වනියක් කිව්වේ ඒකයි. ධ්වනියක්, ශබ්දයක් කිව්වේ ඒකයි. ශබ්දයක් වුනොත් "ෆ්‍රීකොන්ස්" වෙන්න ඕන. මොකක්ද ඒ කිව්වේ අන්තිමටම මේ ධ්වනියක් කිව්වනේ. ෆ්‍රීකොන්ස් වෙනව කිව්වනේ.

**උපාසක :-** තරංග හරහානේ ඕක වෙන්නේ. ෆ්‍රීකොන්ස් වෙන්නේ,

**ආර්යයන් වහන්ස :-** ඒක තමයි. කළලෙක සත්වයෙක් පිළිසිඳ ගන්නවා. දැන් ඒ කළලේ පිළිසිඳ ගන්නකොට ඒ සත්වයාට දැන් මේ දැනෙන ස්වභාවයක් ඉස්මතු වෙනවා නේද ? ඒ ඉස්මතු වෙන්නේ යම්කිසි "ටෙලිපති" වීමක් සිද්ධවෙනවා නේද? ඒරියල් එකට වගේ හසුවීමක් සංඛ්‍යාතයක් අහුවෙනවානේ. දැන් හරිනේ. අහුවුනා නේද සංඛ්‍යාතයක්. දැන් ඔය භූතයෝ කියන්නේ පෙරේතයෝ කියන්නේ ඔක්කොම ටෙලිපති වෙලා නේද ? **රාග, ද්වේශ, මෝහ, සංඥා**

**ඝනත්වය අනුවයි ලෝක සකස් වෙන්නේ.** අන්න ඒකයි මෙතනින් යන්න කලින්ම ලෝකය සකස් වෙනවා. **අර දුටුගැමුණු රජ්ජුරුවෝ මරණාසන්න මොහොතේ රුවන්වැලි සෑයේ සුදු රෙද්දක් පෙරවලා චෛත්‍ය හදලා ඉවර නෑනේ. අන්න දුටුගැමුණු රජ්ජුරුවන්ට හිතේ මැවුණයි කියන්නේ. ඒකයි දිව්‍ය ලෝක එකක්වත් බාහිර නෑ. මේ සිතකයි සකස් වෙන්නේ. බාහිර එක ලෝකයක්වත් හම්බ වෙන්නේ නෑ. සොයන්න යන්නත් එපා.** මේ සේරම දෘෂ්ඨියකයි මැවෙන්නේ.

**උපාසක :-** බුද්ධක්ෂණය වෙලාවේ අපි දැන් ප්‍රැක්ටිස් කරනකොට ඒ ක්ෂණය වෙලාවේ ඉන්නවාද, නැත්ද කියලා හැඟීමක් එන්නේ නෑනේ ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්ස :-** ඒ තමයි මොහොතට අවදිය. ඒක එන්න ඕන අවබෝධයෙන්. තමන්ගේ අත්දැකීම සාන්දිට්ඨික තමන්ටමයි. වටිනාකමක් දියවුණු ස්වභාවයකයි අවදිය තියෙන්නේ. ඒක ඤාණෙටයි අසුවන්නේ. **"ඤායස්ස අධිගමාය" කිව්වේ ඒකයි. මේක "නිබ්බානස්ස කිරියාය"**

**උපාසක :-** මේකේ ආලෝකයක්වත් නෑ.

**ආර්යයන් වහන්ස :-** එක වචනයක්වත් ගන්න බෑ. ඒකට හේතුව මේක ඇවිල්ලා වටිනාකම නොදැනෙන ඡන්දරාගයයි දුරුවෙන්නේ. ඡන්දරාගය තුල ආලෝකය ඒව කතන්දර නෑ. **එතන තියෙන්නේ අර තමන්ගේම තියෙන දෙයක් වගේ දැනෙනවානේ. එහෙම දැනෙන්නේ නැති ස්වභාවය, අපි දැකලා නොදැක්ක වගේ යන්නේ ඒ වගේ ස්වභාවයක්. හැබැයි මෙතන ඒක නෙවෙයි පේනවා දන්නවා ඔක්කොම මෙතන තියෙනවා. ඒවත් එක්ක කම්පනයක් නැහැ. ගැටීමක් නැහැ. ඇලීමක් නැහැ. මේක ටිකක් වෙනස් කථාවක්. ඒකයි කිව්වේ සියුම් කෝණයක් තියෙනවා කියලා දකින. මේක තව ටිකක් නුවණින් මෙනෙහි කරන්න. හැබැයි ඔබතුමා රාග, ද්වේශ, මෝහ, දුරුවෙන ප්‍රත්‍යක්ෂ ඤාණෙකට එනවා. ඒක හිතලා ගන්න බෑ. ඒ තමන්ගේ රාග, ද්වේශ, මෝහ දියවන ප්‍රමාණයටයි අවදිය එන්නේ.** හරියට රේල්පීලි දෙකක් වගේ. තමන්ට දැනෙනවා ලෝකෙන් මිදුණු ස්වභාවය සෝතාපන්න බව, තමන්ට දැනෙනවා අනාගාමී බව, ආත්ම ස්වභාවයක් දැනෙන්නේ නැති ස්වභාවයක්. අන්න එතන තමන්ටම ප්‍රත්‍යක්ෂ වෙනවා ලෝකයක් නැති බවට. ලෝකයක් නැති බවට ප්‍රත්‍යක්ෂතාවය තුල නැවත උප්පත්තිය පනවන්න බෑ.

**"දිට්ඨිඤ්ච අනුපගම්ම සීලවා - දස්සනේන සම්පන්නෝ**
**කාමේසු විනෙය්‍ය ගේධං - නහිජාතු ගබ්බ සෙය්‍යං පුනරේතීති" කිව්වේ ඒකයි. පෘථග්ජන භූමියේ ඉඳන් ආර්ය භූමිය දකින්න බෑ. ආත්මයක ස්වභාවයක්, ආත්මයක් නැති ස්වභාවයක් ඒ කියන්නේ ඕකට කියන්නේ ඉත්තත්වයෙන් මිදීම. ඉත්තත්වයෙන් මිදෙන එකයි 'තථාගත' කියන්නේ 'ථතා'**

කියන්නේ අපි දැන් ඉන්නවා කියනවනේ. නිරයේ ඉන්න නිරිසතාත් කැමති ඉන්න ජීවත්වෙන්න. එතකොට පණුවත් මැරෙන්න කැමති නෑනේ, කූඹියත් කැමති නෑනේ, සතාට සතාට කෙනාට කෙනාට ඉත්තත්වයක් තියෙනවා. තමන් ඉන්නවා කියලා දැනෙන එකක්. ඒක ඇවිල්ලා තියෙන්නේ සෙන්සස් වලින් දැනෙන්නේ. එතකොට සෙන්සස් වල දැනීම තමයි ඔය තියෙන්නේ. දැනීම තමයි නැති වෙන්නේ. තථාගත ස්වභාවය ගන්න බෑ. පෘථග්ජන කෙනෙකුට, සිතුවිල්ලකට කවදාවත් එන්නේ නෑ. 'තථාගතයන් වහන්සේ' කියන්නේ ආත්මය කෙලෙස් නැතිකල නිසයි.

# 5 වන දේශනය - මොහොතට අවදිය

**(වැසුණු නිවන් මඟ විවර විය)**

**උපාසිකාව :-** වර්තමාන මොහොත කියන එක යම් පුද්ගලයෙකුට තේරුම් ගියොත් පුද්ගලයාගේ චින්තන රටාවට මොකද ? වෙන්නේ මේ සංසාරයේ මෙච්චර කල් දිගටම හිතාගෙන ආපු හැටි වෙනස් වුනොත් එහෙම. හටගෙන නිරුද්ධ වෙන ස්කන්ධ පිළිබඳව, සිතක් හටගෙන නිරුද්ධ වෙන ස්වභාවය එක මොහොතකදී තේරුනොත්.

**ආර්යයන් වහන්ස :-** ඉතිං තේරුණා එච්චරයි. සිතුවිලි සංසාරේ ගැනද? තේරුණා කියලා තවත් දෙයක් තියෙනවද? චින්තන රටාව වෙනස් වුණා කියලා මොකුත් වෙන්නෑ.

**උපාසිකාව :-** සාමාන්‍ය විදියට වැඩපල කරන අතර, අහඹු ලෙස එක සිතක් අරගෙන බලන්න පුළුවන්ද ? එක සිතක් දිහා එහෙම කරාම හරිද ? රාග, ද්වේශ, මෝහ වැඩෙන සිතක් ද ? කර්ම රැස්වෙන එකක්ද ? කර්ම ක්‍ෂය වන එකක්ද ? කියලා ආයි බලන්න ඕනේ නැත්ද? ඇත්තටම ස්වාමීන් වහන්ස ආයතන හයෙන් එන දේවල් එතන එතනම හටගෙන නිරුද්ධ වන ස්වභාවය දැක්කම, මෙතෙන දෙයක් නැති බව, මට මේක වචන වලින් කියන්න බෑ.

**ආර්යයන් වහන්ස :-** ඔතන පටලැවිල්ලක් තියෙන බව අපට තේරෙනවා. ලිහා දෙන්නම් පටලැවිල්ල හරියටම. ඔය විදියටම කියාගෙන යන්න ඕන. **දර්ශනය පිරිසිදු මදි. දර්ශනය දැක්ක කෙනෙකුට ඕක නිකන් ගඟ ගලනවා වගේ කියන්න පුළුවන්. මොකද එයා දන්නවා මොකක්ද ? මේ වෙන්නේ කියලා.** විචිකිච්ඡාව තියෙනකොට තමයි සැකයක් තියෙනකොට තමයි. මොකක්ද ? ඔය දැන් කියන්න උත්සහ කරන්නේ.

**උපාසිකාව :-** එක මොහොතකදී හටගෙන නිරුද්ධ වෙන ශූන්‍යතාවය අවබෝධ වුනාද කියන එක දැනගන්න තමයි කථා කළේ.

**ආර්යයන් වහන්සේ :-** තවම ඔබතුමියට ඒ බව අවබෝධ වෙලා නෑ. ඔබතුමිය තාම මනසිකාරයක ඉන්නේ. හිතනවා, ඔබතුමිය මනසින් ගලපනවා. දැනුමටත් ඒක අසා දැනගෙන ගලපන්න එපැයැ. එතන ඔබතුමිය ඉන්නේ. ඔබතුමිය උත්සාහ කරනවා ඒක තේරුම් ගන්න. වරදක් නොවේ. ඒ හොඳයි පටලවා ගත්ත තැන අපට පේන්නේ වෙනින් තැනක්. ඔබතුමිය හිතනවද ? **ආත්මයක් තියෙනව කියලා.** ඔබතුමියට **අභ්‍යන්තරෙන් ආත්මයක් නැති බව දැනිලා නෑ.**

**උපාසිකාව :-** හටගෙන නිරුද්ධ වෙන ස්වභාවයක් විතරයි මෙතන තියෙන්නේ

කියලා තේරුම් ගිහිල්ලා තියෙන්නේ ආර්යන් වහන්ස. ස්වභාදහම බව තේරිලා තියෙන්නේ. ඒක අවබෝධ වෙලා තියෙන්නේ කිව්වොත් හරි. අපි සිහියෙන් හිටියොත් අඳුරගන්න පුළුවන් කියලා හිතනවා.

**ආර්යයන් වහන්ස :- අති සියුම් කථාවක් මේ කියන්නේ. ඔය මොකුත් නැති වෙලා නෑ. ඔක්කෝම තියෙද්දී අවබෝධයෙන් මිදෙන එකයි කියන්න තේරෙන්නේ නැත්තේ. අපි හිතනවනේ කණ්ණාඩියේ ඔක්කොම දේවල් තියෙනවානේ කියලා. ඒ උනාට මොකුත් නෑනේ කියලා. දැන් මෙතන දර්ශනයක් නේ මෙතන පැහැදිලි වෙන්නේ. නුවණ තියෙන්න ඕන නේ මේක වටහාගන්න.** ගැඹුරු ඤාණයක්නේ අවදි වෙන්නේ. අවබෝධයක් ඤාණයක්නේ අවදි වෙන්නේ. ඔන්න දැන් කණ්ණාඩියේ සේරම තියෙනවා. මෙනෙහි කරලා බලන්නකො. කණ්ණාඩියේ ඔක්කොම පේනවා ඒත් මොකුත් නෑ. මේ සියුම් කෝණය හොඳින් තේරුම් ගත්තොත්, අපි දැන් විශාල කණ්ණාඩියක් ගත්තොත් එතකොට ගස් කොළන්ද, පොළවද, අහසද, ඉරද, හඳද ඔක්කොම කණ්ණාඩියේ තියෙනවානේ. නමුත් කණ්ණාඩියේ එහෙම දෙයක් නෑනේ. තව ටිකක් බලන්නකො හොඳට කණ්ණාඩිය පුළුල් තිරයක් දැන් ඇත්තටම මුළු ලෝකයම කණ්ණාඩිය කියලා. මේ ඇහැ කණ්ණාඩියක් කියලා හිතන්නකෝ. දැන් එළියේ මොකුත් තියෙනවද ? එතකොට පේන්නේ නැද්ද ? තියෙනවද ? ඕක තමයි වෙන්නේ. දැන් මේ විශාල කණ්ණාඩියේ ඔක්කොම තියෙනවා ඉර, හඳ, ගෙවල් තියෙනවා. දරුවෝ ඉන්නවා. මේ ඇහැ කියලා ගත්තාම කණ්ණාඩි අපේ ඇහැට අයින් කරා වගේ ගන්නේ. ඔව් ඉතිං එළියේ ඉර, හඳ, ගෙවල් තියෙනවා. දරුවෝ ඉන්නවා. මාත් ඉන්නවා. කණ්ණාඩියේ එහෙම දෙයක් නැහැ.

**"මේක උපමාවක් නෙමෙයි. මේ ඇත්ත කථාව කියන්නේ. දැන් එතකොට අවසාන ඵලය තමයි දැන් පෙන්නන්නේ"** මේක තමයි අවසානයේ සිද්ධ වෙන්නේ. දැන් මේ ලයිට් එක දැම්මාම ආලෝකය තමයි, මේ ආලෝකය ඇතිවෙන්නේ අර කරන්ට් එක තියෙන නිසයි. දැන් අපේ අභ්‍යන්තරයේ අපට, මේ අවසාන ඵලය තමයි අපි වැටහෙන්නේ. **"ඕක තමයි දර්ශනය"** ඔය දර්ශනයට ඔබතුමිය තාම ගිහිල්ලා නෑ. ඔබතුමියට මොකද වෙලා තියෙන්නේ, ආත්ම ස්වභාවයෙන් මේ තියෙනවා වගේ කියලා දැනෙනවා. ඕක නෙවෙයි ඒ වුණාට ඇත්ත. ඇත්ත තමයි මෙනෙහි කරනකොට **"පජානාති" ඒ සත්‍ය දකිනවා කියන එක.** එතකොට **යථාභූත ඤාණය** කියන්නේ. **මේ සම්භූත වන ආකාරයමයි මෙතන පිරිසිදු වෙන්න ඕන.** එතන දර්ශන ඤාණය කියන එකයි සිද්ධ වෙන්න ඕන. **දර්ශන සමාපත්තිය වෙනයි, දර්ශන ඤාණය වෙනයි.** දර්ශන ඤාණය කොහොමද ? මේක හැදෙන්නේ. සම්භූත වන අර යථාභූත ඤාණය තමයි මෙතනදි පිරිසිදු වෙලා නැති බව දැනෙන්නේ. එහෙම පිරිසිදු වුන කෙනෙක් ඔය ප්‍රශ්නෙ අහන්නෑ.

ඒක පිරිසිදු කරන්න තමයි අපි අර **චිත්‍රයක උපමාවක් ගත්තේ.** මේ ඔක්කොම තියෙනවා. හැබැයි ඒ චිත්‍රයේ වටිනාකමක් නෑ. චිත්‍රයේ අපි රත්තරං මාලයක් ඇන්දට, චිත්‍රයේ රත්තරං මාලයක් නෑ කියන්න බෑ, තියෙනවා. හැබැයි ඒ වුනාට රත්තරං මාලේ පවුමක වටිනාකමක් කොළයක් ගෙනිහිල්ලා කවුරුත් දෙන්නෑ. එහෙම නම් මෙතනත් මේ පේන්නේ ඇහැට වර්ණෙමයි. එහෙනම් කොහොමද ? එතන ඒ වුණාට රත්තරං කියලා වටිනාකමක් ඇත්තටම චිත්‍රයක නෑ. කොළ කෑල්ලක වටිනාකමක් නෑනේ. "ඇත්තටම අපි ඇත්ත ලෝකෙන් රත්තරං කියලා හිතුවට එහෙම වටිනාකමක් ඇත්තටම නෑ. නමුත් අර අපි වටිනාකමක් ආරෝපණය කරගෙනයි තියෙන්නේ. දැන් මේ අපිට වටිනාකම තමයි නැතිවෙලා නැත්තේ. වටිනාකම අපිට කෙලින්ම **"දිට්ඨේ දිට්ඨ මත්තං" වෙනවා.** දුටු දෙයක් නෑ. දුටු කෙනෙක් නෑ. දැන් වටිනාකම කියන්නේ **ඡන්ද රාගය.** ඒකට තියෙන ඡන්දය කැමැත්ත, රාගය

**"යාරූපේ නන්දි - තධූපා දනං භවෝ**
**අභිනන්දති අභිවදති - අජ්ජෝසාය තිට්ඨති"**

එතකොට මේක දීර්ඝ කාලයක් තිස්සේ අනුසෝතය තුළ අපේ, වයබ්‍රේෂන් එකක් කිව්වා, ධ්වනියක් කිව්වා, චිත්ත කම්පනයක් කිව්වා මේ වචන ගොඩක් භාවිතා කළත්, රූප්පනය කිව්වා, ඉද්දෙනවා කිව්වා. ප්‍රතිකම්පනයක් කිව්වා මේ වචන ගොඩක් භාවිතා කරත්, බුදුන් වහන්සේත් මේ වචන භාවිතා කරනවා. එතකොට **"ඉටීදති රුප්පන්තිකෝ ආයුසෝ - රූපං වදේති" ඒ කියන්නේ නැවත නැවත නැවත එකම දේ සිතීම තුළ ඒකම බල ගැන්විලා දෙයක් බවට පත්වෙලා වටිනාකමකුත් ඇතිවුණා කියන එක. "ඒකයි රූපං රූපත්තාය අභිසංකතං අභිසංකරෝති"** රූපය අභිසංකරණය නිසා. අභිසංකරණයයි දෙයක් කරලා අපට දෙන්නේ.

"පුඤ්ඤාභි සංඛාර, අපුඤ්ඤාභි සංඛාර, **ආනිඤ්ඤාභි සංඛාර" අභිසංඛාරා කියන වචනෙ. "සංඛාරා සංඛාරත්තාය අභිසංකතං අභිසංකරෝති"** කිව්වේ. දෙයක් බලගැන්වෙන්නේ නැවත, නැවත, නැවත අපි T.V. එකේ උනත්, ෆිල්ම් එකක් හදන්නේ, කාටුන් එකක් වුණත් හදන්නේ එකම රූපේ නැවත, නැවත පෙනීම තුළයි. ගිනි බෝලයක් කරකවන වේගය නිසයි අපට ඒක **"ගිනිවළල්ල"** වෙන්නේ. මේ වගේමයි අපි මේ එකම දේ නැවත නැවත සිතීම තුළ ඒක නැතුව බැරිවෙනවා. ඒකයි අපට වෙලා තියෙන ආරෝපණය. ඒකට කියනවා. **"චිත්තාරෝපණය"** කියලා. දැන් ඕක නැතිවෙන්නේ **පෙනීම, නැවත, නැවත එන අරමුණේ වටිනාකමක් නැති බව.** මෙනෙහි කරනකොට, කරනකොට මොකද වෙන්නේ, **යෝනිසෝ මනසිකාරයත්, යථාභූත ඤාණයත් කියන්නේ,** අරමුණේ සත්‍ය දකිනවා කියන එකයි. අන්න එහෙම වුණොත් විතරයි අර **"දීර්ඝ කාලයක්"** ඇත්තයි, ඇත්තයි, තියෙනවා, තියෙනවා කියලා හිතපු එක නෑ, නෑ, නෑ **බවට පත්වෙන්නේ.** එහෙම වුනොත් මොකද වෙන්නේ මේක

අනුසෝතය තුළ **තියෙනවා බවට කැරකිච්ච එක නෑ කියන ප්‍රතිරෝදයට කැරකෙන්න ගන්නවා.** අන්න ඒක **ශූන්‍ය වෙලා යනවා දවසක.** වටිනාකමයි ශූන්‍ය වෙලා යන්නේ, ඡන්දරාගයයි දුරුවෙන්නේ. "ඔන්න ඔතනයි **කෘත්‍ය ඥාණය** කිව්වේ ඔය **ක්‍රියාවලියයි."**

"දිට්ඨිය නම් **"සම්මා දිට්ඨිය"** දෙයක් නැති බව දැක්කා. අන්න දර්ශනයට පත්වුණා "දිට්ඨිඤ්ච අනුපගම්ම සීලවා දස්සනේන සම්පන්නෝ" දර්ශන ඥාණය ඇති වුණා. අන්න එහෙම වුණොත් "කාමේසු විනෙය්‍ය ගේධං" **සැප විඳින්න දුක් විඳින්න දෙයක් නෑ.** "නහිජාති ගබ්බසෙය්‍යං" **ලෝකයක් නැතිකොට, ලෝකෙක හැඟීමකුත් නැතිකොට උපදින්නේ කොයි ලෝකෙද ? උප්පත්තියකුත් නෑ අනාගාමී. ඒ විතරක් නෙවෙයි අරහත්වයටම පත්වෙනවා.** නැවත සසරක කථාවක් නෑ. "මේ මොහොතේම ධර්මය ඇසීම තුළ **වාඩිවෙන්නේ අසෘතවත් පෘථග්ජනයෙක් නැගිටින්නේ මෙලොවත් මිදිලා, එලොවත් මිදිලා දොලොවම මිදුණු ආර්යයන් වහන්සේ නමක්."** ඔන්න ඕක ධර්ම ශ්‍රවණය තුළ සිද්ධවෙනවා. ලෝක සත්වයා සම්පූර්ණයෙන්ම සත්ව පුද්ගල සංඥාවෙන් මිථ්‍යා දෘෂ්ඨියෙන් මිදෙන එක තමයි, ඇත්තටම මෙතන **සම්මා දිට්ඨි කියලා කියන්නේ. සත්වයෙක්, පුද්ගලයෙක්, මම, මගේ ආත්මය කියලා ගත් දෘෂ්ඨියයි නැතිවෙන්නේ.**

"බුදුන් වහන්සේ **"සම්බෝධි සූත්‍රයේ"** දේශනා කරනවා. මහණෙනි, මරුන්, බඹුන්, මිනිසුන්, දෙවියන් සහිත භූමියේ **"මේ සත්‍ය අවබෝධ නූනානම් සම්මා සම්බුද්ධත්වයට"** පත්වුණා කියලා ප්‍රකාශ කරන්නේ නෑ කියලා. ඒ කියන්නේ මරුන්, බඹුන්, මිනිසුන්, දෙවියන් සහිත භූමිය කියන්නේ. **"මිථ්‍යා දෘෂ්ඨික භූමිය"** මේක නුවණටයි අසුවන්නේ, අවබෝධ ඥාණයටයි අසුවෙන්නේ. මොකක්ද මේ බුදුහාමුදුරුවෝ කිව්වේ කියලා. මරුන්, බඹුන්, මිනිසුන්, දෙවියන් සිටින මිථ්‍යා දෘෂ්ඨික පෘථග්ජන අවිද්‍යා භූමියේ, මෝහ ඝනඅන්ධකාර භූමියේ **"සම්මා දිට්ඨියට" පත්වුණා** කියන්නේ. ඒ භූමිය බොරුවක් කියන එක, **මිථ්‍යාවක් කියන එක.** ඒක දෘෂ්ඨියක් තුළයි සකස් වෙන්නේ. මම හිතනවා බල්ලා ඉන්නේ තිරිසන් ලෝකේ, බල්ලගේ ඔළුව අත ගගා කියනවා බල්ලා ඉන්නේ තිරිසන් ලෝකේ, මම ඉන්නේ මනුස්ස ලෝකේ කියලා. මේ ලෝකේ කොහේවත් තියෙන එකක් නෙවෙයි. මේ මොහොතේ මෙතනම, අපේ සිතේනේ සකස් වෙන්නේ. **අන්න මරුන් ඉන්නෙත් අපේ හිතේ, බඹුන් ඉන්නෙත් අපේ හිතේ, දෙවියන් ඉන්නෙත් අපේ හිතේ, තිරිසන් ලෝකේ තියෙන්නෙත් අපේ හිතේ. ඔක්කොම සිතුවිල්ලක් ඇතුලේ. "සංකප්ප රාගෝ පුරිසස්ස කාමෝ" කිව්වේ ඒකයි.** ඒ සංඛාර ලෝකය, සංකප්ප ලෝකයෙන් මිදුන එකයි

එහෙනම් ඒ කෘත්‍ය ඥාණය සිදුවුණොත් විතරයි **කෘතඥාණය අර කියන කණ්ණාඩියේ එලයට එන්නේ.** එහෙනම් අපි දකින දැක්ම, දර්ශනයට

පත්වෙන්නේ අර අනුපිළිවෙලින් යන මග ගියොත් විතරයි. සත්‍ය ඤාණය, කෘත්‍ය ඤාණය, කෘත ඤාණය "ද්වාදසාඛාරං තිපරිවට්ටං" කියන්නේ, මේ තමයි චතුරාර්ය සත්‍ය. **දෙයක් කියලා ගත්තොත් සමුදය, එහෙම වුණොත් දුක, ඒක නැති බව දැකීම නිරෝධය, නැතිකිරීමේ මාර්ගය අන්න ද්වාදසාඛාරං තිපරිවට්ටං කිව්වේ, සත්‍ය, කෘත්‍ය, කෘත කිව්වේ 03 මයි ඒ 04 ට ගැලපෙන්න.**

"ධම්මචක්කපවත්වන සූත්‍රයේ ඔය ටික තියෙනවා. ඕකෙ සාරාංශය තියෙන්නේ, කරන විදිය ඒකේ නෑ. අන්න අප විසින් නුවණින් අල්ලගන්න වෙලා තියෙන්නේ. නමුත් එදා පස්වග තවුසන්ට ඒ දේශනා කොට, පැහැදිලි කරනකොට අපට තේරෙනවා පස්වග තවුසන්ගේ දීර්ඝ කාලයක් තිස්සේ තපස්වරුන් විදියට මේ දේ අධ්‍යයනය කරලා තිබුණ නුවණ නිසා පෑදිලා තිබුණ නිසා මේක වැටහුණා. විශේෂයෙන්ම කොණ්ඩඤ්ඤ තාපසතුමාට මේක වැටහුනා. අන්න කොණ්ඩඤ්ඤට වැටහුණා කියපු නිසා, **'අඤ්ඤා කොන්ඩඤ්ඤ'** වුණා. හැබැයි මේක අවබෝධ කරන එක **ඇත්තටම** ලේසි නෑ. **හැබැයි මේ තමයි පරම සත්‍යය. දෙයක් නැති බවට පරිවර්තනය වෙනවා.** දෙයක් නැතිවෙනකොටයි නාම - රූප නැතිවෙන්නේ. **එහෙනම් නාම - රූපයි මෙතන සම්පූර්ණයෙන්ම නිරුද්ධ වෙන්නේ.** ඒකයි විඤ්ඤාණය **අනිදස්සන** වෙන්නේ."

"විඤ්ඤාණය අනිදස්සන වුණාට පස්සේ වෙනදා විදියටම දකිනවා. නමුත් **"එස්ස"** වෙන්නේ නෑ. ඒ කියන්නේ වෙනදා විදියටම පේනවා. වෙනදා විදියටම ඇහෙනවා. වෙනදා විදියටම කටයුතු කරනවා. හැබැයි **අභ්‍යන්තරයෙන් ඒවට වටිනාකමක් නැති කිසිම අගයක් නැති පුදුමාකාර මිදීමකට පත්වෙනවා."** අන්න දියවෙලා ගිහින් තියෙන්නේ අර ඡන්දරාගය. ආස්‍රව කෙලෙස් ක්ෂය වෙනවා කියන්නේම **"තණ්හක්කයෝ නිබ්බාණෝ" කියන්නේ,** තණ්හාව දියවෙන්නේ මෙන්න මේ සත්‍ය දකින කෙනාගෙයි. **ඒ තමයි නිවන.**

**"ඒකායන මග්ගෝ අයං භික්ඛවේ"** බුදුන් වහන්සේ දේශනා කරන්නේ අන්න ඒ නිවන් මගයි.

**"දිට්ඨිඤ්ච අනුපගම්ම සීලවා - දස්සනේන සම්පන්නෝ"**
**කාමේසු විනෙය්‍ය ගේධං - නහිජාතු ගබ්බසෙය්‍යං පුනරේතීති"**

නැවත උප්පත්තියක් නෑ. මේ අන්තිම භවයයි.

# 6 වන දේශනය - මොහොතට අවදිය

**(බුද්ධ දර්ශනය ගිලිහුණු බෞද්ධ සමාජය අසරණයි)**

**උපාසිකාව :-** ඔබ වහන්සේගේ ආරණ්‍ය සේනාසනය කොහේද තියෙන්නේ ආර්යයන් වහන්ස,

**ආර්යයන් වහන්ස :-** මේ ධර්මය අහන හැමදෙනාගේම සිත තුළ "මෙත්මල් අරණක්" කියලා තියෙනවා. සමාජ සම්මුතියේ තියෙන බුදු දහමෙයි කියලා හිතාගෙන ඉන්න දේ, ප්‍රායෝගිකව යථාර්ථයක් විදියට ධර්මය මොකක්ද කියලා හොයන කෙනෙකුට ඇත්ත හමුවෙනවා. "බුද්ධෝත්පාද" දේශනා ශ්‍රවණය කරගෙන යනකොට තමන් තුළ තමන්ටම ප්‍රත්‍යක්‍ෂතාවයක් ඇතිවෙන්න ගන්නවා. ධර්මය ප්‍රායෝගිකව **තමන්ට දැනෙන්න ගන්නවා.** මේක විශ්වාසයක් නෙවෙයි. ඇදහිල්ලක් නෙවෙයි. ප්‍රත්‍යක්‍ෂ ධර්මයක්, **සාන්දිට්ඨික** ධර්මයක්. ඒක තමා තුළින් තමන්ටම දැනෙන් ඕන ප්‍රත්‍යක්‍ෂ වෙන්න. ඒ තුළ තමයි ඒ කටයුතු සිද්ධ වෙන්න ඕන.

**උපාසිකාව :-** ඔබ වහන්සේගේ අභිඤ්ඤා දේශනා තමයි වැඩිපුර තේරුණේ. මේ සත්‍ය ධර්මය ඔබ වහන්සේගෙන් තමයි ඇහුවේ.

**ආර්යයන් වහන්ස :-** අභිඤ්ඤා දේශනා ටිකක් ගැඹුරුයි. **"ශබ්ද තරංගයි, වර්ණ තරංගයි එකතු වෙලා හැදෙන්නේ චිත්තයක්".** ඇත්තටම මෙතන තියෙන්නේ සොබාදහමේම යථාර්ථයක් තමයි අපි අවබෝධ කරගන්නේ. ඇත්තටම සිත කියලා දේකුත් නැහැ. මේ ධර්මතාවය කියන්නේ "සිස්ටම්" එකක්. අපට මේ හිතෙන, දැනෙන ආත්මීය ගතිය කොහොම ද ඒක වෙන්නේ කියලා අපි දන්නේ නෑ. අන්න ඒ දැන නොගත්තහම ඒ තමයි අවිද්‍යාව. අපේම සිත හැදෙන හැටි දැනගත්තොත් අපි මේ සිතේ මාතාවට රැවටෙන් නෑ. අන්න එහෙම තමයි දැනගන්නේ 'මායූපමංච විඤ්ඤාණං'. මේ විඤ්ඤාණ මායාවෙන් අපට මිදෙන්න හැකියාවක් තියෙනවා. කිසි කෙනෙකුට මිදීමක් නෑ. රැවටෙනවාම තමයි. **ඒ රැවටීම මේ ලෝකේ තියෙන විශාලම රැවටීම.** ඔබ රැවටිලානේ. ඒ සත්‍ය ඇහෙන්නම ඕන. බුදුන් වහන්සේ දේශනා කරනව **කල්පයක් හිටියත් වැඩක් නෑ** කියලා. **එක මොහොතක් මේ සත්‍යයට අවදි නුණොත්.** ධර්මය නම් දෙකක් නෑ. ධර්මය නම් එකයි. මේ තියෙන්නේ සොබාදහමමයි. කොයි විදියෙන් කවුරු පැහැදිලි කරත් එකම දහමයි පැහැදිලි කරන්නේ. **දෙකක් නෑ. සත්‍යය නම් සත්‍යය. දෙකක් තිබුණොත් එකක් අසත්‍ය වෙනවා.** ධර්මයමයි වැදගත් වෙන්නේ පුද්ගල සරණ යාම නොවෙයි. අපි සත්‍ය අපි අහන්න ඕන. ධර්මය තුළ ප්‍රායෝගික වෙන්න ඕන. "වක්කලී මේ කුණු ශරීරයක් දිහා බලා ඉන්නේ, **"සෝ ධම්මං පස්සති - සෝමං පස්සති"** එහෙම වුණොත් මාව දකිනවා ධර්මය තුළින් බුද්ධ කියන්නේ සත්වයෙක් පුද්ගලයෙක්

නෙවෙයි."බුද්ධ" කියන්නේ මේ "ශූන්‍යතාවයටයි". හැබැයි මේ ශූන්‍යතාවය තුළ ඔය සම්මුතියේ කථාකරන ශූන්‍යතාවය නෙවෙයි. ආත්ම දිට්ඨිය අතහැරුණු තැන සත්ව පුද්ගල දෘෂ්ඨිය මිදුණු තැන අන්න චේතෝ විමුක්තිය කියන්නේ. '**චිත්ත විමුක්තිය' තුළ** ඇතිවෙන ශූන්‍යතාවය

බාහිර බඩු මුට්ටු නැතිවෙන එකක් නෙවෙයි. "වෙනදා වගේ පේනවා. අන්ධ වෙලා නෑ. ඇහෙනවා බීරිවෙලා නෑ. නමුත් මේ හැම දෙයක්ම පේනවා. ඇහෙනවා. අර කණ්ණාඩියේ හැම දෙයක්ම පේනවා. නමුත් කණ්ණාඩිය ඇතුලේ මුකුත් නෑ. අන්න ඒ වගේ අවබෝධයක් ඇතිවෙනවා ඇත්තටම. ඒ හැමදෙයක්ම පේනවා වුණාට, හැමදෙයක්ම ඇහුණා උනාට එහෙම දෙයක් නැති බව එය අවබෝධයට පත්වීමයි. **"සෝතාපන්න" වෙනවා කියන්නේ.** ඒ කෙනා අනුසෝතයෙන් පටිසෝතයට එනවා. අනුසෝතය තුළ තමයි අපි පෘථග්ජන භූමියේ ලෝකය ඇත්ත කරගෙන ජීවත් වෙන්නේ. **හැබැයි පටිසෝතය කියන්නේ ලෝකය ඇත්තක් නොවන බව දකින එකයි.**

**"විනෙය්‍ය ලෝකේ අභිජ්ජා දෝමනස්සානං - කායේ කායානුපස්සී විහරති"**

**කියන්නේ මේ ලෝකය ඇත්තක් නොවන බවට දකින එකයි.** "විනෙය්‍ය ලෝකේ, ලෝකය ඇත්තක් නොවන බව දකින එකයි. අන්න **"සතර සතිපට්ඨානය" තියෙන්නේ ලෝකය ඇත්තක් නෙවෙයි කියලා දකින්නයි.** "සතර සතිපට්ඨානය වඩන්නේ ගොඩක් අය ලෝකේ ඇත්ත කරගෙන. බාහිර ඇත්ත කරගෙන යමක් කරනවා. ඒක නිගණ්ඨ භාවනාවක්.

ත්‍රිපිටක වල සූත්‍රවල මහා නිධාන, මදුපිණ්ඩික සූත්‍රය, සංචේතනා සූත්‍රය, ස්කන්ධ සූත්‍රය මේ වගේ ධර්මය තියෙනවා. මේ සිත හැදෙන හැටි හොඳින් දැකගන්න හැකියාව තියෙන්නේ. ඛජ්ජනීය වග්ගයට ගියානම් **"රුප්පන්තිකෝ - ආයුසෝ රූපං වදේති"** කියනකොට, මේ සිත හැදෙන්නේ කාටුන් එකක් තියෙනවා වගේ. අර රූප ගොඩක් වේගයෙන් එනකොට, දෙයක් බවට පත්වෙලා චිත්‍රපටියක් වගේ පේනවා. ඒ විදියටයි **ජවන් ජවන් කියලා පෙන්නන්නේ. සම්පටිච්ඡන, සංතීරණ, වොත්ථපන කියලා** චිත්‍ර ගොඩක් එනවා. ඒ කියන්නේ "ස්පාර්ක්" වෙනවා. සෙන්සස් ප්‍රසාද වෙනවා. ඒ වේගය තුළ අපට මැවෙනවා. දැනෙනවා. අර මිලි වොට් 5 ක කරන්ට් එකක් උපදිනවා. ඒක තමයි **ස්නායු පද්ධතිය ඔස්සේ අපේ දුවන්නේ, චේතනාව නිසයි, සිතුවිලි නිසයි මේ කරන්ට් එක උපදින්නේ.** අර තියෙනවා වගේ දැනෙන එකමයි, සිතුවිලි කියන්නේ. නාම - රූප එකතු වෙන තැන අර තියෙනවා වගේ දැනෙන විඤ්ඤාණ මායාව තුළ හිරවෙලා. අපි ඉන්නවා දැනෙනවා කියන **"සක්කාය දෘෂ්ඨිය"** තුළ හිරවෙලා මේක දැකගන්න නම් හොඳින් බොහොම පිළිවෙලට ඔය දේශනා අහන්න. කොතනින් ඇහුවත් ඔය ධර්මය නම් හැම සූත්‍රයක්ම ගොඩක්ම වටිනවා. ඒවා හැම එකක්ම නිවන් මඟ අනුමතයි. අහන තරමටම

තිවෙනවා. ඒ කියන්නේ, **"අවිද්‍යා අසේස - විරාග නිරෝධෝ" (අවිද්‍යාව නිසයි අපේ මේ කෙලෙස් පවතින්නේ, අවිද්‍යාව දුරුවෙන තරමටම කෙලෙස් ක්ෂය වෙනවා.)** "ආනන්දය, මේ හිමාලෙ පර්වතය ද ලොකු, මේ අතේ තියෙන ගල් කැටය ද ලොකු, "ස්වාමීනී, හිමාලය පර්වතය කොයි තරම් විශාලද, මේ අතේ තියෙන ගල්කැටය කොයි තරම් කුඩයිද ? අන්න ඒ වගේ ආනන්දය, **යමෙක් මේ සත්‍ය අවබෝධ කරයිද, හිමාලේ පර්වතය වගේ කෙලෙස් ක්ෂය වෙනවා."**

"ඒ කියන්නේ මේ ලෝකේ ඇත්තක් නෙවෙයි කියලා තමන්ට දැනෙන්නේ **සිත හැදෙන හැටි දැක්කොත් තමයි"** මේ හිතේ තමයි ලෝකය මැවෙන්නේ.

**"චිත්තේන නියතී ලෝකෝ" (සිත තුළ මැවෙන ලෝකය)**

ඇස, කණ, නාසය, දිව, කය, මනස කියන ආයතනවලින් එන අරමුණු ප්‍රසාදවීම් එකතු වෙලා වර්ණ, ශබ්ද, ගන්ධ, රස, පහස මේවා **එකතුවෙලා දැනෙන දැනීමයි ආත්මය කියන්නේ.** ශබ්දය තුළ ආත්මයක් නෑ. වර්ණය තුළ ආත්මයක් නෑ, එහෙනම් ගන්ධය, රස, සීතල, උණුසුම, තද ගතිය එකක්වත් ආත්ම කථාවක් නෑ. මේ කොහේවත් ආත්මයක් නෑ. **"මේක දෘෂ්ටියක්"** ආත්ම දෘෂ්ටියක්, සක්කාය දෘෂ්ටියක්, මේක දකින්න බෑ ලේසියෙන් **"අශ්ව ලෝමයක් සියයක් කඩකට පැලෙන්න විදීද මහණෙනි, එයත් විය හැකියි, මෙය සුකර නොවේ"** කිව්වේ ඒකයි. **ලෙහෙසි නෙවේ කිව්වේ ඒකයි.**

මේක දකින්න මහා නුවණක් ඕන. ඒ නුවණ අපි හදාගන්න ඕන. අපට ටිකින් ටික අවබෝධය ඇතිවෙන්න, ඇතිවෙන්න නුවණ පෑදෙන්න ගන්නවා. අපට සත්‍ය දැනෙන්න ගන්නවා. මේ දේශනා අහගෙන යනකොට වැඩිය ඕන්නෑ ඔබතුමියට **සති 02 ක් යනකොට, මාසයක් ඇතුළත ඔබතුමිය සෝතාපන්න මාර්ගයට ඇවිල්ලා සසර දුකින් මිදිලා නියත සම්බෝධිපරායන වෙනවා"** හොඳින් අහගෙන යන්න. ටිකක් දේශනා අහගෙන යනකොට ප්‍රශ්න ඇතිවේවි. ගැටළු ඇතිවේවි. නුවණින් විමසන කෙනාටයි නුවණ වැඩෙන කොට හිරවුණ තැන් එනවා. අන්න එතකොට කථා කරන්න ඕන. අනුසෝතය තුළ සෑහෙන කාලයක් ආත්මීය ස්වභාවය, ලෝකයක් තියෙන බවට, ආත්මයක් තියෙන බවට අපට මේ දැනෙන්නේ. ඒක අනික් පැත්තට එනවා ලෝකයක් **නැතිබව හිතනකොට චිත්ත කම්පන එනවා.** ඒවා ලෞකිකයි. ලෝකෝත්තර චිත්ත කම්පන නෙවෙයි. ඒ චිත්ත කම්පන සමාධි වඩනකොට, ධ්‍යාන වඩනකොට, හිත අර එක නිමිත්තක තියාගෙන අර ඒ නිමිත්ත තුළ මත්වෙන ස්වභාවය, පාවෙන ස්වභාවය, චිත්ත කම්පන එනවා. ලෞකික භූමියේ ගොඩක් චිත්ත කම්පන තියෙනවා. අර අපි කළුවරේ යනකොට නිකන් අපි බය හිතෙන දෙයක්, ගහක අත්තක් හෙලවෙනකොට හරි, ඡායාවක් දැක්කම හිත බය වෙන්නේ හෙලවෙන්නේ. ඒ චිත්ත කම්පන තමයි එන්නේ.

**උපාසිකාව :-** "මම සිත ඒකාග්‍ර කරනකොට ඒ ස්ථානයට, මොහොතකට ඒකාග්‍රකරණකොට රිද්මයක් එන්නේ"

**ආර්යයන් වහන්සේ :-** ඒ සමථ ඒකාග්‍රතාවයක්. ඒක විදර්ශනා භාවනාවක් නෙවෙයි. මේ විදර්ශනා භාවනාවෙන් එන්නේ **"අවබෝධඥාණයකින්, ලෝකෝත්තර සමාධි එහෙම පිරිහෙන ඒව නෙවෙයි."** ලෞකික සමාධි පිරිහෙන ඒව. දැන් ඔය කිව්ව විදියට එන්නේ ලෝකෝත්තර නෙවෙයි. සමථ ඒකාග්‍රතාවයක්. එය ලෞකිකයි. ඔය හිතන දෙයක් නෙවෙයි. **"මොහොතට අවදිය කියන්නේ"** ලොකු කථාවක් **"ඒක ඇවිල්ලා ධර්මාවබෝධය තුළින් ඇතිවෙන එකක්. "ඒක එන්නේ ආත්මයක් නැතිබව දැනෙන කොටයි"** සිතුවිලි දෙකක් අතර හිඩසයි කියලා බලන අයට හම්බවෙන්නේ. වේදයේ තියෙන එකක්. ඒක නිගන්ඨ එකක්. **දැන් මේ සිත ඇතිවෙනවා බිත්තිය දකින සිත, මේසෙ දකින හිතත්, බිත්තිය දකින සිතයි අතර හිඩසක් තියෙනවා කියලා කවුරු හරි හිතනවා නම් ඒක බුදුදහම නෙවෙයි.** ඒකත් ඇත්තටම කාටහරි කියන්න පුළුවන් ආ මේ සිත් දෙකක් නේ, සිත් දෙකක් අතර හිඩසනේ කියලා. ධර්මය පැහැදිලි කරනකොට අපි ඔහොම තමයි කියන්නේ. ඕක ටිකක් ලාභාංශ පැහැදිලි කිරීමක්. ඒ කියන්නේ ධර්මය **"විවරිතෝ - විජඩිතෝ"** තවත් ගැඹුරට යනවා ඒ කියන්නේ සිත් දෙකක් අතර හිඩස හිතල ගත්තොත් ඒක සිතුවිල්ලක් විතරයි. ඒක ප්‍රායෝගික නෑ. සිත් දෙකක් අතර හිඩස දැනෙන්නේ එහෙම නෙවෙයි. ඔය සිත් දෙකක් අතර හිඩස කියලා **භවාංග** සිත් කියලා **චිත්තවිදී** කියලා පෙන්නවනේ. එතකොට ඒක ප්‍රායෝගිකව දැනෙන්නේ එහෙම නෙවෙයි. ප්‍රායෝගිකව දැනෙන්නේ ඔබතුමියට තේරෙයිද දන්නෑ කිව්වොත්. ඒ කියන්නේ සාමාන්‍යයෙන් ලොකු ගැඹුරක් තියෙනවා ඒකේ.

**"වික්ඥාණයේ ස්වභාවය තමයි අපට හැමදේම තියෙන බව පෙන්නන එක. ඒ නිසා අපිට දැන් එළිය බැලුවොත් හැමදේම තියෙන බව පෙන්නන එක. ඒ අපිට එළිය බැලුවොත් හැමදේම තියෙනවා වගේ පේන්නේ, සිත නේ මේ පෙන්නන්නේ, මේසෙ, පුටුව, ඇඳ, ගහකොළ ඔක්කොම. හැබැයි, ඒ හැමදේටම අදාළ ඒ එකකටවත් අයිති නැති ස්වභාවයක් දැනෙන්න ගන්නවා. අන්න ඒ ස්වභාවය තමයි මේ කියන අවධිමත් ස්වභාවය. හීනෙන් නැගිටිනවා වගේ ස්වභාවයක්. හරියට වළාකුළු ඔහේ ගලනවා. සිතුවිලි ඔහේ ගලනවා. සිතුවිලි නවතින් නෑ, සිතුවිලි නැති මොහොතක් නෑ. මොකද ආශ්වාස - ප්‍රාශ්වාස වෙනකම් සිතක් ඉපිද නිරුද්ධ වෙනවා.**

හැබැයි සිතුවිලි වළාකුළු වගේ ගැලුවට, ඒ වළාකුළු වලට ඔබ්බෙන් තියෙන අවකාශයේ, වළාකුළු කියන්නේ සිතුවිලි. වළාකුළු වලට ඔබ්බෙන් තියෙන **අවකාශය තමයි අන්න අර අවදිය.** ඒක කවදාවත් හිතලා ගන්න බෑ. **ඒ ස්වභාවයට පත්වෙනකොට, ඒ පත්වීම තුළයි අර ලුණු වගේ දැනෙන ස්වභාවයක් එනවා. ඒ ස්වභාවය තුළ "දර්ශනයට පත්වෙනවා."** ඒක

කවදාවත්ම හිතලා ගන්න බෑ. **හිතලා ගත්තොත් විඤ්ඤාණ මායාවක්මයි.** ඒ. ස්වභාවයට පත්වෙනවා කියන එක ප්‍රායෝගික පැත්තෙන් වෙනම දෙයක්. ඒක මේ ධර්මය අවබෝධය තුළින් ඇතිවෙනවා. මෙනෙහි වෙනකොට නුවණට අසුවෙනවා. "ඒ තුළ තමයි ඇත්තටම ඒ **සාන්දිට්ඨික, ප්‍රතක්‍ෂ ධර්මය හමුවන්නේ"** හැබැයි ඒක සිතන තරම් බොළඳ තැනක නෑ. ඒක මහා ප්‍රඥාවක්. සමථ භාවනාව කියන්නේ වේදය තුළ නිමිත්තක් අල්ලගෙන "උග්ගහ නිමිත්ත, පටිභා නිමිත්ත කියලා සමාධිවලටනේ යන්නේ, හුස්ම නොදැනෙන ස්වභාවයට එනවනේ. එතකොට අසංඥ තලයට යනවනේ. එතන නිවන් මඟක් නෑ, විදර්ශනාවක් නෑ. ඔය ගොඩක් අය කියනවනේ අභ්‍යන්තරයේ සිත නොදැනෙන ස්වභාවයට යනකොට ආලෝක ස්වභාව වලට ඇවිල්ලා ඔය නිකන් බුබුළු බුබුළු වගේ ඇවිල්ලා නැතිවෙන ස්වභාවේ කුඩුවෙලා ගිහිල්ලා පාවෙන ස්වභාවයකට එනවා. අපිත් අවුරුදු 30 ක් විතර භාවනා කළා. ඒව ගැන හොඳ අවබෝධයක් අපට තියෙනවා. අපි අරූප ධ්‍යානවල හිරවෙලා කරගන්න දෙයක් නැතුව හිටියේ. ධ්‍යානවල හිරවෙලා අන්තිමටම බුදුන් වහන්සේටත් වැරදුනා නේද ? කියලා වැටහුනේ. අන්න එතකොට තමයි අපි විදර්ශනාවට යොමු වුණේ. මොකක්ද බුදුන් වහන්සේ ලෝකෙට හෙළි කළේ කියලා. අපි හිතුවා, ඔය සමථය වඩන අය හිතනවා නම් නාම - රූප වෙන් කරන්න සමථය තුළ ඇතුලේ මේ රූපය කියලා, මේ නාමය කියලා. මහාම මහා මුලාවක්. කවදාවත් නාම - රූප ඒ විදියට දකින්න බෑ.

මේකෙ පළවෙනිම තැන තියෙන්නේ **මේ සිත හැදෙන හැටියි අවබෝධ කරන්න තියෙන්නේ. "පටිච්ච සමුප්පාදයයි"** අවබෝධ කරන්න තියෙන්නේ. බුදුන් වහන්සේ රූප ධ්‍යානවල හිටියනේ, සිද්ධාර්ථ තාපසතුමා විදියට රූප ධ්‍යානවල හිටියනේ. ඊට පස්සේ බුදුන් වහන්සේ ආලාරකාලාම, උද්දකරාම පුත්‍රගෙත් අරූප ධ්‍යානවල හිටියනේ. හැබැයි ඒ අරූපය තුලවත් ආත්මය නැති වෙන්න නෑ. සත්ව පුද්ගල ස්වභාවය නැති වෙන්නේ නෑ. ඒක නිසා තමයි බුදුන් වහන්සේ ගුරුවරු අත හැරියේ. **බුදුන් වහන්සේ පටිච්ච සමුප්පාදය මෙනෙහි කළා.** ඒ කියන්නේ හිත හැදෙන හැටි බැලුවා. **මේ සිත නිසා නේද මේ දුක එන්නේ. සිත අවබෝධ කරොත් දුක අවබෝධ වෙනවා නේද ? කියලා. බුදුන් වහන්සේ දැක්කේ එතනින්.** ඒක හරි, මේ සිත අවබෝධ කරගන්න එකයි පටිච්ච සමුප්පාදය අවබෝධ කරා කියන්නේ. **මැජික් කරන හැටි දැනගත්තොත් මැජික්වල මැජික් නැතිවෙනවා.** මැජික් කියන්නේ මේ **විඤ්ඤාණ මායාව.** එයා මැජික්කරුවෙක් වගේ මැජික් එකක් වගේ මේවා මැවෙනවා. එක එක ඒවා අර මැජික් කරන හැටි මැජික් හැදෙන හැටි දැක්කොත් තමයි අපිට මේ මායාවට **නොරැවටෙන්න පුළුවන්.**

අන්න එහෙම **වුනොත් තමයි අර අවදිය ඇතිවෙන්නේ.** මායාවට රැවටිලා ඉන්නකම් ඒ අවධිය අපට දකින්න බෑ. **ධම්ම චක්ඛුෂය එතකම් අවදිවෙන්නේ**

**නෑ.** මේක ප්‍රත්‍යක්ෂ ධර්මයක්. ප්‍රායෝගික දේශනා ගොඩක් තියෙනවා. **සෝතාපන්න මාර්ගයට - ඵලයට, අනාගාමී මාර්ගයට - ඵලයට, ඒ අත්දැකීම් අපේ අත්දැකීම් වෙනමම දේශනාවල තියෙනවා.** දේශනා 600 ක් තියෙනවා අපේ දේශනා විදියට, එතකොට ප්‍රායෝගික මාර්ගයේ කටයුතු කරනකොට කෙනා කෙනාගේ ගැටළු විසඳන ඒවා තමයි මේ සාකච්ඡාවල තියෙන්නේ. ගොඩක් අය ප්‍රායෝගිකව, ප්‍රත්‍යක්ෂතාවය තුළ දියුණු වෙමින් පවතිනවා. ගොඩක් අය ඉන්නවා ලෝකේ වටේම දියුණු ස්වභාවයක දැන් නියතසම්බෝධිපරායණ පිරිසක් මේ **'බුද්ධෝත්පාදෝ'** දේශනා තුළ ගොඩනැඟී ගෙන යනවා. ඒක ශාසනේ පිබිදීමට ලොකු හේතුවක් වෙනවා. සෑහෙන්න වටිනවා ඒක.

**උපාසිකාව :-** අපට මේ සත්‍ය ධර්මය එළියට ආපු එක ගැන නම් ඔබ වහන්සේට පින්, අපි වැටිච්ච මුලාව

**ආර්යයන් වහන්සේ :-** "අපි ඔබතුමියගෙන් ඉල්ලන්නේ පින්දෙන එක සාමාන්‍ය පෘතග්ජන ස්වභාවයනේ. ඔබතුමිය මේ ධර්මය අවබෝධ කරගන්න. ඔබතුමියගේ **සසර දුකිනුයි මිදෙන්න ඕන.** දැන් අපේ ඵලයක්වත් ඔබතුමියට වැඩක් නෑ. ඔබතුමිය අපි මේ දේශනා කරන මාර්ගය තුළ ගිහිල්ලා ඔබතුමිය **දුකින් මිදුන් නැත්නම්** කාගෙවත් ඒවා වැඩක් වෙන්නේ නෑනේ. පුද්ගල සරණ යාම වැඩක් නෑ. බුදුන් වහන්සේ කියන්නේ ධර්මය සරණ යන්න කියලා. **"සෝ ධම්මං පස්සති - සෝ මං පස්සති" "ධම්මං විනානත්ථි - පිතාච මාතා"** ධර්මය විනා මවෙක්ද, පියෙක් ද නැත. ධර්මය කියන්නේ ඉදප්පච්චතාවය, දෙයක් නැති බව

**"ඉමස්මිං සති ඉදංහෝති - ඉමස්මිං අසති ඉදං න හෝති**
**ඉමස්මිං උප්පාදා ඉදං උප්පජ්ජති - ඉමස්මිං නිරෝධා ඉදං නිරුජ්ජති"**

මේ පටිච්චසමුප්පාද අංග **"එතන අවිද්‍යා පච්චයා සංඛාරා කියනකොට,** මේක හොඳට අහන්න ලැබෙනවා සාකච්ඡා වල අහන්න ඇති කියලා මේ අවදි ස්වභාවය මොහොත එහෙම ඔබතුමිය අහන්න විද්‍යාව සම්බන්ධව දේශනා. බුද්ධෝත්පාද අවදිය, බුධක්ෂණය, බුද්ධෝත්පත්තිය, බුද්ධෝත්පාද භවය මේ වගේ නාලිකා කීපයක් තියෙනවා. ඒ සේරම යන්නේ අපේම දේශනා. ඛජ්ජනී වග්ගයේ පෙන්නන්නේ ආත්මීය සිත හැදෙන හැටි. හැබැයි ඔබතුමියට ඒවා ගැඹුරු වැඩි නම් දර්ශන සමාපත්ති දේශනා, ඔබතුමියට දැනෙනවද බාහිර ඇත්තක් නෙවෙයි කියලා. ඔබතුමියට වැටහෙනවද ? මේ සේරම සිතුවිලි කියලා. ජේනවා නෙවෙයි, හිතනවා කියලා, මේ බිත්තිය, පොළව, ජනේල මේ හැම එකම අඹ ගහ, නා ගහ, ඔක්කොම සිතුවිලි කියලා දැනෙනවද, ඒක ශබ්දයක් කියලා දැනෙනවද ? මේ අපි කථා කරන හැම වචනයක්ම ශබ්දයක් බව.

**උපාසිකාව :-** හොඳටම දැනෙනවා හාමුදුරුවනේ, හොඳටම පැහැදිලියි. අභිධර්මය ගැන අවබෝධයක් තියෙනවා.

**ආර්යයන් වහන්ස :-** එහෙනම් මේක ධ්වනියක්. ප්‍රතිකම්පනයක් සිත හැදෙන බව, මේක තරංග සිස්ටම් එකක් බව

**උපාසිකාව :-** එහෙමයි අපේ හාමුදුරුවනේ.

**ආර්යයන් වහන්ස :-** එහෙම නම් ගොඩක් හොඳයි. එහෙම නම් මෙතන තියෙන්නේ, ධ්වනියක්, මෙතන තියෙන්නේ තරංගයක්, මෙහෙමයි සකස් වෙන්නේ. ඒ කියන්නේ පෘථිවිය කැරකෙන වේගයට මැවෙන්නේ ගුරුත්වාකර්ෂණය. ඒ කියන්නේ උත්තර ධ්‍රැවය - දක්ෂිණ ධ්‍රැවය පැය කි.මී. 180 වේගයකින් පෘථිවිය කැරකෙන නිසා තමයි මේ චුම්බකයක් වගේ මේ පෘථිවිය ධ්‍රැව දෙකක් අතර ආරෝපණයක් හැදිලා. **ඕසෝන් ස්ථරයක් ඇතුලේ වායු ස්තරයක් ඇතුලේ උණුසුම් - සීතල වීම් තුළ පෘථිවි පෘෂ්ඨයේ සිසිල් වීම තුළ විශ්වයේ තියෙන "ඩාර්ක් මැටර්ස්" කියන අංශු ස්වභාවය ඝනවෙලා වළාවක් විදියට බ්‍රහස්පති ග්‍රහයා වායුමය අවස්ථාවේ තාම තියෙන්නේ. අන්න ඒ වගේ අංශු එකට කැරකිලා ඒ වායුමය ස්වභාවය පෘෂ්ඨයක් විදියට ඝනවෙලා පඨවි ස්වභාවය ඇතිවෙලා ඒ ස්වභාවය තුල ජලය හැදිලා, පොළව හැදිලා ඒ ස්වභාවය තුළ කැරකෙන වේගය තුළ උත්තර ධ්‍රැවය - දක්ෂිණ ධ්‍රැවය, ධන - සෘණ කියන චුම්බකයක් වගේ අංග දෙකක් හැදිලා, ඒ තුළ චුම්බක ආරෝපණයක් හැදිලා, ඒ තුළ ඕසෝන් ස්තරය මේ වගේ පෘථිවියක් දැන් හැදිලා.** විශ්වයේ ශක්ති ස්වභාවය "ඩාර්ක් මැටර්ස් එනජි" කියන ඒ ස්වභාවය තුළ විශ්වයේ ශක්තියෙන් ඒ අංශු ස්වභාවය හැදුනට පෘථිවියේ තියෙන ස්වභාවය වෙනස්.

එතකොට පෘථිවියේ ස්වභාවය තමයි ගුරුත්වාකර්ෂණය ඇතුළේ අපි දැනෙන මෙන්න මේ වේගයටයි හැම එකක්ම මැවෙන්නේ. හඳුන්කූරු කරකවන කොට දුම් වලාවක් පේනව වගෙයි. **මේ වේගයට මැවෙන ඒව. වර්ණ, ගන්ධ, රස, ශබ්ද, ස්පර්ශ, සිතුවිලි හැම එකක්ම වේගෙටයි මැවිලා තියෙන්නේ.** දැන් අපි කර්ණශංක පටලය හෙල්ලෙන එකනේ අපි කියන්නේ ශබ්දය කියලා. කර්ණාංශක පටලය හෙල්ලෙන්න මොකක් හරි වේගයෙන් ඇවිල්ලා වදින්න එපැයි. එතකොට අපිට තේරෙනවා මේ වේගයක් තමයි ශබ්දය කියන්නේ තරංගයක් එතකොට ඒ විදියට තේරෙනවා. ශබ්දය කියන්නේ තරංගයක්, වර්ණ කියන්නේ තරංගයක්, තාපය කියන්නේ තරංගයක්, විද්‍යුතය කියන්නේ තරංගයක්, සිරස, දෙරණ හැම දෙයක්ම තරංග විදියට පෙන්නනවනේ. සංඛ්‍යාත විදියට හැබැයි පවතින දෙයක් නෑ. එතන එතන ඇතිවෙන නැතිවෙන ප්‍රවාහයක් **වේගය කියන්නේ.** ගඟ කියන්නේ තියෙන එකක් නොවේ, ගලනවට, වැස්ස කියන්නේ තියෙන එකක් නෙවෙයි ගලනවට, සුළඟ කියන්නේ

ගලනවට, **සිත කියන්නේ තියෙන එකක් නෙවේ ගලනවට,** මොනවද මේ **ගලන්නේ. ශබ්ද, වර්ණ, ශබ්ද වර්ණ වේගයෙන් ගලනවට තමයි චිත්තයක් කියන්නේ. ශබ්ද - රූප එකතුවෙන එකයි නාම - රූප කියන්නේ.** ඒකම තමයි **අපි මේ පැත්තේ ඉඳන් රෝස මලක් කිව්වොත් ඔය පැත්තට රෝස මලක් මැවෙනවා. මේ පැත්තෙන් ශබ්දයක් එනකොට ඔය පැත්තෙන් රූපයක් මැවෙනවා.** චිත්තය කියන්නේ ශබ්ද, වර්ණ වෙන් කරන්න බෑ. ඒකට තියෙනවා එකතු වෙලා.

අර පොඩි දරුවා ඉපදෙන කොට මුකුත් දන්නේ නෑ. පොඩි දරුවා ඉපදුනාට පස්සේ **දාන, ශබ්ද තමයි සංඛාරා කියන්නේ.** ශබ්ද, වර්ණ එකතු වෙන එක. ශබ්ද වර්ණ එකතු වෙන එක සංඛාරා, නාම - රූප එකතු වෙනවා. **ශබ්දය කියන්නේ නාමය. නම් කරන ලද දේ නාමයයි.** වේදනා, චේතනා, ඵස්ස මනසිකාර **"අයං වුච්චති නාමං වදේති"** එය නම් කරන්නේ ශබ්දෙකින්. එහෙනම් නාමය තමයි, ශබ්දය තමයි මේසෙ, ඇඳ, පොත. පුංචි දරුවා ඉපදෙනකොට මුකුත් දන්නේ නෑ. **"ස්කන්ධා නං පාතිභාවෝ - ආයතනානං පටිලාභො අයං වුච්චති ජාති" කියනකොට ඇසේ උපතයි මහණෙනි, ජාති,** කියනකොට ඇස කියන්නේ ජේන බව. එහෙනම් පුංචි දරුවට මුලින්ම **හැදෙන සිත උපමාවට ගත්තොත්, ආලෝකයක් එනකොට ඇහැට, අම්මගේ හැඩතලය කියලා ගමු. එතකොට අම් අම්මා කියලා සද්දේ දානකොට, අම්මගේ හැඩතලෙත් අම්මා කියන ශබ්දයක් එකතුවෙන එකයි චිත්තයක් කියන්නේ.** ඒකයි මේ ජේන බව ඇසේ උපතයි මහණෙනි, උපත කියලා බුදුන් වහන්සේ කිව්වේ ඒකයි. "ස්කන්ධා නං පාතිභාවෝ" කිව්වේ **වේදනා, සංඥා, චේතනා, ඵස්ස, මනසිකාර** ඔස්සේ ආයතනානං පටිලාභෝ කිව්වේ **එකතුවෙන එකයි ආයතන කියන්නේ.** ඇස කියන්නේ අම්මා කියන පෙනීම. රූපය ශබ්දය තමයි එතකොට අම්මා කියන එක. මේ වර්ණය එකතු වෙච්ච එක තමයි අම්මා කියන දෙයක් වගේ අපට දැනෙන එක.

දෙයක් කියලා දැනෙන එකමයි **විඤ්ඤාණය කියන්නේ.** වෙන්කර දැකීම, තියෙනවා කියන දැනීම, එතකොට තියෙනවා කියන **දැනීමම තමයි සංඛාරා කියන්නේ** ශබ්ද - වර්ණ එකතු වෙන එක. සංඛාරා වුනේ මොකක්ද ? **අම්මා. ඒකමයි විඤ්ඤාණය දෙයක් කරගැනීමමයි අවිද්‍යාව. දෙයක් තියෙනවා කියලා ගත්තොත් එතන කෙනෙක් ඉන්නවා. දෙයක් තියෙනවා නම් ඒකමයි මම කියන්නේ. පොතමයි මම, පොතෙන් තොර මමෙක් නෑ. පොත තියෙනවා නම් මාත් ඉන්නවා. අම්මා ඉන්නවා නම් මාත් ඉන්නවා.** සිතක් තියෙනවා නම් එතන මාත් ඉන්නවා. හැබැයි මේ නිමිත්ත කියන්නේ, අම්මා කියන නිමිත්ත ශබ්දය - වර්ණය එකතු වෙලා හැදිලා තියෙන්නේ. ඒකමයි නාම - රූප පච්චයා - විඤ්ඤාණං කියන්නේ. එහෙනම් මේ **පටිච්ච සමුප්පාදය** කියන්නේ **"අවිද්‍යා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං"** - **අන්න විඤ්ඤාණ පච්චයා නාම - රූප** කියන්නේ ඕකමයි.

අවිද්‍යාව කියන්නේ මෙතන දෙයක් කියලා දැකීම **සංඛාරා.** නාම - රූප එකතු වීම ශබ්ද වර්ණ එකතු වීම, ඒකම විඥ්ඥාණයේ දැනගැනීමයි අවිද්‍යාව. ඒකමයි ඇස කියන්නේ පේන බව, අම්මා. ඒකමයි **ඵස්ස** කියන්නේ ස්පර්ශය කියන්නේ දෙයක් කරගත්තොත්. අර වේදනා - සංඥා එකතු වෙන එක දෙයක් කරලා දැනීමයි. **ඵස්ස කියන්නේ.** මේ ඔක්කොම අරමුණමයි. මේ මොහොතේ එන අරමුණක් ගැන තමයි මේ කථාකරන්නේ. අර අම්මා කියන එක සිතක් හැදෙන හැටියි කතා කරන්නේ. **"පටිච්ච සමුප්පාදයම"** තියෙන්නේ එක ආරම්මණයක් දකින්නයි.

**"අකාලික දහමක්".** මේ ක්ෂණය දකින්නයි, ක්ෂණ සම්පත්තිය, **මේ ක්ෂණය දකින එකයි නිවන දකිනවා** කියන්නේ. ඒකට දුර්ලභ සද්ධර්මය, ධර්මය කියන්නේ දෙයක් නැතබව දකින එක. ඒ කියන්නේ **මෙතන අම්මා කියලා දෙයක් නැති බව දකින එකයි.** ශබ්ද - වර්ණ කියලා දකින එකයි. ශබ්ද - වර්ණවල ආත්මයක් නෑ කියලා දකින එකයි. **ඒකයි ධර්මය දකිනවා කියන්නේ. ඒකයි සද්ධර්මය කියන්නේ. මේ සොබාදහම අවබෝධ කරන එකයි සද්ධර්මය අවබෝධ කරනවා කියන්නේ.** දුර්ලභං සද්ධර්මශ්‍රවණං කියන්නේ ඒකයි. එහෙනම් එතන දුර්ලභං සද්ධර්මශ්‍රවණං, අන්න **"දුර්ලභං ක්ෂණ සම්පත්තිං"** මේ ක්ෂණය දකිනවා සිත හැදෙන හැටි. මේ ක්ෂණය විතරයි තියෙන්නේ. හැම මොහොතෙම සිතක් ඉපිද නිරුද්ධ වෙනවා. ආශ්වාස - ප්‍රාශ්වාස වෙනකම්ම සිතක් ඉපිද නිරුද්ධ වෙනවා. ප්‍රසාදය සිද්ධවෙනවා. **ස්පාර්ක් වෙනවා, 5 සෙන්සස් කියලා අපි කියන්නේ.** ඇස, කණ, දිව, නාසය, කය **මේවා 5 සෙන්සස්, මේ ෆයිව් (5) සෙන්සස් වල එකතුවෙන් තමයි හැදෙන්නේ, ශබ්ද - වර්ණ එකතු වෙන එකයි 'මන' කියන්නේ. මන කියලා කොහේවත් නෑ.**

මොළය ඇතුලේ තියෙන එකක් නෙවෙයි. ශබ්ද - වර්ණ එකට එකතු වෙන එකමයි මන කියන්නේ. **ඒ කියන්නේ වේදනා, සංඥා, සංඛාර, විඥ්ඥාණ කියන දැනගැනීමයි 'මන'.** දැනගන්නේ මනෝ විඥ්ඥාණයෙන්. මනෝ විඥ්ඥාණය කියලා දෙයක් කොහේවත් නෑ. අර ප්‍රසාදවීම තුළ එන වර්ණ ස්පාර්ක්, ශබ්ද ස්පාර්ක් වේගය තුළ එකට එකතු වෙන එක මනෝ විඥ්ඥාණය. සොබාදහමක් තියෙන්නේ. දැනෙන එක තමයි, දෙයක් කියලා ඒකට රැවටෙන එක තමයි, බාහිර දෙයක් තියෙනවා කියන එක **සමුදය.** එහෙම වුණොත් ඇලෙනවා - ගැටෙනවා. අපිට එනවා තියෙනවා වගේ දැනෙන අර මිලි වොට් 05 කරන්ට් එක, දැනීම, ආරෝපණය, ඒකට අපි කියනවා **'චිත්තාරෝපණය' දැනීමක්** අර චුම්බක ආරෝපණය වගේ බැඳීමක්. **"යාරූපේ නන්දි" ඒකට ඇලීම. "තදූපාදානං භවෝ" එහෙම වුනොත් භවය තියෙනවා.** පොත තියෙනවා ලෝකයක් තියෙනවා. **අන්න මේ ලෝකේ හැදෙනවා. "සලායතන ලෝකෝ ලෝකෝ"** ආයතනවලින් ලෝකය හැදෙනවා.

**බෞද්ධයෙක් කියන්නේ භව නිරෝධය, බාහිර දෙයක් නැතිබව දකින එක.** අන්න එහෙම වුනොත් නිවන් දකිනවා. එහෙම වුනොත් **එයා දුකෙන් මිදෙනවා.** බාහිර දෙයක් තිබ්බොත් ඇලෙනවා, ගැටෙනවා. තණ්හාව තියෙනවා, උපාදානේ තියෙනවා, ජාති, ජරා, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස සේරම තියෙනවා, **දුක තියෙනවා. අන්න බාහිර දෙයක් නැති බව දැකීම තුළ දුකෙන් මිදෙනවා.** මෙය ශ්‍රවණය තුළ සත්‍ය ඤාණයට එන්න ඕන. සත්‍ය ඤාණය ඇති කෙනාටයි කෘත්‍ය ඤාණය. මේ සත්‍ය කුමක්ද ? කියන එක **තමන් අසා දැනගන්න ඕන. ඒ කල්‍යාණ මිත්‍රයාගේ පණිවිඩය. මෙන්න මේ ධර්මය ඇහුනට පස්සේ තමන්ට හැම මොහොතෙම මේක දැනෙන්න ගන්නවා. ලෝකයක් නැති බව, ශබ්ද - වර්ණ බව, ආත්මයක් නැති බව, මම කියලා කෙනෙක් නැති බව තිබහයි කියන්නේ හිත වුණාට හිතට වතුර බොන්න බෑ. බඩගිනියි කියන්නේ හිත වුණාට හිතට බත් කන්න බෑ. බලන්න කටට දානවා, බඩට යනවා, එළියට යනවා.** අපි ඒකට පනවනවා මම වතුර බිව්වා කියලා. කවදාවත් මේ සිත වතුර බීලා නෑ. සිත තමයි මම කියන්නේ. වතුර බොන්න බෑ සිතට. කටට දාලා **එළියට යන ක්‍රියාවලියක් විතරයි.**

අර පුංචි දරුවා ඉපදෙනකොට පුංචි දරුවා දන්නේ නෑ. කහපාට, රතුපාට, මොන්ටිසෝරි යනකොටයි කියලා දෙන්නේ. "යෙලෝ, රෙඩ්, බ්ලූ" කියලා අවුරුදු 4 කදී මොන්ටිසෝරි යනකොට තමයි කියලා දෙන්නේ. එතකං ඒ දරුවා පාට දන්නේ නෑ. **ඒ කියන්නේ මේ හැම එකම වර්ණය පෙන්නලා ශබ්දය දාන එකයි උගන්නවා කියන්නේ. මේ "අ" යන්න බෝඩ් එකේ රූපේ ඇඳලා "අ" යන්න පෙන්නන්නේ.** දැන් ඉංග්‍රීසි ජාතිකයෙකුට අපි "අ" යන්න කිව්වට දන් නෑ. චීන ජාතිකයෙකුට "අ" යන්න කිව්වට දන්නෑ **ඇයි එයාට ඒ ශබ්දවලට රූප නෑ.** ශබ්ද වලට රූප එකතු වෙන එක තමයි සිත කියන්නේ. දැනගත්ත දේවල් තියනවා කියලා හිතාගෙන ඉන්න නිසා තමයි අපි අනුසෝතය තුළ මෙච්චර කාලයක් රැවටුනේ. ඒක තුල අපිට ගින්නක් තිබුණා. **අපි ඒක තුල දුකට වැටුණා. අපි බාහිරින් තමයි දැක්කේ දේවල් තියෙනවා කියලා. අඹ ගහ කිව්වේ නැහැ අඹ ගහ කියලා. අපියි කියන්නේ. නමුත් සුද්දෙක් ආවොත් ඒකට අඹ ගහ කියන්නෑ. සුද්දෙක් ආවොත් මෙතන "ටේබල්" "චෙයාර්" ශබ්දේ වෙනස්.** එතකොට එහෙම දේවල් බාහිර නෑ. අපේ සිතුවිලියි අප ඇසුරු කරන්නේ. **අපි සිතින් "එළියට" ගිහිල්ලා නෑ.** සිත කියන්නේ **අර ශබ්ද තරංගයි, වර්ණ තරංගයි එකතු වෙලා හැදුන චිත්ත තරංගයක්.** ඒක තුළ දෙයක් නෑ. ආත්ම කථාවක් නෑ. අන්න "දිට්ඨේ දිට්ඨ මත්තං" "සුතේ සුත මත්තං" "මුතේ මුතමත්තං" "විඤ්ඤාතේ - විඤ්ඤාණමත්තං" වෙනවා. ඇයි "දිට්ඨේ දිට්ඨ මත්තං" කියන්නේ **දුටු දෙයක් නෑ. එහෙම වුනොත් දුටු කෙනෙක් නෑ. අර දැකීම දැකීමක් විතරයි.** ශබ්දය එකතු වුනොත් දෙයක් තියෙනවා. දැන් ඔබතුමිය ඉස්සරහා මොනවද තියෙන්නේ ?

**උපාසිකාව :-** ටී. වී. එක තියෙනවා. මේසේ, කණ්ණාඩි දෙක

**ආර්යයන් වහන්සේ :-** එතකොට බලන්න ටී. වී. එක, මේසේ, කණ්ණාඩි දෙක ඔක්කොම ශබ්දයක්නේ ශබ්ද ටිකක්නේ. **දැන් ඔය ශබ්ද ටික නැතුව ඔය දිහා බලන්න.** ශබ්ද ටික **මැකුවොත්** මොකද වෙන්නේ. **චිත්‍රයක්** විතරයිනේ. අන්න ශබ්ද එකතු වුනොත් දෙයක් තියෙනවා. ශබ්ද නැතිවුනොත් ඒක '**දුටුවා නම් දුටුවා පමණි.**' වර්ණ ඕනතරම් තියෙන්න පුළුවන්. හැඩතල ඕන තරම් තියෙන්න පුළුවන්. නමුත් ඒවට දෙයක් වෙන්නේ **ශබ්දය දැම්මොත්.** ශබ්දයක් නැත්නම් දෙයක් නෑ. එහෙනම් මේ ශබ්දය කියන්නේ **ඇත්තක් නෙවෙයි.** මේක දකිනවා නම් තමන්ට වටිනාකමක් ඒකේ අගයක් **දැනෙන් නෑ.** අර ශබ්ද - වර්ණ කියලා හදාගත්ත දේ අගයක් නෑ. මේක දෙයක් කියලා ගත්තොත් ඒකේ **දුක** තියෙනවා. ඔබතුමියගේ දැන් මේ දේශනාවලට එකින් එක හොඳින් සවන් දෙන්න. ඔබතුමිය බලන්න මේ ධර්මය හොඳින් වැටහෙනව ද කියලා බාහිර දෙයක් නැති බව. ඒ දේශනා අහලා අවබෝධයක් ඇතිවෙලා බාහිර දෙයක් නැති බව දැනෙන්න ගන්නවාද ? බලන්න. **එහෙම වුනොත් ඔබතුමියට අර අවධිමත් ස්වභාවය දැනෙන්න ගන්නවා.** වෙනදා විදියටම පේනවා, වෙනදා විදියටම ඇහෙනවා, ඔබතුමිය මේක හෙමින් අධ්‍යයනය කරනකොට ඔබතුමියට වෙලාවක් ඒවි. හොඳට තේරිලා ඒවි. හොඳමයි එහෙනම්. "තෙරුවන් සරණයි."

# 7 වන දේශනය - මොහොතට අවදිය

**(මොහොතට අවදිය ප්‍රායෝගිකව - යා යුතු මාවත ලිපිනය දැනගනිමු.)**

**උපාසිකාව :-** "ආර්යයන් වහන්සේගේ ධර්ම දේශනා ශ්‍රවණය කරන්න කලින් මම හිතාගෙන හිටියේ බාහිර ඇත්ත කරගෙන. බාහිර තියෙන දේවල්වල අනිත්‍ය, දුක්‍ය තමයි අපි බැලුවේ. ඔබ වහන්සේ කිව්වා ඒ දකින සියල්ල සිතුවිල්ලක් පමණයි කියලා. සිත කියලා දෙයක් නෑ. ශබ්දයයි - වර්ණයයි එකතු වෙලා චිත්තයක් හැදෙන්නේ. සිතෙත් එහෙම දෙයක් නැති බවයි ඔබ වහන්සේගේ ධර්ම දේශනා වලින් වැටහුනේ. දැන් එන එන සිතට සත්‍ය පෙන්වනවා ස්වාමීන් වහන්ස. එහෙම කරගෙන යනකොට **බාහිර ඇත්ත වෙන** වෙලාවල් තියෙනවා. නැවතත් බාහිර බොරුවක් සිතේ ඇතිවන දෙයක් කියලා ආපහු සිතුවා. මම දැනට කරගෙන යන්නේ ඒ විදියට තමයි. ඒකේ වැරැද්දක් අඩුපාඩුවක් තියෙනවද කියලා දැනගන්න තමයි ඔබ වහන්සේට කථා කළේ."

**ආර්යයන් වහන්ස :-** "බාහිර දෙයක් නැති බව වැටහෙනවා නේද ? සිතේ මොනවද හටගන්නේ. **සිතුවිලි** තමයි අපි පරිහරණය කරන්නේ. සිත කියලා දකිනවා කියන්නේ, **සිතුවිලි බව** දකිනවා නේද ? එතකොට අපිට **ජේනවා නෙවෙයි හිතනවා.** ඒකත් හිතනවද ? හැම මොහොතෙම සිහියෙන් නම් ඉන්නේ **හැමදේම සිතුවිලි කියලා දැනෙනවා නම් ඒක තමයි දියුණුව.** අපි හිතමු අපි **බාහිරට යනවා කියලා. ඒකටත් සිහියක් තියෙනවනේ. ඒක ඇත්ත වුණ බව දන්නවනේ. ඒක තමයි අධ්‍යාත්මික දියුණුව.** අධ්‍යාත්මක දියුණුව කියන්නේ මුකුත් නොකරන එකක් නෙවෙයි. ආධ්‍යාත්මික දියුණුව කියන්නේ **සිහිය දියුණු වෙන එකයි."**

"සිතුවිලි කියලා දකින්නත් සිහියක් තියෙන්න ඕනනේ. අන්න ඒ සිහියයි දියුණු වෙන්නේ. "**ඤායස්ස අධිගමාය". ඤාණයයි දියුණු වෙන්නේ.** ඒ වටහා ගැනීම හරියට වතුරේ පාවෙනවා නෙළුම් කොළයක්, කූඹියෙක් වතුරට වැටෙනවා. මේ වතුරට වැටුණු කූඹියා නෙළුම් කොළේ උඩට නගිනවා. කූඹියා හිතනවා **බේරුණා කියලා දැන්.** උපමාව තමයි දැන් සිතුවිලි කියලා **හිතන එක තමයි** නෙළුම් කොළේ උඩට එනවා කියන එක. කූඹියා තමයි **හිතනවා කියන එක,** එතකොට කෙනෙක් ඉන්නවනේ. දැන් මම ඉන්නවනේ. දැන් කූඹියා වැටෙනවානේ වතුරට. වැටිලා ඉන්නේ කූඹියා, පීනපීනනේ ඉන්නේ. හවුහරණක් නැතුවනේ ඉන්නේ. එතකොට හවුහරණක් විදියට කූඹියාට නෙළුම් කොළේ හම්බවෙනවා. ඒ කොළේ උඩට කූඹියා නගිනවා. ඒ උපමාව දුන්නේ **බාහිර ඇත්ත නෙමෙයි කියන්න.** බාහිරේම පීන පීන ඉන්න එක්කෙනා මේ වතුර නෙමෙයි මීට වැඩිය හොඳ තැනක් තියෙනවා කියලා හිතලා නෙළුම් කොළේ උඩට නගිනවා. දැන් සිතුවිලි තමයි කියලා හිතනවා. බාහිර නෙමෙයි කියලා

හිතනවා. දැන් නෙළුම් කොළේ කඩාගෙන වැටෙනවා ගලක් හරි මොකක් හරි වතුරට වැටුණ ගමන්. **දැන් ආයෙමත් වතුරෙමයි.** ඒ කියන්නේ එහෙම හිත හිතා ඉන්න එක නෙමෙයි මේ මාර්ගය කියන එක. ඒක එක්තරා අවදියක් විතරයි. එතකොට දැනෙනවා මේ වතුරෙන් උඩට එන්න ඕන කියලා කියන එක, සිතුවිලි කියලා දකිනවා. **මේ බාහිර ඇත්ත** කරගන්න එක **වතුර වගේ.** වතුරේ ඉන්නවා වගේ. වතුරේම මේ ඕඝයට ගහගෙන යනකොට මේ කුඹියාට **පිළිසරණක් නෑ.** බාහිර **ඇත්තවෙලා ඉන්නකම්** පිළිසරණක් නෑ."

"නෙළුම් කොළේ හම්බවුණාම කුඹියා හිතනවා දැන් මට පිළිසරණක් ලැබුණා කියලා. හැබැයි මොකක්ද වෙන්නේ. ඒකත් කඩාගෙන ඇතුළට වැටෙනකොට තේරෙනවා. **මේ සිතුවිලි කියලා.** හිතපු එකක් නෙමෙයි මේකේ තියෙන්නේ කියලා, ඊටත් වැඩිය හොඳ පිළිසරණක් තියෙන්න ඕන කියලා. ඔන්න මේ නෙළුම් කොළේ උඩට ආපු එක කුඹියෙකුට **සිහියක් එළඹෙනවා මේකත් හෙල්ලෙනවා නෙළුම් කොළේ** මේකත් ඇත්තක් නෙමෙයි කියලා. දැන් කුඹියා බලනවා දැන් කලබල වෙලා මින් එහාට යන්න තැනක් තියෙනවද කියලා. අන්න කුඹියාට **නෙළුම් කොළේ නැට්ටක්** අහුවෙලා නැට්ට දිගේ යනවා. මාර්ගයක් අහුවෙලා **මාර්ගය දිගේ** යනවා. දැන් නෙළුම් කොළේ නැට්ට දිගේ යද්දී හම්බවෙනවා **ගොඩබිමක්.** ඒ කුඹියා විතරයි **බේරෙන්නේ.** එතකොට සිතුවිලි කියලා හිතන එකෙනුත් **පලක් වෙන් නෑ.** නෙළුම් කොළේ කඩාගෙන වැටෙනවා. ඒ කියන්නේ ඒකත් බොරුවක් බව, සිතත් බොරුවක් බව, ඒක තමයි උපමාව. ඔය සිතුවිලි කියලා අපි හිතුවට, සිතුවිලිත් ඇත්තක් නෙමෙයි. බාහිරයි කියලා හිතන එක තමයි **රූපේ අන්තෙ ඇත්ත කරගෙන ඉන්න එක, හැබැයි** සිතුවිලි කියලා හිතන එක තමයි **නාමය ඇත්ත කරගෙන ඉන්න එක.** ඔය නාම - රූප දෙකම බොරුවක් කියලා **දකින** කෙනා තමයි **සිතින් මිදෙන්නේ.** අන්න ඒ කෙනා **ලෝකෙනුත් මිදිලා, බාහිරිනුත් මිදිලා, සිතෙනුත් මිදිලා** අන්න එයා **නිවන් දකිනවා.** කවදද ඔබතුමිය ඕක කරන්නේ. හැමදාම හිත හිත ඉන්නවා මේක බාහිර නෙමෙයි කියලා හිත හිත ඉඳලා මැරිලා යනවා. එහෙමද?"

**උපාසිකාව :-** නෑ, ස්වාමීන් වහන්ස ! ශබ්දයයි - වර්ණයයි එකතු වෙලා තමයි මේ චිත්තයක් හැදිලා තියෙන්නේ. චිත්තයත් බොරුවක්, එතනත් මායාවක්, සිත කියලා දෙයක් නෑ කියන එක මට අවබෝධයි.

**ආර්යයන් වහන්ස :-** අපි ඒක ඉතිං කියනවනේ ධර්මයේ - ඒක ඇහෙන්න එපාය. ඒක දැනුමක්. නමුත් ප්‍රශ්නේ තියෙන්නේ අසා දැනගත් ධර්මය ප්‍රායෝගිකව තමන්ට දැනෙන්න ඕන. **"ජානතෝ - එස්සතෝ"** කියපු එක. හිතන එක සිතුවිල්ලක්නේ. ගොඩබිමක් ඇතියි කියලා දැන් හිතනවා. මාර්ගයේ **යන්නේ නෑ.** නැට්ට දිගේ යනවා. **ගොඩබිමට යන්නේ නෑ.** ගොඩබිමක් ඇති කියලා ඒ වුනාට හිතනවා. ඒ වගේ තමයි හිත හිතා ඉන්න එක. තමන්ට

වෙනදේට අරමුණට **සිහිය පවත්වන කෙනාට** විතරයි **මාර්ගය** හමුවෙන්නේ. දැන් සිහියත් තියෙනවනේ. **දැන් මෙහෙම මෙහෙම හිතන බවටත් සිහියක් තියෙන්න ඕන. බාහිර ඇත්ත නෙමෙයි කියලා හිතපු බවටත් සිහියක් තියෙනවනේ. බාහිරින් මිදෙන බවටත් දැනෙන සිහියක් තියෙනවනේ. අන්න ඒ සිහියට එන්න ඕන ඉස්සෙල්ලම. මිදෙන බවට දැනෙන සිහියක් එක්ක යන්න ඕන ගමනක්. මිදි මිදී යන්න ඕන. සිහියක් එක්ක යන්න ඕන. සිහිය තමයි මෙතන බල ගැන්වෙන්න ඕන. සිතුවිලි නෙමෙයි.**

මේ සිතුවිලි බාහිරට යනවා කියන එකට සිහියක් තියෙනවා කියන්නේ දියුණුයි කියන එකනේ අපි කිව්වේ. අන්න එතකොට සිතුවිලි **බාහිරේට** යන එක **අඩුවෙන** බවටත් සිහියක් තියෙන්න ඕන. ඒ ටික දැනෙන්න ගනීවි ඔය විදියට යනකොට, ඒක එක දවසින් වෙන්නේ නෑ. "**ක්ෂය ධම්ම - වය ධම්ම**" සංඛාර ධම්මා. මේ නිතර නිතර දැකලා ඇත්ත කරගත් ලෝකේ ආයෙමත් නැවත නැවත බොරුවක් බව **දකිනකොටයි මිදෙන්නේ.** ඒකයි අර බාහිරට යන්නේ තාම. දැන් ඕකට බුදුන් වහන්සේ දක්වලා තියෙනවා. "**හදපු පාරු නෑ මහණෙනි, පාරුව සාදාගෙනයි යා යුත්තේ**" කිව්වේ ඒකයි. මෙතන සියල්ලම පැහැදිලි කරනවා. සිතුවිල්ලක් කියලත් සිහියක් තියෙනවා, බාහිරය නෙමෙයි කියලා හිතනවා, හිතන බවටත් සිහියක් තියෙනවා, හැබැයි බාහිරින් මිදෙන බවටත් සිහියක් තියෙනවා. **එහෙම හිත හිත යනකොට,** අන්න එයාට මාර්ගය හම්බවෙනවා කියන්නේ, **අර සිහියත් එක්ක තමන්ගේම අර බාහිරට යන ස්වභාවය දිය වී ගෙන යන ස්වභාවය දැනෙන එකයි මාර්ගය.** අන්න එතනයි "**ඤායස්ස අධිගමාය**" ඤාණය හරහා යන ගමන. අන්න ඒකට **සිහිය එළඹගන්න.**

දැන් සාමාන්‍යයෙන් හිතන එකයි **දකින එකයි,** අර දැක්කට පස්සේ **මිදෙන එකයි** කාරණා 02 ක්. පිහිය **අතුල්ලන** එකයි, පිහිය **මුවහත් වෙන** එකයි දෙකක්. පිහිය මුවහත් වෙන එක **හිතලා කරන්න බෑ.** පිහිය මුවහත් වෙන එක **ඉබේම** සිද්ධ වෙන දෙයක්. අපි කරන්නේ පිහිය අතුල්ලන එක. සිතුවිලි දිහා බලලා ඇත්ත **දකින එක, මෙනෙහි කරන එක. ඒකේ සත්‍ය දකින එකයි, එන අරමුණු** මෙනෙහි වෙනවා වගේම "**ධම්මට්ඨිති ඤාණය**" යයි මෙනෙහි වෙන්න ඕන. හැම තිස්සෙම හිත පිරිසිදු වෙන්න ඕන. එයා ධර්මය මෙනෙහි වෙන්න ඕන. එයාට මේක පිරිසිදු කරගන්න ඕන. මේ ධර්මය තුළ තියෙනවනේ අපට මේ දිව්‍ය ලෝකයක් තියෙනවා, නිරයක් තියෙනවා, මේ දරුවොත් ඉන්නවා. ගෙවල් දොරවල් තියෙනවා, ඔක්කොම තියෙනවා වගේ ගතියක් එනවා, මේ මම **ඉන්නවා කියා ආත්මීය ගතියක් එනවා, මම ඉන්නවා වගේ දැනෙන වගේ එකක්** තියෙනවනේ. "**ධම්මට්ඨිති ඤාණය**" පිරිසිදු වෙනවා කියන්නේ අන්න ඒ වගේ තමන්ට ආත්මයක් **නැති බවට** පිරිසිදු දැනුමක් අවබෝධයක් ඇතිවෙනවා. **මෙනෙහි කිරීම තුළින් ඒක වෙන්නේ.**

ඊට පස්සේ තමන්ට දැනෙනවා එදිනෙදා කටයුතු කරනකොට ආත්මීය ස්වභාවය **දියවීගෙන ගිහිල්ලා.** අන්න ඒකයි මුවහත් වෙනවා කියන්නේ. සිහියට ඒක **අසුවෙනවා කියන එකයි** අධ්‍යාත්මික දියුණුව. "කෙනෙක් නෑ, සත්වයෙක් නෑ, පුද්ගලයෙක් නෑ, ස්වභාදහමට **දිය වී යන බව,** ඛෂය ධම්ම - වය ධම්ම වනවා කියන එක. ආශ්‍රව කෙලෙස් දියවෙනවා කියන්නේ ඒකමයි. **ඛෂය ධම්ම - වයධම්ම** ආත්මීය දැනීම දියවෙනවා කියන්නේ ඒකමයි. **කම්පන - චංචල** නැතිවී දියවෙනවා කියන්නේ ඒකමයි. රාග, ද්වේශ, මෝහ දියවෙනවා කියන්නේ, ඔය ඔක්කොම එකම කාරණයක්, වචන ගොඩක් වුණාට. අර්ථ ගැන්වෙන්නේ එකම කාරණාවයි. දැන් ඒ මාර්ගය හම්බවෙලා තියෙනවා. දැන් ඤාණය අවදිවෙන්න ඕන. **නියත සම්බෝධිපරායනයි.** නිවනින්මයි සැනසීම ලබන්නේ. මොකද ගඟට ඇලවුණු ගස ගඟටම වැටෙන්නා සේ යමෙකුට මේ ලෝකයේ සත්‍ය ධර්මය වැටහේ නම් **ඔහු මේ ලෝකයෙන් මිදෙනවා කියන එකමයි, නිවන් දකිනවා කියන්නේ.**"

"නියත සම්බෝධිපරායණ වෙන්නේ ටිකෙන් ටික. රාග, ද්වේශ, මෝහ කෙලෙස් දිය වී ගෙනයන බව **තමන්ට දැනෙනවා.** තමන්ගේ රාග, ද්වේශ, මෝහ **තියෙනවා කියන්නේ** තමන් සසර දුකට **වැටෙනවා.** තමන්ට ඊර්ෂ්‍යාවක් දැනෙනවා නම්, ද්වේශ දැනෙනවා නම්, වෛරයක් දැනෙනවා නම්, තමන් තවම **සසර ඕඝයට,** වතුරට වැටෙන්න **ඉඩ තියෙනවා.** එහෙනම් මේක බොහොම පරිස්සමින් යන්න ඕන ගමනක්. කාටවත් මේකේ සෙල්ලම් කරන්න පුළුවන් කමක් නෑ. මොකද මේක අතුරේ යනවා වගේ ගමනක්. පය ලිස්සුවොත් වැටෙනවාමයි. ඒ නිසා සත්‍ය ධර්මය තුළ තමන් සත්‍යයට අවදිවෙලා. ඒ විදියටම සත්‍ය, සත්‍ය විදියටම දකින්න **තමන්ට විශාල නුවණක් පහළ** වෙන්න ඕන. තමන්ට කොයි තරම් දුරටද යථාර්ථයක් විදියටද සත්‍ය දැනෙන්නේ ඇත්තක් විදියට. අන්න ඒ ඍජුභාවයටයි **නියත සම්බෝධිපරායන වෙන්නේ, විචිකිච්ඡා සැකය දුරුවෙන තැනයි.** නැත්නම් දිව්‍ය ලෝකෙත් තියාගෙන මේකත් අරකත් තියාගෙන මේ ඔක්කොම තියාගෙන මේ ගමන යන්න බෑ."

"දැන් වැටහෙනවා නේද ? අපි මේ තරම් දේශනා කන්දරාවක් දාන්න හේතුව, මේ සමාජය දෘෂ්ටි කාන්තාරයක්. දෘෂ්ඨි උලක්. දෘෂ්ඨි ගොඩක් බුදුන් වහන්සේ තමයි දේශනා කරන්නේ. **බුදුන් වහන්සේ දේශනා කරනවා අතීත, අනාගත, පච්චුප්පන්නාවා, ඕලාරිකාවා, සුකුමාවා, හීනාවා, ප්‍රනීතාවා, දුර වේවා, ළඟ වේවා, සන්ති බේවා මේ ස්කන්ධ දුක්ඛා කියලා.** මේ ස්කන්ධ කියලා පැහැදිලි කරනකොට මේ දේවල් තියෙන්නේ කියලා, **සිහිකරන කොටනේ ඔක්කොම තියෙන්නේ.** අතීතයක් තියෙනවා, අනාගතයක් තියෙනවා, වර්තමානයක් තියෙනවා, හීන දේවල් තියෙනවා, ප්‍රණීත දේවල් තියෙනවා, හොඳ දේවල් නරක දේවල් තියෙනවා, දැන් අපිට **ලෝකයක්** තියෙනවනේ. **අතීතයක් මට තියෙනවානේ, අතීතයේ මගේ දරුවෝ හිටියනේ, අතීතයේ මම**

**හරි දක්ෂයි, මේවා කරලා තියෙනවා. ඔන්න ඕවා තියෙනකම් අපිට ආත්මයක් තියෙනවා. දැන් අනාගතයක් ගැන හිතනවා කියන්නේ ආත්මයක් තියෙනවා."**

මේ මොහොතෙමයි හැම දෙයක්ම තියෙන්නේ, මේ සිතම, ඒකටයි **ක්ෂණ සම්පත්තිය කියන්නේ.** මේවා හොඳින් ගලපන්න. තමන්ගේ **දැනෙන** ස්වභාවය, **හිතන** ස්වභාවය දෙකක්. කෙනෙක් හිතන්න පුළුවන් මේ මොහොත විතරයි කියලා දැනුමට. නමුත් අතීතය ගැන හිත හිතා ඉන්නේ වෙන්න පුළුවන්. ඒ නිසා බොහොම පරිස්සම් වෙන්න ඕන. **අතීතය සිහිවෙන කොටම ඒකට තමන්ට සිහියක් එළඹෙන්නත් ඕන. මේ තලු මරන්නේ, අවුස්සන්නේ ගඳ ගහන කුණු ගොඩක් කියලා. ඔය ආත්මයක් කියන එකක් අපට නිරූපණය වෙන්නේ පෙර සංඥා** නිසා. **මේ ආරෝපණ ඇතුළේ ඒකත් හේතුවක් වෙලා තියෙනවා අපිට ආත්මීය දැනීම චිත්තාරෝපණය ඇතිවෙන්න.** මෙතන **කරන්ට්** එකක් වගේ ඉපදිලා තියෙනවා **හරියට** චුම්බක ශක්තිය වගේ, විද්‍යුත් ශක්තිය වගේ, **චිත්ත ශක්තියක් ඉපදිලා.** ඒක වෙන්නේ මේ සිතුවිලි නැවත නැවත **ගලන ගැලීම** නිසයි. ඒකේ තියෙනවා **නැවත** හටගන්නා ස්වභාවය. **දැනෙන ගතියක්** තියෙනවා ලෝකේ තියෙන බවට. ආත්මීය දැනීම **ක්ෂයවීගෙන** යන එක තමයි අපේ රාග, ද්වේශ, මෝහ කෙලෙස් දිය වී ගෙන යන එක.

**උපාසිකාව :-** ස්වාමීන් වහන්ස, අපි ඇස, කණ, නාසය ආයතන 5 ම ඇසුරු කරන්නේ සංඥාවක් නේද ?

**ආර්යයන් වහන්ස :-** සිත කියන්නෙම **සංඥාවක්.** සිත කියලා දෙයක් නෑ. සිත කියන්නේ **ඇතිවෙලා නැතිවෙලා යන දෙයකට.** අරමුණු, නිමිති කියන්නේ ඇතිවෙලා නැතිවෙලා යන ස්වභාවයකට. අරමුණු නිමිති කියන්නේ සංඥා තමයි. සිත කියන්නේ ගඟ ගලනවා වගේ, හටගන්නවා කියන්නේ වේගයකටයි සකස් වෙන්නේ. වේගය කියන්නේ ආලෝකය, ශබ්දය, වර්ණය එකතු වෙලා හටගන්නේ. ස්පර්ශ වෙනවා **5 (ෆයිව්) සෙන්සස්** කිව්වේ ඒකයි. ප්‍රවාහයක් ගඟ ගලනවා වගෙයි. මේ එකක්වත් ඇවිල්ලා එක මොහොතක්වත් තියෙනවා නොවේ, වේගයක් තුළ මැවෙන එකක්, හේතු නිසා හටගන්නවා කියන්නේ, හේතුව නම් **ශබ්දයයි, වර්ණයයි, උණුසුම, සීතල, තද ගතිය** ප්‍රසාදවීම ආයතන ඔස්සේ එන සළායතන එතන කෘත්‍යයක් තියෙනවා. දැන් හොඳින් මනාකොට කියනදේ තේරෙනවා. මේවා වැඩිය බර කළොත්, වචන ඒකයි සරල කරලා කියන්නේ. තමන්ටම දැනෙනවා **මේ ස්වභාදහමක් නේද ? කියලා.** අන්න ඒ ස්වභාදහමට දියවීගෙන යනකොට කෙනෙක් පුද්ගලයෙක්, ආත්මයක් දැනෙන්න බෑ.

දැන් ඔබතුමිය බලන්න මොනවා හරි දෙයක් බලන් ඉන්නවා නම් එතන ඒ දේ පේනවා කියන එක වර්ණ හැඩතලයක් විතරක් වෙලා, ඒක දෙයක් කියන එක දියවෙලා යනවාද කියල. සාමාන්‍යයෙන් මේ ධර්මය අවබෝධ වෙනකොට

අවිද්‍යාව **ප්‍රහීන වෙනවා** කියන්නේ මේ සත්‍ය එයාට අවබෝධ වෙනකොට එයාට මෙනෙහි වෙනවානේ. එයාට 'ධම්මට්ඨිති ඥාණය' වැඩෙනවානේ, එයාට **බොජ්ඣංග වැඩෙනවානේ. දැනුමට එනකොට ශ්‍රැතමය ඥාණය එනකොට මේ ලෝකයේ හරයක් නැති බවත් මිදුණු ස්වභාවයක් දැනෙන්න ගන්නවා.**

ඒක අර සිතුවිලි බලනවා කියන එක නෙවේ. **දැනෙන ස්වභාවයට සිහියක් එළඹෙනවා. අන්න ඒ සතිය තමයි සම්මා සතිය කියන්නේ.** ඉන් එහාට තමයි **සම්මා දිට්ඨිය** තියෙන්නේ. සම්මා දිට්ඨිය තියෙන කෙනාට තමයි **සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා ආජීව, සම්මා කම්මන්ත, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි.** ආර්යය අෂ්ඨාංගික මාර්ගය කාටවත් හමුවන්නේ නෑ, කාම භූමියේ ඉන්නකන්. එයාට ආර්යය අෂ්ඨාංගික මාර්ගය හමුවෙනවා, **නාම - රූප පරිච්ඡේදයට,** මේ ලෝකේ සත්‍ය නොවන බව දකින කෙනාට විතරයි. **"විනෙය්‍ය ලෝකේ අවිද්‍යා දෝමනස්සානං - කායේ කායානුපස්සතී විහරති"** කිව්වේ අන්න සතර සතිපට්ඨානය හමුවන්නේ, ආර්යය අෂ්ඨාංගික මාර්ගය හමුවීමයි, **සතර සතිපට්ඨානය** කියන්නේ එකම කථාවයි.

"අන්න ඒ කෙනා දන්නවා මේ ලෝකේ **ඇත්තක්** නෙවෙයි කියලා. ඒක දකින්න තමයි කායානුපස්සනාව වඩන්නේ. එතකොට ඉන්ද්‍රියපරේ පරියත්ථ භාවනා කියන්නේ ධාතු මනසිකාරය, ඉන්ද්‍රිය භාවනා, ආනාපානසති භාවනාව, නවසීවතික භාවනාව. අන්න **"අත්ථි ඉමස්මිං කායේ කේසා, ලෝමා, නඛා, දන්තා, තචෝ, මංසං, නහාරූ, අට්ඨී, අට්ඨී මිංජා, වක්කං, හදයං, යකනං, කිලෝමකං, පිහකං, පප්ඵාසං, අන්තං, අන්තගුණං, උදරියං, කරීසං, මත්ථලුංගං** කියනකොට දෙතිස් මහා කුණුපවලට බෙදලා බලනකොට මේ ශරීරයේ ආත්මයක් තියෙන තැනක් නෑ මේකේ. මේ ලෝකේ ඇත්තක් නොවන බව, ඒ කියන්නේ කෙනෙක් පුද්ගලයෙක් නැති බව, එහෙනම් දෙයක් **තියෙනවා නම්** තමයි මමත් ඉන්නේ. එහෙනම් ධාතු මනසිකාරය වඩන කොටත් **පඨවි, ආපෝ, තේජෝ, වායෝ වලට මේවා සේරම වෙන්වෙලා ගියාම කෙනෙක් හම්බ වෙන්නෑ."**

සත්ව පුද්ගල කථාවක් නෑ, පඨවි, ආපෝ, තේජෝ, වායෝ වලට දියවෙලා ගියාම. ඇත්තටම කායානුපස්සනාව වඩනවා කියන්නේ **කෙනෙක් නැතිබව දකින්න.** ඒකයි කායේ කායානුපස්සී විහරතී. **"විනෙය්‍ය ලෝකේ අවිද්‍යා දෝමනස්සානං - කායේ කයානුපස්සී විහරතී"** විහරණයට යන්නයි. "විනෙය්‍ය ලෝකේ" ලෝකයක් නැති බව දකින්නයි. එහෙනම් මේ ධර්මය වඩනවා කියන්නේ. මෙනෙහි කරනවා කියන්නේ. සතර සතිපට්ඨානය වඩනවා කියන්නේ ඇත්තටම **සත්ව පුද්ගල දෘෂ්ඨියෙන් මිදෙනවා.** එහෙනම් තමන් දෙයක් දකිනවා නම් බාහිර හරි දකිනකොට, එතන දෙයක් වගේ **දැනෙනවා නම්** එතන ආත්මීය දැනීමක් තියෙනවා. පොතක්, මේසයක්, ඇඳක් දෙයක් කියලා ගත්ත තැනමයි

**මමත් ඉන්නේ.** මේ පොතක් කියලා ගන්නෙම ආරම්මණයක්, එතකොටම, ශබ්දයයි, වර්ණයයි එනකොටම අපට දෙයක් වෙලානේ, එතකොට මම කියලා වෙන කෙනෙක් හම්බ වෙන්නේ නෑනේ. **ඔතනමයි මම, පොතමයි මම. පොත තියෙනවා කියන්නේ මම ඉන්නවා කියන එක.**

හැබැයි අපට මේ ප්‍රායෝගික පුහුණු වෙනකොට, පොත, මේසෙ, ඇඳ සාමාන්‍ය විදියටම පේනවා. **නැති වෙන්නේ නෑනේ, අන්ධ වෙන්නේ නෑනේ.** එතකොට ශබ්දත් ඇහෙනවා, **බීරි වෙන්නෙත් නෑනේ, හැබැයි 'දිට්ඨේ දිට්ඨ මත්තං' කියන තැනට එනවා.** ඒ කියන්නේ වෙනදා විදියටම පේනවා වුණාට **කිසිවකටත්, අයිති නැති ස්වභාවයක්, වටිනාකමක් නැති ස්වභාවයක් දැනෙනවා. ශූන්‍ය ස්වභාවයක් දැනෙන්න ගන්නවා. අන්න ඒ ස්වභාවයට පත්වෙන එක තමයි මොහොතට අවදිය කියන්නේ.** ඒ ස්වභාවයට පත්වෙන්නේ රාග, ද්වේශ, මෝහ කෙලෙස් ප්‍රහීන වන ස්වභාවය අනුවයි. එතකම් ඒක ටිකින් ටික මතුවෙවී එනවා. මේ මොහොතට අවදිය කියන එක මතුවෙවී එනවා, කෙනාගේ කෙනාගේ දියුණුව මත තමයි ඒ අවදිය ප්‍රකට වෙන්නේ, ඒ ආශ්‍රව කෙලෙස් දියවෙන මට්ටම අනුවයි. ඒ අනුවයි **සෝතාපන්න, සකෘදාගාමී, අනාගාමී, අරහත්වයට පත්වෙනවා කියන්නේ.** දැන් ඔබතුමිය දන්නවා, යා යුතු මාවත, ලිපිනය. බොහොම පරිස්සමින් කටයුතු කරන්න, මේ දේශනයම ඇති. නැවත නැවත **ඇහුවත්** මාර්ගය හොඳින් දන්නවා, හරියට ලිපිනය ලියාගත්ත වගේ, ඉතාම වටිනවා, මේක. නැවත නැවත ලිපිනය **අමතක නම්** ඒක අහලා බලනකොට වැටහෙනවා මේකයි වෙන්න ඕන කියලා. හොඳයි එහෙම නම් තෙරුවන් සරණයි.

**උපාසිකාව :-** තෙරුවන් සරණයි ! ආර්යයන් වහන්ස,

**සියල්ලෝම සත්‍ය ධර්මය දකිත්වා !**

**තෙරුවන් සරණයි.**